FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
ජනවාරි(දුරුතු)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

26





දඹුලු පුරය බබලන රන්වන් වෙහෙරයි
එහි ඇති පෙහි පිළිම සැම සිත් තුටු කරවයි
රංගිරි පුවත්පත දම්රස සැමට බෙදයි
ලැබූ නව වසරෙ සැමහට සෙත් පැතුවයි





## රංගිරි දඹුලු විහාරය

### රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

### රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
### දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වී නවමසකින් පසු පළමුවරට ශ්‍රී ලංකාද්වීපයේ බින්තැන්නේ මහවැලි ගඟ අසබඩ මහියංගනයට වැඩම කෙළේ අද වැනි දුරුතු පොහෝ දිනකය. එම ප්‍රදේශයේ වාසයකළ යක්ෂ ගෝත්‍රිකයන්ට දහම් දෙසා ඔවුන් නිවන් මගකට යොමු කළ බුදුරජාණන් වහන්සේ එතැනට පැමිණි සිටි සුමන සමන් දෙවියන්ගේ ඉල්ලීම පරිදි කේශධාතු ලබාදුන් සේක. එම කේශධාතු තැන්පත් කර එම ස්ථානයේ සත්රුවන් දාගැබක් සඳවා පූජාවිධි පැවැත් වූයේ මෙම දුරුතු පොහෝ දිනයේදීය.

පසු කාලයේදී සරභු මහාරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ ග්‍රිවාධාතුව නිධන් කොට මෙම ස්ථානයේ දෙළොස් රියන් උසට ස්ථූපයක් කරවා පූජාවිධි පවත්වා ඇති බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි. දෙවනපෑතිස් රජතුමාගේ මලණුවන් වූ උද්ධචූලාභය කුමරු මෙම මියුගුණ සෑය (මහියංගණය) තිස්රියන් උසට දාගැබක් කරවූ බව වංශකථාවෙහි සඳහන් වෙයි. මෙරට එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා ද මෙම මහියංගණ දාගැබ අසූරියන් කොට බන්දවා පූජාවිධි පැවැත් වූ බව මහාවංශයෙහි දැක්වේ.

තුන්බෑ ජටිලයන් දමනය කිරීම සඳහා උරුවෙල් දනව්වට වැඩමකළ බුදුරජාණන් වහන්සේ දහම් දෙසා ඔවුන් මාගීඵලයන්ට පත්කළ සේක.එම වැදගත් ආගමික දුරුතු පොහෝ දිනක සිදු වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විහාරස්ථානවල විශේෂ ආගමික පූජාවිධි පවත්වමින් මෙම පොහෝදිනය සමරනු ලබන බව සඳහන් වේ.

**ඇම්.ඩී.විජයවර්ධන**

## පුදබිමක අසිරිය

# සම්බුදු පහසලත් කැළණි විහාරය



බුදුරජාණන් වහන්සේ දෙවනවර ශ්‍රී ලංකාද්විපයට වැඩම කළේ උතුරේ නාගදිපයටය. නාගදීපයේ දී මණි අක්ඛිත නම් නා රජුගේ ආරාධනයෙන් වැඩ සිටිමට විශේෂ මණ්ඩපයක් සදවා එහි මැණික් පුටුවක් තබා බුදුරජාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය එම මණ්ඩපයෙහි වඩාහිඳුවා දන්පූජා පැවැත්විය.මැණික් පුටුවෙහි වැඩ සිටි බුදුරජාණන් වහන්සේ එම පිරිසට දහම් දෙසූ සේක.ඉන්පසුව මැණික් පුටුව තැන්පත් කොට නාරජු විසින් ''ධාන්‍යාකාර'' හැඩයෙන් යුත් ස්ථූපයක් ගොඩ නංවූ බව ඉතිහාසගත තොරතුරුවල සඳහන් වෙයි.



පසු කාලයේදී කැළණියේ රජකළ මහානාග රජුගේ පුත් යටාලතිස්ස යුවරජු කැළණි විහාරයේ මහල් පහකින් යුත් ප්‍රාසාදයක් කරවා සංඝයා වහන්සේට පූජාකළ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වී ඇත. කණිට්ඨතිස්ස රජතුමා අලංකාර ලෙස පොහොය ගෙයක් සෑදූ බවත් වෝහාරතිස්ස රජතුමා කැළණි චෛත්‍යය මුදුනට ඡත්‍රයක් කරවා පූජාවිධි පැවැත්වූ බවත් රජතුමා මෙම ස්ථූපය ප්‍රතිසංස්කරණය කළ බවත් ගල්ලෑලි අතුරා සළපතල මළුව සකස්කළ බව කැළණි විහාර තොරතුරුවල දැක්වේ. ඉපැරණි බෝධීන් වහන්සේ මෙහි ඉතා හොඳින් වැඩ වෙසෙති.



මෙම විහාරයෙහි වාර්ෂික වශයෙන් ධර්ම දේශනා මාලාවක්ද පෙරදිග නැටුම් වලින් යුක්ත ඉතා අලංකාර පෙරහරක්ද පවත්වනු ලබයි. සොළොස් මස්ථානවලට අයත් මෙම ඓතිහාසික පුදබිම වර්තමානය වනවිට මනා පාලනයකින් යුක්ත වූ දෙස් විදෙස් බනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ ඉතා අනර්ඝ වූ පුණ්‍ය භූමියක් ලෙස සඳහන් කිරීමට පුළුවන.



**විජය තලවත්තේගෙදර**

# මහියංගන වෙහෙරෙන් විහිදෙන දුරුතු පොහෝ දා අසිරිය



නව වසරේ පළමු පොහොය හැටියට දුරුතු පොහොය හැඳින්විය හැකිය. ඓතිහාසික වශයෙන් ගත් කළ බෞද්ධයන්ට ඇති වැදගත්ම පොහොය දුරුතු පොහොයයි. එයට හේතු වන්නේ අපේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනයයි.

උන්වහන්සේ මේ ලංකා ධරණිතලයට වැඩමවා වදාරන්නට කලින් මේ මහා භද්‍ර කල්පයෙහි බුදු වූ කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන බුදුරජාණන් වහන්සේලා ද වැඩම කර ඇති බව සඳහන් වේ.

ගෞතම බුදුරජාණන් වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ ක්‍රි.පූ. 6 වන ශත වර්ෂයෙහි දුරුතු මැදි පොහෝ දිනකදීය. උන්වහන්සේ අප රටට වැඩමවා වදාළේ උරුවෙල් දනව්වේ තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් ජටිලයන් දමනය කරන අතර තුරේදීය. ලොව්තුරා බුදු බවට පත්වීමෙන් නව වැනි මාසයෙහි උතුරු කුරු දිවයිනෙන් පිණ්ඩපාතය ලබාගෙන අනෝතත්ත විල්තෙර දී වළඳා දුරුතු පෝය දා යකුන් අරක්ගෙන සිටි ලක්බිමට වැඩම කර වදාළහ. මහියංගණ මහවැලි ගංතෙර යොදුන් තුනක් දිග ඇති මහානාග වනෝද්‍යානයට වැඩමවා වදාළ, ඒ වෙලාවෙහි යක්ෂ සමාගමක් රැස්ව සිටි බව සඳහන් වේ. ඒ පිරිස මැද වැඩ සිටිය බුදුරජාණන් වහන්සේ අව්-වැසි-සුළං හා කුණාටුවලට යකුන් බය ගන්වා ගිරි දිවයිනට පලවා හැරිය බව මහා වංශයේ කරුණු තුළින් අනාවරණය වේ.

දුරුතු මාසය කනට වැටෙන විට, ගතට තද සීතලයකුත් දනවන තද සුළං හමන පුන්සඳ රැසින් මිහිමත නෑවෙන ලාංකික ජනතාවට ප්‍රබෝධය ලබාදෙන ගත සිත පිනවන මාසයකි. දැනට මහියංගන චෛත්‍යය පිහිටියේ ඒ යක්ෂයින් දමනය කළ ස්ථානයෙහි බව අපේ වංශ කතා තුළ සඳහන් වේ. මහියංගනසෑය පිහිටියේ මිනිපේ ජනපදයෙහි මහානාග වනෝද්‍යානයෙහිය.

ලොව්තුරා බුද්ධත්වයට පත්වීමෙන් නව වැනි මාසයෙහි උන්වහන්සේට වැටහී ගියා මගේ ශාසනය පන්දහසක් කල් ලක්දිව චිරස්ථායිව බබළන බව. ලාංකික ජනතාව කෙරෙහි මහා කරුණාවෙන් හා මානව දයාවෙන් හද පිරී ගිය අප තථාගත සම්බුදුරජාණන් වහන්සේ, දුරුතු පෝය දා මෙරටට වැඩම වීමට තීරණය කළසේක.

> ලාංකික ජනතාව කෙරෙහි මහා කරුණාවෙන් හා මානව දයාවෙන් හද පිරී ගිය අප තථාගත සම්බුදුරජාණන් වහන්සේ, දුරුතු පෝය දා මෙරටට වැඩම වීමට තීරණය කළසේක. දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ එන පිළිවෙලට පරිනිර්වාණ මඤ්චකයෙහි වැදහොත් උන්වහන්සේ අවසන් වරට බැහැදැකීමට පැමිණියවුන් අතර බ්‍රහ්මයෝ ද දෙවියෝ ද සිටියහ.

දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ එන විධියට පරිනිර්වාණ මඤ්චකයෙහි වැදහොත් උන්වහන්සේ අවසන් වරට බැහැදැකීමට පැමිණියවුන් අතර බ්‍රහ්මයෝ ද දෙවියෝ ද සිටියහ. දෙවියන් අතර ශක්‍රදේවේන්ද්‍රයා ද සිටියහ. ඔහු අමතා බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරා ඇත.

"පතිට්ඨිස්සති දෙවින්ද

ලංකායං මම සාසනං

තස්මා සපරිවාරන්තං

රක්ඛ ලංකංච සාධුකං"

"දේවේන්ද්‍රය, මාගේ ශාසනය ලංකාවෙහි පිහිටා ස්ථිර වෙනවා. එහෙයින් විජය රජතුමා ඇතුළු සත්සියයක් පිරිවර මනාව රකුව, ලංකාභූමිය ද ආරක්ෂා කරගනුව" ඒ පරිද්දෙන් ශක්‍ර දේවේන්ද්‍රයාහට පිරිත් පැන් දී පිරිත් නූල් බැඳ යකුන් ගෙන් වන උවදුරු වළක්වා යන්නට ගිය බව වර්තා වේ.

මෙම පද්‍යයෙහි "සපරිවාරන්තං" කියා ඇත්තේ විජය ඇතුළු සත් සියයක් පිරිවර සඳහාය. මේ බව දැන සිටි බුදුරජාණන් වහන්සේ තුන් වරක් අප රටට වැඩම කළ සේක. ප්‍රථම ලංකා ගමනය සිදුවූයේ මේ යකුන් දමනය කිරීම සඳහාය.

මේ කියන යක්කු ආදී කාලීන මෙරට විසූ ගොත්‍රික නාමයෙන් පෙනී සිටි මනුෂ්‍ය කොට්ඨාසයක් නොදියුණු ගති පැවතුම් තිබුණු නිසා ම්ලේච්ඡ වර්ගයේ මනුෂ්‍යයන් විය. රළු කළු දරුණු පෙනුමක් ඇතිව සිටි මොවුන් දමනය කරන්නට බුදුරදුන්ට සිදුවිය. ඔවුන් ඈත කඳුකර ප්‍රදේශවලට පලවාහැර අප රට මනුෂ්‍ය වාසයට සුදුසු ක්ෂේම භූමියක් බවට පත් කළ බව මහා පරිනිබ්බාන සූත්‍ර අටුවාව, මහාවංසය, දීපවංස, විනයට්ඨ කථා ආදී ඉපැරණි මූලාශ්‍ර ඇතුළු වෙනත් සාහිත්‍ය මූලාශ්‍රවලත් සඳහන්ව ඇත.

යකුන් පළවා හළ ඒ ශුද්ධ භූමිය වෙත ඇදී ආ දිව්‍ය බ්‍රහ්ම සේනාව අතර සමන්තකූඨ වාසී සමන් දෙවිඳු ද විය. මොහු ඉතිහාසඥයන් පළකරන මතය අනුව කඳුකර වාසී දේව ගෝත්‍රිකයෙකි. එතැනට පැමිණි දිව්‍ය බ්‍රහ්ම සේනාවට දහම් දෙසූ බුදුරජාණන් වහන්සේ ඔවුන් තිසරණයෙහි පිහිට වූහ. දහම් අසා සෝවාන් වූවන් අතර සුමන දෙවිඳු ද කෙනෙකි. පූජාර්හ වස්තුවක් ලබාගැනීමේ අදහසක් ඔවුනට ඇති විය. මාර්ග ඵලාධිගමනය කළ එම උතුම් සභාවෙහි දී ඔහුගේ අදහස බුදු රජාණන් වහන්සේට දැනුම් දුන්හ. පූජා වස්තුවක්ද ඉල්ලා සිටියහ.

බුදුරජාණන් වහන්සේ හිස පිරිමැද කේෂ ධාතු මිටක් දෙවිඳුට දුන්හ. ඒ උත්තම වස්තුව රන් කරඬුවකින් පිළිගත් දෙවිඳු බුදු රඳුන් වැඩසිටි ස්ථානයෙහි සත්රියන් උස දාගැබක් බැඳ එහි නිදන් කොට වැඳුම් පිදුම් කළා. මහියංගන ස්ථූපයෙහි නිදන් වී ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනයෙන් ලබාගත් ඒ කේෂධාතුයි.

දුරුතු පොහොය උදාවනවාත් සමගම අපේ සිතට නැගෙන්නේ මහියංගන චෛත්‍ය රාජයාණන් වහන්සේයි. මානව දයාවෙන් කම්පිතව අප කෙරෙහි කරුණා බැතියෙන් වැඩම වීම නිසා වැද පුදා පින් රැස් කරගත හැකි පූජනීය වස්තුවක් අපට ලැබී තිබෙනවා.

බුදුරජාණන් වහන්සේගේ කරුණාවේ මෛත්‍රියේ මුදිතාවේ ශ්‍රියාව පිළිඹිබු කරන මියුගුණ සෑය දෙසින් හමා එන සදහම් පණිවුඩයෙන් ලක්වැසියාගේ හදතුළ ඒ ප්‍රථම බෞද්ධ ප්‍රවෘත්තිය කාවැදී යනවා. එමගින් සිත් යයි. දම් මහ සෙනවි ශාරිපුත්‍ර මහ රහතුන්ගේ ශිෂ්‍යයකු වූ සරභූ රහතන් වහන්සේ බුද්ධ ග්‍රීවාස්ථි ධාතුව දික්කළ අත

හකුළුවන්නට මත්තෙන් ගෙන අප රටට වැඩම කරවීය. ග්‍රීවා ධාතුව මියුගුණ සෑයෙහි (මහියංගන ස්ථූපයෙහි) නිදන් කර මේදෝවර්ණ පාෂාණයෙන් දොළොස් රියන් උසට දාගැබක් බැන්දවීය. (එය සිදුවූයේ මීට අවුරුදු 2527 කට පෙරය) දෙවන පෑතිස් මහරජුගේ සොහොයුරෙකු වන උද්ධ චූලාභය" රජ එය තිස්රියන් උස දාගැබක් බවට පත්කළේය.

ශ්‍රද්ධාවන්ත ජනතාවගේ මනසත් බුද්ධියත් බුදු සමයේ සාරධර්මවලින් ප්‍රබුද්ධ කරවන මෙම ස්ථූපය මෙරට වැසි ජනතාවගේ භක්ති ප්‍රණාමයට ලක් වී ඇති බෞද්ධ ස්ථූප අතුරෙහි ප්‍රථම ස්ථූප මූර්තිය ලෙස ද සැළකීමට පුළුවන.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාදයෙන් ස්පර්ශ වූ මේ උතුම් දරණීතලය ඒ උතුම් ඓතිහාසික සිදුවීම් සිහියට ගෙන සදාචාරවත්, ගුණගරුක සමාජයක් බිහිකරන්නට සැම කෙනෙකුම ඇප කැප වීමට මේ උතුම් දුරුතු පොහොය දින ප්‍රාර්ථනා කරගනිමු.

පූජ්‍ය ගලගෙදර රතනවංහිමි
කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙන

# මේ නව වසරේ අපි ආලෝකයෙන් ආලෝකයට යමු



එක් වර්ෂයක් අවසන් වී තවත් අලුත් වර්ෂයක් උදා වී ඇත. ඒ නැවුම් වර්ෂය පිළිගන්නට මිනිසුන් වන අප පමණක් නොව මුළු මහත් පරිසරයම සූදානම් වී ඇත.

ගහකොළ අලුතින් අතු ඉති ලියලා මල් පිපී නැවුම් වසරට පළතුරු ආදී ඵල ලබා දෙන්නට සූදානමින් සිටිති. නිල්වන් කෙත් යාය රන් අස්වනු ලබා දෙන්නට සූදානමින් බන්ඩි ගොයම සුලඟේ නැලවෙති. විහඟුන්, සිව්පාවුන් ආදී සතුන් අළුතින් කැදැළි තනා තම වර්ගයා බෝ කරන්නට සූදානම් වෙති.

මේ අතර මිනිසුන් වන අපද නැවුම් වර්ෂයේ ආරම්භක දිනයේ පටන් නොයෙක් නොයෙක් දේ කරති. ඇතමෙක් තම නිවස අලුත් වැඩියා කරන අතර තවකෙක් අලුත් වර්ෂයට අලුත් ඇඳුම් පැළඳුමෙන් සැරසී ගමන් බිමන් යති. අපේ ගෘහනියන් නොයෙක් ආකාරයේ රසවත් කෑම බීම සාදා අලුත් වර්ෂය පිළිගන්නට සූදානම් වෙති.

ගහකොළ සතා සිව්පා ආදී මුළු මහත් පරිසරයමද මේ අයුරින් අලුත් වර්ෂය පිළිගන්නට, ගතකරන්නට සූදානම් වුවද බුදුන් වහන්සේගේ දේශනය අනුව උන්වහන්සේ සඳහන්කර ඇත්තේ "මනං උසසනනතථා මනුසසා" මනනසින් උසස්ම පුද්ගලයා මිනිසා බවයි.

එසේ නම් උසස් මනසක් ඇති අප සතා සිව්පාවාට වඩා වෙනස් අයුරින් අලුත් වර්ෂය පිළිගැනීමට සූදානම් විය යුතුය.

**"ආහාර නිද්‍රා භය මෛතුනං ච
සමාන මෙකඃ පසුභිඃ නරානාම්"**

යන දේශනා පාඨයට අනුව ආහාර ගැනීම, නිදාගැනීම, බියට පත්වීම, මෛතුන සේවනය පමණක් යම් මිනිසෙකු කරන්නේ නම් ඔහු තිරිසනෙකුට සාමාන වේ යැයි දේශනා කොට ඇත. එසේනම් මේ සියල්ල පමණක් අලුත් වර්ෂය තුළ කිරීමට සූදානම් වන්නේ නම් ඒ තැනැත්තා මනසින් උසස් තැනැත්තෙකු නොවි.

එසේ නම් අප මනසින් උසස් මිනිසෙකු ලෙස අලුතින් වර්ෂය ගතකරන්නේ කෙසේ දැයි විමසා බලමු. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අප සමාජයේ ජීවත්වන පුද්ගලයින් හතරදෙනෙකු පිළිබඳව බුදුපියාණන් වහන්සේ මෙසේ දේශනා කොට ඇත.

**"තමො තම පරායොතො තමො ජොති පරායතො
ජොති තම පරායොතො ජොති ජොති පරායතො"**

1 අදුරෙන් අදුරට යන පුද්ගලයා

2 අදුරෙන් ආලෝකයට යන පුද්ගලයා

3 ආලෝකයෙන් අදුරට යන පුද්ගලයා

4 ආලෝකයෙන් ආලෝකයට යන පුද්ගලයා

මේ දේශනයට අනුව මෙම පුද්ලයන් සිව් දෙනාම වත්මන් සමාජයේද ජීවත් වෙති. එවුන් කවුරුන්දැයි අපි හඳුනා ගනිමු.

පළමු පුද්ගලයා වන "තමො තම පරායන" අදුරෙන් අදුරට යන පුද්ගලයා හොඳ නරක, කුසල අකුසල මොනවාද යන්න නිවැරදිව හදුනා නොගනිති. දෙමාපිය ගුරුවර වැඩිහිටි ආදීන්ගේ අවවාද අනුශාසනා වලට ඇහුම් කන් නොදෙති. පාප මිත්‍රයෝම සේවනය කරති. ප්‍රාණගාතාදී දස අකුසල කර්ම වලම යෙදෙමින් මෙලොව පරලොව දෙලොවම විනාශ කරගෙන අවසානයේ අපායගාමී පුද්ගලයෙක් බවට පත්වෙයි.

අපේ සමාජයේ අදවන විට වැඩිපුරම දක්නට ලැබෙන්නේ මෙවැනි පුද්ගලයන්ය. ඔහු වර්ෂයක් උදාවෙන විට එය සැමරීමටද ප්‍රාණඝාත කරමින්, මත්පැන් පානය කරමින්, කාමයේ වරදවා හැසිරෙමින් ඒ හේතුවෙන්ම බොරුව, කේලම, හිස්වචන, පරුෂ වචන තෙපලමින් ඒ ප්‍රීතිය ඉතා පහත් ලෙස භුක්ති විදිති.

ඊළඟ පුද්ගලයා "තමො ජොති පරායන" අදුරෙන් ආලෝකයට එන පුද්ගලයාය. ඔහු ජීවිතයේ යම් කාලයකදී නොයෙක් ආකාරයේ පාප ක්‍රියාවන්වල නිරත වෙමින් ගුණ ධර්ම වලින් ඈත් වී කටයුතු කළද පසු කලකදී කළණ මිතුරන් ඇසුරු කිරීමෙන්, බුදු බණ ඇසීමෙන්, වැඩිහිටි අවවාද අනුශාසනා ලැබීම් ආදී දේ තුළින් තම ජීවිතය හොඳින් සකස් කරගෙන වැරදි අඩුපාඩු හදාගෙන අදුරෙන් ආලෝකයට ගමන් කරයි. මෙවැනි පුද්ගලයෝද වත්මන් සමාජයේ සුලභය.

තුන්වන පුද්ගලයා "ජොති තම පරායන" ආලෝකයෙන් අදුරට යන පුද්ගලයාය. මේ පුද්ගලයා කුඩා කළ මව් පිය ආභාෂය, වැඩිහිටි අවවාද අනුශාසනා පිළිපදිමින්, දහම් පාසල්, පාසල් අධ්‍යාපනය හොඳින් හදාරමින්, ඉතා යහපත් පුද්ගලයෙකු ලෙස ජීවත්වන අතර ඇතැම් විට තරුණ වයසේදී හෝ මැදිවියේදී පාප මිතුරන් සේවනය කිරීමෙන් මත්පැන් පානය, ස්ත්‍රී දූෂණය ආදී ක්‍රියාවල නිරතව සමාජයේ ඉතා පහත් පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි. ඔහුගේ පරලොව ජීවිතයද කිසිසේත් සාර්ථක වන්නේ නැත. අදුරටම පත්ව අපායගාමී වෙයි.

සමාජයේ ජීවත් වන පුද්ගලයින් අතර ශ්‍රේෂ්ඨතම පුද්ගලයා "ජොති ජොති පරායන " ආලෝකයෙන් ආලෝකයට යන පුද්ගලයාය. මෙම පුද්ගලයා ඉතාම ළදරු වියේදීද මව්පියන්ට ඉතා සුවච කීකරුය. වැඩිහිටියන්ට, දෙමාපියන්ට ගරු කරති. වදිති පුදති. ගුරුවරුන්ට කීකරුව අධ්‍යාපනය ලබති. ඔහුට විශේෂයෙන් අවවාද, අනුශාසනා කිරීමට අවශ්‍ය නොවේ. ක්ෂණයකින් යථාවබෝධය ලබයි.

මෙම පුද්ගලයා කුඩා කාලයේ පවත්වන මෙම ක්‍රියා කලාපය තරුණ, මධ්‍යම, මහළු අවධිය දක්වාම ගෙන යති. දන් සිල් භාවනාදී පිංකම්ද, සති, සමාධි, ප්‍රඥාද උපදවාගෙන ආලෝකයෙන් ආලෝකයටම යති. මෙබදු පුද්ගලයා කිසිදාක සතර අපායට නොවැටෙති. තිරිසන් ආත්මවල නූපදී. දිව්‍ය මානුෂීය සම්පත් පමණක් ලබති.

මෙම ලිපිය කියවන ඔබ දැන් මොහොතක් ඔබ ගැන සිතන්න. ඔබ අයත් වන්නේ මේ පුද්ගලයන් 4 දෙනාගෙන් කවර කොටසකටද? ඔබ "අදුරෙන් ආලෝකයට යන පුද්ගලයෙකු නම් ඒ ආලෝකය දීප්තිමත් ආලෝකයක් කර ගැනීම සඳහා තවතවත් යහපත් දේවල්ම සිදු කොට ආලෝකයටම පියනගන්න.

ඔබ ආලෝකයෙන් අදුරට යන පුද්ගලයෙක් නම් පාප මිත්‍ර සේවනය, පාප ක්‍රියා අතහැර කල්‍යාන මිත්‍ර ආශ්‍රය ලබා ආලෝකයෙන් ආලෝකයට යන පුද්ගලයෙක් වන්න. අලුත් වර්ෂයක් උදාවූ මේ මොහොතේ ඒ පිළිබඳ ප්‍රීතියට පත්ව එතැනින් නතර නොවී ඔබේ ආලෝකමත් ජීවිතය නිවනින් ආලෝකමත් කරගැනීම සඳහා ක්ලේෂාන්ධකාරය දුරු කිරීමට උත්සහා ගන්න.

මේ ආකාරයට ඔබට අලුත් වර්ෂය තුළ වෙනස් වීමට වැඩි වැඩියෙන් කුසල් දහම්වල නිරත වීමට හැකිනම් ඔබ බුදුරජාණන් වහන්සේ දේශනා කළ මනසින් උසස් වූ ශ්‍රේෂ්ඨ මිනිසෙකුම වන්නේය. එසේ නොමැතිව කාබී ප්‍රීති වී තම වර්ගයා බෝ කිරීම සඳහාම පමණක් අලුත් වර්ෂය ගත කරන්නේ නම් මුලින් සඳහන් කළ ගාථා පාඨයට අනුව ඔබ සිව්පා සතෙකුට සමාන වන්නේය. එසේ නොවීමට මේ නැවුම් වර්ෂය තුළ අදිටන් කරගන්න.

මිහිපුර ධම්මප්‍රදීපා භික්ෂුණිය

# ජීවයේ සම්භවය පිළිබඳ බෞද්ධ මතය [අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරිනි]

අතීතයෙන් තොර අනාගතයක් නොමැත්තේය. සුපැහැදිළි, අර්ථවත් අනාගතයකට පියමං කරනු වස් අතීතය ආවර්ජනය කළ යුත්තේමය. එසේ හෙයින් මිහිපිට ජීවත් වන්නා වූ දියුණුම සත්ත්වයා වන මිනිස් වර්ගයාට අයත් අප මෙලොව ඇතිවීම මෙන්ම නැතිවීම සහ ජීවීන් ඇතිවීම මෙන්ම නැතිවීම පිළිබඳ මතවාදයන් අධ්‍යයනය ඉතා වැදගත් වනු ඇත. පෙර - අපර දෙදිග විවිධ විද්වතුන්, දාර්ශනිකයින් මෙන්ම නා නා ප්‍රකාර ශාස්තෘවරුන් මෙකී ප්‍රස්තුතයට අදාලව නොයෙක් මතයන් එළි දක්වා ඇත.

ක්‍රිස්තු භක්තිකයන්ගේ විශ්වාසයට අනුව ඔවුනගේ බයිබලයේ පරණ ගිවිසුම නම් කොටසෙහි පරිදි දෙවියන් වහන්සේ විසින්, මහ පොළොවද එහි ඇති ගහ කොළ ද කඳුහෙල් ගංගා ද සතුන් ද මවා අන්තිමේදී තමාගේ ශරීරාකෘතිය අනුව මිනිසා මවා ඇත. හින්දු භක්තිකයන්ගේ අෂ්ටාදස පුරාණ ග්‍රන්ථවලට අයත් විෂ්ණු පුරාණයේද, උපනිෂද් ග්‍රන්ථ වලද දැක්වෙන්නේ ''ප්‍රජාපතී'' නමැති බ්‍රහ්මයා විසින් පොළොව මැවූ බවය. දෙවියන් වහන්සේ විසින් සාගරය මවා ඉන් කොටසකින් මහ පොළවත් අනිත් කොටසින් දිව්‍ය ලෝකයත් මැවූ බව පැරණි හීබෘ ජාතිකයන්ගේ විශ්වාසයයි. ජලයේ ඇති වූ නෙළුම් මලකින් සූර්යයා පහළ වූ බවත් එකී සූර්යය දිව්‍ය රාජයා විසින් ''කෙබ්'' යනුවෙන් මහ පොළොවද ''ෂූ'' යනුවෙන් සුළඟද මවන ලදී. ඔහුට ''නුට්'' හෙවත් අහස නමැති දියණියක්ද වූ බව පැරණි මිසර ජාතිකයන්ගේ විශ්වාසයයි.

මීට වසර දෙසිය ගණනකට මත්තෙන් ජීවත් වූ ලුවී බෆන් නමැති විද්‍යාඥයාගේ මතයට අනුව සූර්යයා අහසේ වේගයෙන් ගමන් කරද්දී වෙනත් තාරකාවක ගැටී විසිවූ කැබැල්ලකින් මහ පොළොව ඇති වූ බවය. විශාල වළාකුළු පද්ධතියකින් පොළොවත් සූර්යග්‍රහ මණ්ඩලයත් නිර්මාණය වූ බව ප්‍රංශයේ වාසය කළ ලැප්ලස් නමැති විද්‍යාඥයා වර්ෂ 1796 දී ප්‍රකාශ කොට ඇත. එමෙන්ම ග්‍රහවස්තුවක් සූර්යයා මත ගැටීම නිසා කැඩී විසි වූ කොටසක් සිසිල් වීමෙන් පොළොව හටගත් බව බ්‍රිතාන්‍ය ජාතික සර් ජේම්ස් ජින්ස් ගේ මතයයි. එනමුදු මෙකී එක මතයක් වත් මෙතෙක් නිශ්චිතව තහවුරු කර ගත නොහැකිව ඇත.

ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සමයෙහි දඹදිව පුරාවට තදින් මුල් බැස ගත් බමුණු දහම තුළ ද ලොව ඇතිවීම මෙන්ම මනුෂ්‍ය වර්ගයාගේ ඇතිවීම පිළිබඳව කරුණු දක්වා ඇත.

''බ්‍රාහ්මණස්‍ය මුඛමාසිත්
බාහු රාජන්‍ය කෘත
උරු තදස්‍ය යද් වෛශ්‍යඃ
පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත''
(ඍග් වේදය - දහ වන මණ්ඩලය, 90 වන සූත්‍රය)

යන ශ්ලෝකයේ සඳහන් පරිදි මහා බ්‍රහ්මයා විසින් සිය මුඛයෙන් බමුණන් ද, දෙබාහුවෙන් ක්ෂත්‍රියයන් ද, කලවාවලින් වෛශ්‍යයන් ද, යටි පතුලෙන් ශූද්‍රයන් ද මවා ඇත. එසේම බමුණන් පෙන්වා දෙන පරිදි ලොව මවන ලද්දේද මහා බ්‍රහ්මයා විසිනි. මහා බ්‍රහ්මයා මනුෂ්‍යයා මවන ලද්දා පමණක් නොව ඔවුනට විවිධ කාර්යයන්ද පවරා ඇත. කෙසේ හෝ බමුණු දහම තුළ ද ජීවයේ සම්භවය පිළිබඳ වූ මතය නිර්මාණවාදයක් බව සඳහන් කළ යුත්තේමය. මෙකී කරුණු තුළින් ගත හැකි වන්නා වූ නිගමනය වනාහි ලොව සර්ව බලධාරී මැවුම්කාර දෙවියකු විසින් මැවූ බවට පිරිසක් මතවාද පල කරන අතර තවත් පිරිසක් පවසනුයේ ස්වභාව ධර්මයේ ඇතිවන විපර්යාසයන් අනුව ලොව ඇතිවූ බවය.

මැවුම් වාදය නොපිළිගත් අසම සම ශාස්තෘවරයාණන් වන ගෞතම බුදු පියාණන් වහන්සේ පංච නියාම ධර්මයන් දේශනා කළ සේක. උන්වහන්සේ දේශනා කරන පරිදි සියල්ල සිදු වනුයේ මෙම නියාම ධර්මයන්ට අනුවය. ජීවයේ සම්භවය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රයෙහි වන කරුණු කාරණා නූතන විද්‍යාඥයින් විසින්ද තහවුරු කරමින් පැවතීම නිර්මල බුදු දහමේ භාෂිතයන්හි සත්‍යතාව විශද කරන්නකි. එසේ හෙයින් ජීවයේ සම්භවය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රගත දේශනාවෙහි හරය පිළිබඳ විග්‍රහයක යෙදීම කාලෝචිතය. එකී සූත්‍රයට අනුව මිහිපිට බිහි වූ ආදිම සතුන් ජලජ ජීවීන් වන අතර ක්‍රමාණුකූල පරිණාමයෙන් ඔවුනගේ ස්වරූපය වෙනස්ව ඇත. දීර්ඝ කාලීනව සිදු වූ මෙම පරිණාමයේ එක් ඵලයක් ලෙස මනුෂ්‍ය වර්ගයාගේ ඇරඹුමද සිදුව ඇති බව පෙන්වාදිය හැකිය.

කලක් ගතවීමෙන් අනතුරුව විනාශ වන මෙම ලොවෙහි ජීවීහු ආභස්සර නම් බඹ ලොව උපදින බව එකී සූත්‍ර දේශනාවෙහි අන්තර්ගතය. තම ආලෝකය සහිතව ප්‍රීතිය අනුභව කරමින් අහසෙහි ගමන් කිරීමටද හැකි දිගු කලක් ජීවත් වන්නා වූ මෙම ජීවී කොට්ඨාසය කල් යත්ම ජල කඳක්ව ඇති වන මහ පොළොවට ආභස්සර බඹලොවින් චුතව පැමිණෙයි. හිරු, සඳු, තාරකා දක්නට නොමැති වූත්, අන්ධකාර වූත් මෙලොව තුළ කාල බෙදීමක්ද නොමැති අතර ඉහත වූ ජීවීන්ගේ ලිංග භේදයක්ද නොමැත. ඔවුහු සිය ශරීරාලෝකයෙන් මෙන්ම ප්‍රීතියෙන් දිවි ගෙවති. කල්යත්ම උණු කළ කිරි මත හටගත් යොදය මෙන් වූ රස පොළොව ජල ගෝලය මත්තෙහි හට ගනී. ගිතෙල් හෝ වෙඬරු පිඩක් මෙන් ප්‍රණීත සුවඳවත් එකී රස පොළොව උක්ත ජීවීහු ඇඟිල්ලෙන් ගෙන දිව ගා රස විඳිති. එහි රසයෙන් හටගත් තෘෂ්ණාව හේතුකොට ස්ව ශරීර ආලෝකය අතුරුදහන්ව හිරු, සඳු, තාරකා ඇතිව, රෑ, දහවල් සහිතව ලොව පැවතීම ඇතිවන්නට විය. රස පොළොව අනුභව කරමින් කල් යත්ම එකී ජීවීන්ගේ ශරීර පැහැයන්ගේද වෙනස්කම් ඇති වූ අතර රළු, මෘදු, පැහැපත්, දුර්වර්ණ ආදී ශරීර ලක්ෂණ වලින් යුත්තෝ ඇති වූහ. අහංකාරය, මානය, එකිනෙකා හෙලා දකින්නට වීම වැනි දුර්ගුණයන් ද ඇතිවූ අතර කලකදී රස පොළොව අතුරුදහන් විය. සත්ත්වයෝ බොහෝ සේ කණගාටුවට පත් වූහ.

අනතුරුව සත්ත්වයන්ගේ ආහාරය පිණිස වර්ණවත්, සුවඳැති බිම්මල් පහල විය. ඉන් අනතුරුව පහලව ඇත්තේ බදාලතා නම් වූ වැල් විශේෂයකි. එකී වැල් විශේෂයද ආහාරයට ගෙන ඇත. ක්‍රමයෙන් මෙම සත්ත්වයන්ගේ දුර්ගුණ වර්ධනය වත්ම ඔවුනගේ ශරීර ස්වභාවයන්ගේ ද බොහෝ වෙනස්කම් ඇතිව තිබේ. ලෝභ, ද්වේෂ, මාන යනාදී වූ දුර්ගුණ ද වර්ධනය වී ඇත. බදාලතා වැල් ද අතුරුදහන් වූවායින් අනතුරුව ස්වයංජාත වී වැවෙන්නට වූ අතර වැඩුණු සැනින් අනුභව කොට හැකි එකී දහයියා රහිත ඇල් හාල් ද අනුභව කරමින් දිගු කලක් කල් ගෙවා ඇත. එසේ කල් යත්ම යට කී සත්ත්වයින්ගේ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වන්නට වූ ශරීර ලක්ෂණ පහල වන්නට විය. එකී ලකුණු පහල වත්ම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර වූ වෙනස පිළිබඳ කුතුහලය ඇතිව වඩ වඩාත් උනන්දුව ඇතිවී රාගයත් සමගින් සහවාසයේ යෙදීම ඇරඹී ඇත. ඒ සමගින් විවිධ ගැටුම් ද ඇති වන්නට විය. සංවාසයේ යෙදෙන්නන්ට නොයෙදෙන්නන් ගල්, පස් යනාදියෙන් පහර දී ඇත. ක්‍රමාණුකූලව ජනී ජනයා අතර අසත් ක්‍රියා ද වර්ධනය වන්නට වූ අතර සීමා වෙන්කර ගැනීම්, නිවාස ඉදිකිරීම් ද සිදු කොට ඔවුහු අනිකුත් ජනයාගේ පරිහාසයට ලකවීම වැළැක්වීමට නිවෙස් තුළට වී අසත් ක්‍රියා කරන්නට වූහ. මේ අයුරින් සිදු වන විට ක්‍රමයෙන් ස්වයංජාත හාල් ද ක්‍රමයෙන් හීන වන්නට විය. සත්ත්වයෝ රැස්ව සිදුවූ සියලු විපර්යාසයන් සාකච්ඡා කොට අභාග්‍ය සම්පන්න තත්වය පිළිබඳ පසුතැවෙන්නට වූහ.

නූතන සමාජය තුළ දක්නට ලැබෙන්නා වූ පාප කර්මයන්, කෝලාහල, ආරවුල් යනාදියෙහි මූලාරම්භය ඇති වන්නට විය. එය ක්‍රමයෙන් වර්ධනය වන්නටද විය. මේ අයුරින් පෘථිවියෙහි ඇතිවූ මානව සත්ත්වයාගේ පිරිහීම ඇරඹිණි. ව්‍යාකූල සමාජය ඇතිවත්ම එකී ජනයා නායකයින් තේරීම පිළිබඳ සිතන්නට වූහ. සියල්ලගේ සම්මුතියෙන් රජ තේරී පත්විය. ඒ අයුරින් ජන සම්මතවාදී රාජ්‍ය පාලකයන් ඇතිවී ඇත. කෙත් වලට හෙවත් ක්ෂෙත්‍රයන්ට

15 පිටුවෙන්....

-ආර්. එන්. එච්. එම් සමන් ජයරත්න-

# රෝග සමනය කිරීමට සමත් බුදුදහමේ බලය

වර්තමානයෙහි දේවවරම ලාභීන් ලෙස පෙනී සිටිමින් ඔවුනට ලෙඩදුක් අපල උපද්‍රව ව්‍යුපසමනය කිරීමට විශේෂ බලයක් ඇතැයි පවසමින් ජනතාව නොමග වයමින් මිල මුදල් සූරාකෑමේ කූට ව්‍යාපාරය දියත් වී ඇති බව අප සියලු දෙනා දන්නා ප්‍රකට කරුණකි. බොහෝ දෙනා තමන්ට අසවල් අයවල් දෙවියන් ආරූඪ වී ඇති බව පවසතත් සත්‍ය ලෙසම මිනිසුන්ගේ දෙතිස් මහා කුණප කොටසින් සැදුම්ලත් පංචස්කන්ධයකට දිව්‍ය සැපසම්පත් අත්විඳින දෙවිදේවතාවුන් ආරූඪ වන්නේද යන්න සැකයට තුඩුදෙන කරුණකි. මෙහි යථාර්ථය නම් දෙවිවරුන්ගේ නාමයෙන් පහත් පෙළේ භූතාත්ම එහිදී සම්බන්ධවීමක් සිදුවෙතැයි කිවහොත් එය නිවැරදිය. ඇතැම් අවස්ථා වලදී සමහර තරුණ ස්ත්‍රීන් හා පුරුෂයින් සමාජ ආකර්ෂණය තමා වෙත ළඟා කරගැනීම උදෙසා ද හිතාමතාම මෙවැනි දෑ කරන අතර තවත් සමහරු තුළ පවතින මානසික රෝග හේතුවෙන් ද එවැනි හැසිරීම් චර්යාවල යෙදෙන බැව් පෙනේ.

අතීතයේ දී ගුප්ත ශාස්ත්‍රවලින් අපේක්ෂා කරන ලද්දේ ලෙඩරෝග සුවකර සමාජයට යහපත් සේවයක් කිරීමයි. ඒවා සැබවින්ම ශාස්ත්‍රයන් වූ අතර ඒවාට කළහැකි හා කළ නොහැකි සීමාවක් තිබුණි. මන්ත්‍ර ශාස්ත්‍ර ගැඹුරින් හැදෑරූ අය විසින් අතීතයේදී මහත්වූ වික්‍රමාන්විත ක්‍රියාකාරකම් සිදුකළ බවට ඉතිහාසයේ යම් යම් අවස්ථාවලදී අනාවරණය වී ඇත. එහෙත් වර්තමානයෙහි එවැනි ශිල්ප ශාස්ත්‍ර අභාවයට ගොස් ඇති අතර පැවතුනත් ඇත්තේ ඉතාම අතළොස්සක් දෙනෙකු ළඟ පමණකි. ඓතිහාසික තොරතුරු වලට අනුව දේවවරම් ලාභීන් අතර දුටුගැමුණු මහා රජතුමා හා මානවම්ම රජු කඳකුමරු (කතරගම දෙවිදු) ගෙන් වරම් ලද බව කියැවේ. තවද තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් හා කුංතුණාවේ හිමිද බරණ ගණාතාචාර්යයා හා මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි ආදී ප්‍රබල චරිත කඳ කුමරුගෙන් වරම් ලද බව පැවසේ. එසේම මහා කවි කාළිදාස කාලිය ගෙන් වරම් ලද බවත් ඒ නිසා ඒ සියලුදෙනා ලොව පිළිගත් ප්‍රකට විද්වතුන් බවට පත්වූ බවද ජනශ්‍රැතියෙහි එයි.

මිනිසුන්ට වැළදෙන ශාරීරික හා මානසික රෝග උපද්‍රව ව්‍යුපසමනය කිරීමේ කටයුතු වලදී ශ්‍රී ලාංකිකයින් වැඩිදෙනා බෞද්ධාගමිකයින් වන නිසා ඒ සඳහා බුදුදහමේ ආභාෂය ඒ සඳහා යොදාගෙන ඇත. ඒ අනුව බුදදහමේ ප්‍රධාන විමුක්ති මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ එන සම්මා දිට්ඨිය හා සම්මා සතියෙහි හා සම්මා සතියෙහි බලය ඒ සඳහා ලැබී ඇත. සම්මා සතියෙන් පෙන්වන්නේ යහපත් සිහියෙන් යුතුව හරිහැටි යමක් කළහොත් එයින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවයි. අසිහියෙන් දෙවියන් ආරූඪ වනවා යැයි කියන අයගේ අදහස් සිහිනුවණින් සිටින පිරිස අසා ඒවාට නතුවන්නේ නම් එය බුදුදහම අමතක කර දැමීමත් යයි වීම නිවැරදිය. ත්‍රිවිධ රත්නයේ ආනුභාව බලය සම්බන්ධයෙන් බුදුදහමෙහි චිරාගතව පැවත එන ආකල්පය වූයේ තුණුරුවන්ගේ ලෝකෝත්තර හා ආධ්‍යාත්මික ගුණ සමුදාය මෙනෙහි කිරීම යක්ෂ භූතාදීන්ගෙන් ඇතිවන හිංසාකාරී නපුරු චේතනාවන් නිෂ්ප්‍රභා කිරීමට තරම් ප්‍රමාණවත් වන බවය. බුදුරජාණන් වහන්සේ ධජග්ග සූත්‍රයේ දී ඒ ගුණ සමුදාය මෙනෙහි කිරීමට භයවීම, තැතිගැනීම්, ලොමුඩැහැගැනීම් ආදී කවරාකාරයක උවදුරක් වුවද දුරුකරගැනීමට සමත්වන බව වදාළ සේක. (ඒවං බුද්ධං සරන්තානං. ධම්මං සංඝඤ්ච භික්ඛවො භයංවා ජම්භිතත්තාවා න හෙස්සතීති)

භූතාවේෂයන්ගෙන් හටගන්නා වූ යම් යම් අපල උපද්‍රව, ලෙඩ රෝග, තොවිල් සම්ප්‍රධායෙහි දක්නට හැකිවන අතර තුණුරුවන්ගේ ගුණ බලයෙන් ඒවා ව්‍යුප සමනය කළ හැකි බව සිංහල බෞද්ධ යාගකරුවන් පිළිගෙන ඇතිබව ඔවුන් විසින් ශාන්තිකර්ම විෂයෙහිලා තුණුරුවන්ගේ ගුණ මහිමය යොදාගැනීමෙන් සනාථ වේ. මේ නිසා තුණුරුවන්ගේ ආනුභාව බලය ලෙඩ දුක් අතුරු ආන්ත්‍රා ආදී සකලවිධ දෝෂාන්ධකාර දුරීභූත කිරීමට හැකි බලවේගයක් ය යන්න බෞද්ධයින්ගේ ප්‍රබල ආගමික දෘෂ්ටියක් බවට පත්වී ඇත.

ශාන්ති කර්ම විෂයෙහි බුදුදහමේ ආනුභාව බලයට පසුව යොදාගන්නා වූ ආගමික බලය වූයේ දෙවියන්ගේ බලයයි. ශ්‍රී ලංකාවට බුදුසමය හඳුන්වාදීමෙන් අනතුරුව චිරාගතව පැවත ගෙන ආවාවූ දේශීය යාතුකර්ම වලට බුදුදහමේ ආභාෂය ලැබීමත් සමඟම එම යාතුකර්ම විධිවල ප්‍රමුඛ ස්ථානය බුදුරජාණන් වහන්සේට හිමිවිය. ඒනිසා රෝග උපද්‍රව නිවාරණය කිරීමට දෙවියන්ගේ බලය යොදා ගන්නා ලද්දේ බුදුරජාණන් වහන්සේගේ බලයට යටත්කොටය .

දෙවිවරු යනු විශ්වයේ ශුද්ධවන්ත තත්වයක සිටින බලවේග නිසා ඔවුන් යාග හෝම පුද පූජා පැවැත්වෙන යාග භූමියට වැඩමවා ගැනීමට සිතූ යකැදුරෝ යාග භූමිය ශුද්ධවන්ත තත්වයට ගැලපෙන ආකාරයකට සකස් කිරීමට කටයුතු කළහ. ඒ අනුව බෞද්ධ යකැදුරෝ දෙවියන් සම්බන්ධ කංකාරිවලදී සුදුපිරුවට වලින් සැරසීමෙන් හා පේවී ඉස් සෝදා නා පේවීමෙන් යුක්තව වත් පිළිවෙත් කිරීමට කටයුතු කරති. සුවඳ දුම් ගැල්වීමෙන් හා මල් පහන් පිදීමෙන් කහ දියර ඉසීමෙන් යාග භූමිය පවිත්‍රත්වයට පත් කරන ලදී. මෙවැනි චාරිත්‍ර විධි අනුගමනය කිරීමේ අභිලාෂය වන්නේ රෝග නිවාරණ ක්‍රියාවලියේදී දෙවියන්ට නිසි පුද සත්කාර සැලකිළි දැක්වීම කරන කොටගෙන දෙවියන් සමඟ අන්තර් සම්න්ධයක් ගොඩනඟා ගැනීම සඳහා අවශ්‍ය වූ ආගමික හා අභිචාර පසුබිම යාග භූමිය තුළ මවා පා එම ස්ථානය දෙවියන්ට පැමිණීමට සුදුසු ස්ථානයක් බවට පත්කර ගැනීමයි. අනෙක් අතට අශුද්ධවන්තයින් වන යක්ෂ භූතාදීන්ට මස් මාංශ පුළුටු ආදී අපිරිසිදු ද යාග භූමියෙහි තනා ඇති පිදේනි තටු ආදිය මල්යහන් තනා ඇති සීමාවෙන් පිටත හෙවත් දුරස්ථ කොට තැබීමක් කරන්නේ ද ඒ නිසා වනැයි සිතිය හැක.

සූත්‍ර පිටකයේ යම් යම් සූත්‍ර දේශනා වලදී දෙවිවරු නොයෙක් අවස්ථා වලදී අදෘෂ්‍යමාන රූප කායකින් බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට පැමිණි බව සඳහන් වේ. උදාහරණ වශයෙන් සතරවරම් දෙවිවරුන් (විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රව, ධ්‍රතරාෂ්ට) බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණීම හා ඔවුන් හා බුදුරජාණන් වහන්සේ අතර ආටානාටිය සූත්‍ර දේශනාව පිළිබඳ සංවාදයත් ඇති වූ බව සඳහන් වේ. ඒ අනුව බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූට පර්වතයෙහි වැඩවාසය කරන සමයක සතරවරම් දෙවිවරු යක්ෂ, නාග, කුම්භාණ්ඩ ආදීන්ගෙන් සැඳුම්ලත් මහා සේනාවක් පිරිවරාගෙන උන්වහන්සේ හමුවීමට පැමිණ ඇත. එසේ පැමිණ වන සෙනසුන්වල බණ භාවනා කරන භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව සඳහා උන්වහන්සේලාට ආටානාටිය සූත්‍රය පුරුදු කරවන ලෙස ඉල්ලා සිට බුදුරජාණන් වහන්සේගෙන් සමුගෙන ඒ ස්ථානයේදීම අතුරුදහන් වී ඇත. එසේම බුදුරජාණන් වහන්සේ කපිල වස්තු පුර මහා වනාන්තරයෙහි පන්සියක් භික්ෂූන් වහන්සේලා සමඟ වැඩවාසය කරන සමයේ දස දහසක් සක්වල සිටින දෙවිබඹුන් උන්වහන්සේ බැහැදැකීමට පැමිණි බව මහාසමය සූත්‍රයේ සඳහන් වේ.

දස දහසක් සක්වල සිටින දෙවිබඹුන් පිරිත් හා ධර්මදේශනා පැවැත්වෙන ස්ථානවලට පැමිණෙතැයි යන විශ්වාසය බෞද්ධ සම්ප්‍රධායෙහි හැඩගැසී අවුත් ඇත්තේ මේ නිසා වියහැක. ඒ අනුව වර්තමානයෙහි ද පිරිත් හා බණ දේශනා ආරම්භ කරන අවස්ථාවෙහි (සමන්තා චක්කවාලේසු අත්‍රා ගච්චන්තු දේවතා) යනුවෙන් දෙවිදේවතාවුන්ට ආරාධනා කිරීම බෞද්ධ සම්ප්‍රධායක් බවට පත්වී ඇතිබව පෙනේ.

ඉහතින් සඳහන් කළ ආකාරයට දෙවිදේවතාවුන් යාග භූමියෙහි ඇති මල් යහන් වලට පැමිණීමත් සිදුනොවන අතර සත්‍ය ලෙසම සිදුවන්නේ දේව දිෂ්ටිය හෙළිමක් පමණකි. දිෂ්ටිය යනු බැල්ම වැටීමයි. මේ අනුව දෙවි දේවතාවුන්ට යාගභූමියෙහි තනා ඇති මල්යහන්වලට වඩින ලෙස කෝල්මුර කවි ගායනා කොට ආරාධනා කරන විට ඒවාහි පුදා පිණිස තබා ඇති සුවඳ දුම්, මල් පහන්, සඳුන්, කපුරු, පළතුරු ආදී පුෂ්ප ද්‍රව්‍ය වෙත ඔවුන්ගේ ඇල්ම බැල්ම බලපාන බව පෙනේ. මේ පිළිබඳව සිය අදහස් දක්වන මහාචාර්ය ගණනාත ඔබේසේකර මහතා විසින් ඔහුගේ පත්තිනි දේව සංකල්පය නැමැති ග්‍රන්ථයේ දක්වා ඇති සඳහන විමසීමට භාජනය කිරීම වටී. එහි දෙවියන්ගේ හරය සහිත දිෂ්ටිය හින්දු හා බෞද්ධ පෙති පිළිම වන්දනාවේ මනාකොට ගැබ්ව තිබේ. හින්දු හා බෞද්ධ ප්‍රතිමාවක් සජීවී බවට පත්වන්නේ මහත් වූ තහංචි, සිරිත් විරිත් මධ්‍යයේ උත්සවාකාරයෙන් පවත්වනු ලබන නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය කිරීමේ චාරිත්‍රයෙන් පසුවයි. හින්දු දේවාලවල තබා ඇති දේවාභරණ වලින් හා ආයුධ වලින් ගම්‍යමාන වන්නේ දේව දිෂ්ටිය හා දෙවියන්ගේ බලය ඒවායින් නියෝජනය වන බවයි. එසේම ගම්මඩු වැනි ශාන්ති කර්ම වලදී පත්තිනි දෙවිදුන්ගේ සලඹ (හලං) නැටුම්, ගැයුම් සහිතව ගෙනවුත් යාගමඩුවේ දේව තොරණේ තනා ඇති පූජාසනය මත තැන්පත් කිරීමෙන්ද පෙන්නුම් කෙරෙන්නේ එම භාණ්ඩ මත දෙවියන්ගේ දිෂ්ටිය පතිතවන බවයි යනුවෙන් දක්වා ඇත.

ඇතැම් ශාන්ති කර්ම වලදී යකැදුරන් විසින් බුදුරදුන්ගෙන් වරම් ගැනීමක් ගැන සඳහන් කරති. මෙම වරම් ගැනීම යනු බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලබාගැනීම යයි කල්පනා කළහොත් එයින් දේව මණ්ඩලය බුදුරජාණන් වහන්සේගෙන් වරම් ගැනීමට සැළැස්වීම මගින් පැහැදිළි වන්නේ. දෙවිවරුන්ගේ බලය බුදුන් වහන්සේගේ බලයට යටත් කොට බුදුරජාණන් වහන්සේගේ අණට අනුව ක්‍රියා කිරීමයි. මේ ආකාරයට දෙවිවරුන් බුදුන් වහන්සේගෙන් වරම් (අවසර) ගනිත් නම් ඔවුන්ගේ නායකයා විය යුත්තේ බුදුරජාණන් වහන්සේ බව සිතිය හැක. මෙසේ අපල උපද්‍රව රෝග නිවාරණය කිරිමේ යාග හා ශන්ති කරම වලදී යකැදුරෝ බුද්ධ බලය හා දේව බලය යොදා ගැනිමෙන් පැහැදිළි වන්නේ ඔවුන් ගැඹුරු ආගමික හා අභිචාර දෘෂ්ටියකින් එම කටයුතුවල නියුක්ත වන බවයි.


මුල් බුදුසමයෙන් රෝග නිවාරණය කිරීමට හෝ අමනුෂ්‍ය දෝෂ උපද්‍රව වලින් අත් මිදීමට යන්ත්‍ර මන්ත්‍ර වැනි අභිචාර විධි භාවිතා කිරීම ප්‍රතික්ෂේප කර ඇත. බුදුරජාණන් වහන්සේ විනය පිටකයේ එන භෙසජ්ජකඛන්ධක හි භික්ෂූන්ට ලෙඩ රෝග වලින් අත්මිදීම පිණිස ඖෂධ වර්ග නියම කළ බවක් මිස යන්ත්‍ර මන්ත්‍ර ආදිය කිරීමට නියම කළ බවට කිසිදු තොරතුරක් මුල් බෞද්ධ ග්‍රන්ථවල සඳහන් නොවේ. එසේ එසේ වුවද ශ්‍රී ලාංකික පොදු ජනයාගේ ලෞකික හා ලෝකෝත්තර අවශ්‍යතා සපුරාලීමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් වශයෙන් ඔවුන්ට තමන්ට රිසි අභිචාර විධි භාවිතා කිරීමට බුදුසමයෙන් අනුමැතිය ලැබී ඇති බව ඉතා සුවිශේෂී වූ බෞද්ධ ශාන්ති කර්මයක් වන පිරිත් සජ්ඣායනාවෙන් අනාවරණය වේ.

බලිතොවිල් ආදී ශාන්ති කර්ම වලදී යකැදුරන් විසින් පිරිත් සජ්ඣායනාව යොදා ගන්නා අවස්ථා දැකිය හැක. එහි මන්ත්‍ර යනුවෙන්

15 පිටුවට....

විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂක
ඩී.එම්.එච්. කරුණාරත්න
මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.

# බුදු සිරිතට අනුග්‍රහ වෙමින් අභියෝගවලට මුහුණ දෙමු



මිනිස් ජීවිතවලට අභියෝග එල්ලවීම පුදුමයට කරුණක් නොවේ. එයට බලපාන ප්‍රධානතම සාධකය වන්නේ,මිනිසා ජීවත්වන පරිසරයයි. මිනිසාගේ උපතේ සිට මරණයට පත්වීම දක්වා අභියෝගයන්ට මුහුණදීමට සිදුවේ. මිනිස් වර්ගයාට මුහුණපෑමට සිදුවන අභියෝග විවිධ ඒවා වේ. ඒ අනුව ඒවාට මුහුණදෙන ආකාරයද විවිධ වේ. මෙසේ අභියෝගවලට මුහුණ දී ජයගත් මිනිසුන් ලෙසටය.

අභියෝග එල්ල වූ චරිතයක් ලෙසට ''බුද්ධ චරිතය'' දැක්වීමට පුළුවන. එම චරිතය පරමාදර්ශී චරිතයක් ලෙසට මානව ඉතිහාසයෙහි සඳහන්ව ඇත. බුදුවීම සඳහා පාරමිතා පුරණ සමයේ සිට බුදුබව ලබන ආත්මය දක්වා අභියෝගවලට මුහුණ දෙමින් ජීවිත ගෙවූ ආකාරයට පන්සිය පනස් ජාතක පොතින් මනාකොට අවබෝධ කරගත හැකිය.ඒවා සාර්ථක ලෙස ජයගෙන ඇත්තේ ප්‍රඥාව මූලික කරගෙනය. ප්‍රඥාවත් දක්නා නුවණත්, සෑම අවස්ථාවකදීම යොදාගෙන ඇතිබව මනාකොට පැහැදිලි වෙයි. තමන් වහන්සේ වෙතට එල්ලවෙන අභියෝගයන් හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දෙමින් ප්‍රධාන අරමුණ වන ලොවිතුරා බුද්ධත්වය ලබාගැනීම සෑම කෙනෙකුටම ආදර්ශමත් සිද්ධියක් ලෙස මෙහි ලා සඳහන් කිරීමට පුළුවන. මේ සඳහා උන්වහන්සේට උපකාරී වූයේ සසර බොහෝ කාලයක් සම්පූර්ණ කරන ලද ආධ්‍යාත්මික ශක්තියයි. ඒ බව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන්ම දේශිත ප්‍රීතිවාක්‍යයෙන්ම පෙන්නුම් කරයි. උන්වහන්සේගේ මුඛ්‍ය අභිලාෂය වූයේ සියලුම කෙලෙස් නැතිකොට ලොවිතුරා බුද්ධත්වයට පත්වීමය. බුදුවීමට බාධකය වූ තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම නැතිකොට පංචස්කන්ධය නැමැති ගෙය සම්පූර්ණයෙන්ම සිඳබිඳ දැමූ බවත්, එනිසාම යළිත් ඉපදීමක් සිදුනොවන බවයි. උදාන වාක්‍යයෙන් පෙන්වාදී තිබෙන්නේ ප්‍රතජ්ජන ජීවිත ගත කරන මිනිසාට එල්ලවන අභියෝග වැඩිය. තරුණ ජීවිතයකට බලපාන අභියෝග වන්නේ මදය, පළිගැනීම, කුසීතකම, ප්‍රචණ්ඩ බව, කාමුක හැඟීම්, ඊර්ෂ්‍යාව යනාදියයි. මෙවැනි අභියෝග වලින් ජයගැනීම ඉතා අපහසු කාර්යයකි. ජයගැනීමට නම් ඉතා කල්පනාකාරීව ජීවිතය මෙහෙයවිය යුතුව ඇත. බුද්ධිය අධිෂ්ඨානය ආත්ම සංයමය නොපසුබස්නා උත්සාහය, උපායශීලි බව යන ගුණාංග තමා සතුවිය යුතුය. බුද්ධ චරිතය තුළින් මේ සඳහා උපදේශයන් ලබාගත හැකිය. බුදුවීමෙන් පසු ලෝකයාට පෙන්නුම් කළ උතුම් ගුණාංගයක් වන්නේ කෙළෙහිගුණ සැලකීමය. බුදුවීමට සෙවනදුන් බෝධි වෘක්ෂයට සතියක් මුළුල්ලේ අනිමිස ලෝචන පූජාව පවත්වා කෙළෙහි ගුණ සැළකීමේ වටිනාකම පෙන්නුම් කළ සේක. පරිසරය ගැන වනාන්තයක් මැදින් ගමන් කරනවිට ප්‍රකාශ කර සිටියේ ''රමණීය අරඤ්ඤානි'' යනුවෙනි. ආනන්දය මෙම වනාන්තරය දෙස බලන්න. වනාන්තරයේ ඇති ලස්සන වනාන්තරයේ ඇති ගස්, වැල් ආරක්ෂා කළ යුතු බව පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ ඒවාට හානි කිරීම වරදක් බවද පෙන්වාදුන් සේක. තම ශ්‍රාවකයන්ටත් ජනතාවටත් දේශනා කෙළේ වනාන්තරවලට හානි කිරීම නොකළ යුතු බවයි. ගසකින් කොළ අත්තක් පවා කැඩීම විනය විරෝධි ක්‍රියාවක් බවට පෙන්වාදුන් බුදුරජාණන් වහන්සේ වනාන්තරයේ ඇති ජලමූලාශ්‍රවලට හානි නොකළ යුතු බවත්, ජලයට මළ, මූත්‍රා නොකළ යුතු බවත් පෙන්වාදුන් සේක. චිත්ත විවේකය සඳහාත් ගැටලු විසඳා ගැනීම සඳහාත් වනාන්තර සුදුසුබව පෙන්වාදුන් බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ගේ විනය ගැටලුවක් සිදුවූ අවස්ථාවේදී එයින් වෙන්වීමට චිත්ත විවේකය සඳහා පාරිලෙය්‍යය වනයට වැඩම කර එහි එස් වස් විසූ සේක.(10වන වස්කාලය) අවවාද ලබාදී හික්මවිය නොහැකි අවස්ථාවලදී සමාජයෙන් හික්මීම ලබා ගැනීමට ඉඩදී උපේක්ෂාවෙන් කටයුතු කිරීම බුදුසිරිතේ විශේෂ ලක්ෂණයකි. මෙය ජනසමාජයට හොඳ ආශීයකි. තනතුරු ප්‍රදනය කිරීමේ දී බුදුරජාණන් වහන්සේ අනුගමනය කර ඇත්තේ ඉතාම සුදුසු අය තෝරාගෙන ඒවා ප්‍රදනයකර ඇති බවයි. ඥාතිත්වය නොසැලකූ බවට කදිම නිදසුනක් වන්නේ ඥාතිත්වයක් ඇති දෙව්දත් තෙරුන්ට තනතුරක් නොදීමය. තනතුරු ප්‍රදනය කිරීමේදී කුල ගෝත්‍ර,නිලය ආදී පුද්ගල සාධකයන් නොසළකා හැරිය බවත්, පෙනීයන්නේ අන්‍ය ආගමික ලබ්ධිකයන් ලෙස මුලදී කටයුතු කළ කෝලිය,උපතිස් යන දෙදෙනාට ශාසනික පැවිද්ද ලබා ගැනීමෙන් පසු අගතනතුරු ප්‍රදනය කළ බවට විස්තර වන්නේ තනතුරු අපේක්ෂාවෙන් සිටි චන්න තෙරුන් බලාපොරොත්තු කඩවීමෙන් වේදනාවට පත්ව බුදුරජාණන් වහන්සේට නිඳා කළත් ඒ කිසිවක් ගණන් නොගෙන උපේක්ෂාවෙන් මුහුණ දුන්බව බුද්ධ චරිතයෙහි සඳහන් වෙයි. පසුවග භික්ෂූන්ගෙන් ආරම්භ වූ භික්ෂු සමාජය පරමාදර්ශී සමාජයක් බවට ධර්ම චාරිකාවේ යෙදෙන ලෙසට අනුශාසනා කළ සේක. ''සමගගහොථ මා විවදථ'' සමගිව කටයුතු කරන ලෙසත් අනවශ්‍ය වාද විවාද නොකරන ලෙසටත් කරුණු වදළෙ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ක්‍රියා කලාපයන්ද දින චරියාවකට අනුව පවත්වාගෙන යෑම ආදශීමත් ලෙසට සිදුකළ සේක. ජාති,ආගම්, කුල භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට ගලපාගත හැකි චර්යාවක් මෙමගින් සකස් කරගත හැකිය. බුදුරජාණන් වහන්සේට අනේපිඩු සිටුතුමා, විශාඛා දේවිය, බිම්බිසාර රජතුමා වැනි මහා දානපතියන් විසින් පූජාකරන ලද ආරාමවල තිබූ සැපසම්පත් කෙරෙහි නොඇලී අපිස් ජීවිතයක් ගතකළ සේක. එය වර්තමාන සමාජයේ ජීවත්වන මිනිස් සමාජයට කදිම ආදශීයකි. අධ්‍යාපනයේ යෙදී සිටින කෙනෙකුට විවිධ අභියෝග එල්ලවිය හැකිය. ඒවා ජය ගැනීමට කුඩාකළ සිටම පෞරුෂය වර්ධනය

15 පිටුවෙන්...

ඇම්.ඩී.විජයවර්ධන

## දුරුතු පොහොය දින වැදගත්කම



1. තුන් බෑ ජටිල දමනය.
2. බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට මහියංගනයට වැඩම වීම.
3. සුමන සමන් දෙවියන්ට කේෂ ධාතු පිළිගැන්වීම.
4. අනන්ත ලක්ඛණ සූත්‍ර දේශනා කිරීම.
5. වේළුවනාරාම පූජාව හා ආරාම පිළිගැන්වීමට භික්ෂූන්ට අවසර දීම.
6. සිරිසඟබෝ කුමරුන්ට නන්ද හිමියන් විසින් රාජ ධර්ම උගන්වා අවසන් කිරීම.

# දිවිමඟට සැරලෙන......
# දැහැමි පිළිවෙත්



**මි**නිසා තමාට සිතෙන හොඳ නරක දෙක හොඳින් තේරුම් ගෙන සමාජ යහපතට  හේතු වූ දේ කිරීමට උත්සහ කරයි. සිත, කය, වචනය සංවරයක් ඇතිව ක්‍රියා කරයි. සිත සංවර වීමට භාවනාව හේතුවන අතර කය, වචන දෙක සංවර වන්නේ සීලයෙනි. වාචනං සමෝදනං සීලං' යනුවෙන් දහමෙහි දක්වා ඇත්තේ එයයි. පන්සිල්, අටසිල්, දසසිල් ආදී වශයෙන් ගිහියන් සඳහා සිල් වගී කර ඇත. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය ආදී සිල් පද පැවිද්දන් සඳහා වගී කර ඇත. මෙම සීලයන් වැඩීම දියුණු කිරීමකි. සංවර්ධනය කිරීමකි. දියුණුව හෙවත් සංවර්ධනය කොටස් දෙකකි. එනම්

1. භෞතික සංවර්ධනය
2. අධ්‍යාත්මික සංවර්ධනය

භෞතික සංවර්ධනය ලෙස හැඳින්වෙන්නේ පුද්ගලයාට බාහිර වටපිටාවෙන් සම්පත් බහුලවීම, මූලික අවශ්‍යතා නොඅඩුවීමයි. අධ්‍යාත්මික සංවර්ධනය යනු ශීලය මුල් කොට ගෙන දියුණු කරනු ලබන සදචාර සංවර්ධනයයි. දුසිරිතෙන් ඈත්වී සුසිරිත් පුහුණු කිරීම සදචාර දියුණුවයි. සදචාරය ඇති තැන භෞතික වශයෙන්ද සංවර්ධනය රඳපවතින බව බුදුදහමෙහි ඉගැන්වේ. සමාජය තුළ අධ්‍යාත්මික ගුණ වගාවක් ඇති කිරීමට හේතුවන ප්‍රතිපදවක් ඇත. එම පිළිවෙත් වන්නේ පඤ්ච සීල ප්‍රතිපදවයි. මෙලෙස සීලය දියුණු කිරීමෙන් සදචාර සංවර්ධනයක් ඇතිවේ.

## සීලය සහ සදචාරය

මිනිසුන්ගේ ප්‍රගතිය හෙවත් සංවර්ධනය සදචාර සම්පන්නවීම තුළින් පිළිපිඹු කෙරේ. පුද්ගලයා සිදු කරන දූරාචාර තුළින් සමාජයට අයහපතක් සිදුවේ. මෙලෙස මිනිසා සදචාරය ඉවත් කොට දූරාචාරය අනුව ගමන් කිරීම තිරිසනාට උපමා කොට තිබේ. මිනිසා මෙන්ම තිරිසනා අතර සමානකම් හතරකි. එනම් නිදා ගැනීම, ආහාර ගැනීම, බිය, සිය වර්ගයා බෝ කිරීමය. මෙලෙස සමානකම් තිබුණද මිනිසා දුසිරිතට ලැජ්ජාවක් හා බියක් ඇත. සමාජයක සිව් ආකාරයක මිනිසුන් සිටින බව පෙන්වා දී ඇත. එනම් මිනිසුන් සේ සිටින තිරිසන්නු, මිනිසුන්ම වන මිනිස්සු වශයෙනි. මෙහි පළමු, දෙවන, තෙවන ගණයට අයත් වන්නෝ සදචාරවත්  මිනිසා ලෙස වගී කළ හැක. දුසිරිත් කිරීමට ලැජ්ජා නැති අන් අය නොමඟ යවන සංවරයක් නැති අධර්මයෙන් උපයා යැපෙන පුද්ගලයා සුවසේ කාබී වෙසෙන දක්ෂ කපුටෙකු වැනිය යනුවෙන් ධම්මපදයේ දක්වා ඇත. පරපන නසන, අන්සතු දේ හොරකම් කරන අසම්මතචර්යා ඇති මත් ද්‍රව්‍ය භාවිතා කරන බොරු කියන පුද්ගලයන් සිටින සමාජය දියුණු යැයි කිව නොහැක. මිනිස්කම නොමැති සමාජයේ භෞතික දියුණුවද මායාවකි.

බුදුදහමට අනුව සියළු මානව ක්‍රියාකාරකම් වලට මනස මුල්වේ. තමන් විසින් කරනු ලබන අයහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස එන බවත්, තමන් කරනු ලබන යහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස සෙවණැල්ල සේ එන බවත් උපමා කර ඇත. මෙලෙස කායික හා මානසික පිරිහීම දුසිල් බවද, කායික මානසික හා අධ්‍යාත්මික දියුණුව සුසිල් බව ප්‍රකට කරන්නේය.

බුදුරජාණන් වහන්සේ වදළ සීලය චාරිත්‍ර හා වාරිත්‍ර සීලය යනුවෙන් කොටස් දෙකකි. එනම් විරමණය හා සමාදනයයි. විරමණය යනු වැළකී සිටීමයි. චාරිත්‍ර යනු පරපණ නැසීම අන්සතු දේ ගැනීම, අසම්මත හැසිරීම, බොරු කීම, සිහි විකල්බව ආදියෙන් වැළකී සිටීමයි. එසේ වැළකී සිටීමෙන්ම ප්‍රමාණවත් නොවේ.

සමාජයේ වෙසෙන මනුෂ්‍යන්ගේ ජීවත් වීමේ නිදහස තහවුරු කිරීම, දයාව, කරුණාව, මෛත්‍රිය, සියළු කාන්තාවන් ආරක්ෂා කිරීම, සම්මත හැසිරීම් පවත්වා ගැනීම, අන් සතුන් විපතින් ආරක්ෂා කර ගැනීම, සත්‍ය වචන කතා කිරීම, මංමුලා නොකිරීම ආදිය චාරිත්‍ර සීලයට අයත් වන අතර එය සමාදනයයි. මෙලෙස

බුදුදහමට අනුව සියලු මානව ක්‍රියාකාරකම් වලට මනස මුල්වේ. තමන් විසින් කරනු ලබන අයහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස එන බවත්, තමන් කරනු ලබන යහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස සෙවණැල්ල සේ එන බවත් උපමා කර ඇත.

විරමණය හා සමාදනය මැනවින් තේරුම් ගෙන කටයුතු කිරීම තුළින් කායික හා මානසික සුවය සංවර්ධනය වන්නේය. පංච ශීලය තුළින් මානව සබඳතා දියුණු කර ගැනීමට උපකාර වෙයි. සීලය පිරිහීමට පත්වුව හොත් මිනිස් සබඳතා හා සාමයද පිරිහෙන්නේය.

එකිනෙකා අතර හිංසනය, සිදුවුවහොත් සමාජයට හානි පමුණුවන්නේය. එලෙසම මිනිසුන් සතු සම්පත් ඔවුනොවුන් විසින් ආරක්ෂා කරගත යුතු වන්නේය. සොරමැරකම් වර්ධනය වුවහොත් මානසික අසහනයද වර්ධනය වන්නේය. අසම්මත හැසිරීමෙන් වැළකී කුල කුමරියන් ආරක්ෂා කිරීම සිදුවන විට සමාජ ප්‍රශ්න, සමාජ රෝග ආදිය දුරුවන අතර මානව හිතවාදී බවද තහවුරු වන්නේය.

සත්‍ය වචන භාවිතය නිසා ඔවුනොවුන් අතර විශ්වාසයද ගොඩ නැගෙන්නේය. හොඳම නෑයා විශ්වාසවන්තයා බව බුදුදහමෙහි පෙන්වා දී තිබෙනවා. එමෙන්ම සමාජ පැවැත්ම සඳහා මනා සිහියෙන් කටයුතු කිරීමද අත්‍යවශ්‍යය කමත් නිවැරදි සිහියෙන් යුතුව තම ජීවිතය පවත්වා ගෙන යෑම තුළින් ශීලයද ආරක්ෂා වන අතර මානව සබඳතාවද වර්ධනය වීම සිදුවෙයි.

මිනිසාගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ශක්තිමත් ආර්ථිකයක් සකස් කර ගැනීමත් වැදගත්ය. යහපත් සාධාරණ ආර්ථිකයක් තුළින් සැපවත් ජීවිතයක් ගත කිරීමට හැකි බවද බුදු දහමෙහි දක්වා ඇත. ආර්ථික දියුණුව සඳහා මස් වෙළදාම, වස වෙළඳාම, මත්පැන් වෙළඳාම ආද්‍ය පංච වෙළදාමෙන් ඈත්ව තුලා කූට මානකූට යන වැරදි මැනීම් වලින් ඈත්ව යහපත් වෙළඳ කටයුතු කළ යුතු බව ඇතැම් සූත්‍ර ධර්මවල සඳහන් කර ඇත. උත්සහයෙන් දහඩිය වගුරවා දෑතේ මහන්සියෙන් ධාර්මිකව ධනය ඉපයීම කළ යුතු බව දහමේ පෙන්වා ඇත.

සෑම දෙනාම සිල්වත් ගුණ ධර්ම පුරන යහපත් පුද්ගලයන් වීමට අධිෂ්ඨානය කර ගැනීම වටිනේය.

පූජ්‍ය මෙත්තානි අසේකා
මෙහෙණින් වහන්සේ

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## දේශයේ අනන්‍යතාව සුරකිමු

තමාගේ ඉරණම තමා විසින්ම විසඳාගත යුතු බවත්, තමාගේ දෙවියා නැතහොත් ගැලවුම්කරුවා තමාම වන බවත් බෞද්ධ චින්තනය උගන්වයි.

ඒ අනුව මිනිසාගේ ජීවිතය හා සම්බන්ධ කර්මය, ඉරණම, දෛවය, දෙවියා ආදී සියලු දේ මිනිසාගේ උත්සාහයට සහ ධෛර්යට යටත්ය.

මෙය සරලව කිවහැක්කේ අදේවවාදී බව ලෙසය. කෙසේ වුවද ශ්‍රී ලාංකික බෞද්ධයෝ ඈත අතීතයේ සිටම දෙව් දේවතාවුන් විශාල පිරිසක් උදෙසා වැදුම් පිදුම් සිදුකරනු ලබති. මින් හැඟී යන්නේ බොහෝ බෞද්ධයෝ දාර්ශනික හා ආගමික මතවාද කීපයක් සරණ යන බවය.

ලොව පවතින සෑම රටකටම පාහේ ආගමික අනන්‍යතාවයක් පවතී. එය යම් ආගමකට මුල්තැන දීමේ සිට මූලධර්මවාදීත්වය දක්වා පැතිර යන්නකි.

ශ්‍රී ලංකාව බෞද්ධාගමට මුල්තැන සහ අන්‍යආගම් වලටද නිසිතැන දෙමින් කටයුතු කරනු ලැබුයේ කලෙක සිටය. එය ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණු දා සිට ක්‍රමයෙන් වැඩී ආ තත්වයකි. ඒ සඳහා ශ්‍රී ලංකාව සියලු සුදුසුකම් සපුරාලනු ලැබ ඇත. සිරිලක සිව්කොණ පිහිටි බෞද්ධ ආගමික වෙහෙර විහාරස්ථාන මෙන්ම දහස් සංඛ්‍යාත බෞද්ධ පුරාවස්තු ඊට නිදසුන් සපයයි. උතුරු පළාත සැලකූවිටද දඹකොළපටුන, ලංකාපටුන සහ නාගදීපය මුල්කොටගත් බෞද්ධ සංස්කෘතික ත්‍රිකෝණයක් පෙර තිබූ බව ඉතා පැහැදිළිය.

අන්‍ය ආගම් විෂයෙහිලා ආගමික සහනශීලීතාව පෙන්වන නිදසුන් බෞද්ධ ආගමේ අපමණය. දෙවන පෑතිස් රජ දවස මහින්දාගමනයෙන් ඇරඹී පසුව දුමින්දාගමනය, දළදාගමනය ඔස්සේ මෙරට ස්ථාවර කළ බෞද්ධ පදනම සම්බුදුරජාණන් වහන්සේ මහියංගණය, නාගදීපය සහ කැළණිය යන ලංකාගමනයන්ගෙන් පෙර දවස වඩාත් නියත විවරණ ලැබූවකි.

ඒ අනුව මෙරට පවතින සප්‍රාණික බෞද්ධ සංස්කෘතික පදනම ආරක්‍ෂා කර පෝෂණය කිරීම රජයේ පමණක් නොව ලෝක සංස්කෘතියේ මුරදෙටුවා ලෙස පෙනී සිටින යුනෙස්කෝවේද වගකීමකි. තෝරාගත් වෙහෙර විහාර ලෝකඋරුම මැයෙන් නම්කොට ඒවා සංචාරක ස්ථාන කරනු වෙනුවට සමස්ත ලංකාවටම බෞද්ධ සංස්කෘතික උරුමයක් සේ සලකා සංරක්‍ෂණය කිරීමට තරම් වටිනා දිවයිනක් බව අප ලෝකයට පෙන්නුම් කළ යුතුව ඇත.

ඉකුත් වසරන් තුළ ශ්‍රී ලංකාවේ ආගමික ව්‍යාප්තිය වර්ධනය සහ ආගමික ස්ථාන ව්‍යාප්තිය හා වර්ධනය පිළිබඳ නිසි විමර්ෂණයක් සිදුකළහොත් හඳුනාගතහැකි කරුණු රැසකි.


ශ්‍රී ලාංකිකයෝ සැබවින්ම සාමකාමීය. සංහිඳියාකාමීහුය. බුදුදහමින් පෝෂිත මහා කරුණාව සහ මහා ප්‍රඥාවෙන් යුක්තය.

අධිරාජ්‍යවාදී බලපෑම දේශපාලන බලකාමය, අවස්ථාවාදී අන්තවාදය සහ දුරදිග නොබලා කටයුතු කිරීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික දේශයේ අධ්‍යාත්මය විනාශ වීමය. එය ගොඩනැඟී ඇත්තේ බුදුදහම මුල්කොටගත් අන්‍ය ආගම්හි සහභාගිත්වය මතින් බිහිවූ සබැඳියාවකිනි.

එය සියල්ල කැටිවූ දාර්ශනික දාමයක් වැනිය. එහි මුල්පුරුක් සිඳලුවොත් අවශේෂ දාමයෝද නිතැනින්ම සිඳී බිඳී යනු නිසැකය.

අප දේශයේ ඒකීයත්වය සහ බුදුදහමේ ප්‍රමුඛත්වය පිළිබඳ මෙරට ගරුතර මහා සංඝරත්නය විසින් අවධාරණය කරනු ලැබ ඇත්තේ එවන් පසුබිමකය. අන්‍ය ආගමික නායකයින්ද ඒ බව පසක් කරනු ලැබ ඇත.

මෙම දේශය පුණ්‍ය භූමියකි. මෙහි වාසය කරන්නේ මේ භූමියේ ශ්‍රේෂ්ඨත්වය සහ ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨත්වය ආරක්‍ෂා කිරීමට බැඳී සිටිති. ඉන් ප්‍රකාශ වන්නේ දේශයේ ජාතිකත්වය සහ ආගමික ප්‍රමුඛතාව පිළිබඳවය. අන්‍ය සාමාජික සහජීවනය පිළිබඳවය.



# පොහොය දොළහේ වැදගත්කම හඳුනා ගනිමු



**දුරුතු පොහොය**

1. තුන් බෑ ජටිල දමනය.
2. බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට මහියංගනයට වැඩම වීම.
3. සුමන සමන් දෙවියන්ට කේෂ ධාතු පිළිගැන්වීම.
4. අනන්ත ලක්ඛණ සූත්‍ර දේශනා කිරීම.
5. වේළුවනාරාම පූජාව හා ආරාම පිළිගැන්වීමට භික්‍ෂූන්ට අවසර දීම.
6. සිරිසඟබෝ කුමරුන්ට නන්ද හිමියන් විසින් රාජ ධර්ම උගන්වා අවසන් කිරීම.

2) **නවම් පොහොය**

1. ප්‍රථම සංඝ සාමග්‍රිය පැවැත්වීම.
2. අගසව් තනතුරු පිරිනැමීම.
3. ඕවාද ප්‍රාතිමෝක්‍ෂය දේශනා කිරීම.
4. ආයු සංස්කාරය හැරීම.

3) **මැදින් පොහොය**

1. බුදු වී කිඹුල්වත් නුවරට වැඩම කිරීම.
2. මහා ප්‍රජාපතී ගෝතමියට ධර්ම දේශනා කිරීම.
3. ශ්‍රී පාද වන්දනාව සඳහා ජනප්‍රිය දිනය වීම.
4. නන්ද කුමරු පැවදිවීම.
5. රාහුල කුමරුන් පැවදි වීම.

4) **බක් පොහොය**

1. බුදුරජාණන් වහන්සේ දෙවනවර ලංකාවේ නාගදීපයට වැඩමවීම
2. සතර පෙර නිමිති පහළ වීම.
3. කිඹුල්වත්පුර ගමන අවසන් වීම.

5) **වෙසක් පොහොය**

1. සිදුහත් කුමරුගේ උප්පත්තිය, සිදුහත් බෝසතාණන්ගේ බුදුවීම, බුදු හිමිගේ පිරිනිවන.
2. කිඹුල්වත් නුවරට වැඩීම.
3. කිඹුල්වත් නුවරදී යමාමහ පෙළහැර පෑම.
4. බුදුරජාණන් වහන්සේ තෙවනි වරට ලංකාවේ කැලණියට වැඩම වීම.
5. සිංහල ජාතියේ ආරම්භය සහ විජය කුමරුගේ පැමිණීම.
6. දෙවන පෑතිස් රජුගේ දෙවන අභිශේකය.
7. රුවන්වැලි මහසෑයේ වැඩ ආරම්භ කිරීම.
8. මහා විහාර වංශික උපසම්පදාව සිදුවීම.

6) **පොසොන් පොහොය**

1. මිහිදුමහා රහතන් වහන්සේගේ ලංකා ගමනය සිදුවීම.
2. බුද්ධි පරීක්‍ෂණය සිදුවීම
3. ලක්දිව බුදුසසුන පිහිටු වීම.
4. චුල්ල හත්ථිපදෝපම සූත්‍ර දේශනාව කිරීම.
5. භණ්ඩුක කුමරුගේ පැවැද්ද හා උපසම්පදාව සිදුවීම.

7) **ඇසළ පොහොය**

1. බෝසත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම.
2. අභිනිෂ්ක්‍රමණය සිදුවීම.
3. පළමු මංගල ධර්ම දේශනය පැවැත්වීම.
4. පළමු ධර්ම සංගායනාව පැවැත්වීම.
5. කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් වීම.
6. භික්‍ෂූන් වහන්සේලා පෙර වස් විසීම.
7. රාහුල කුමරුගේ උපත සිදුවීම.
8. ගන්ධබ්බ රුක්ඛ මූලයේදී යමාමහ පෙළහැර පෑම.
9. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම.

8) **නිකිණි පොහොය**

1. ආනන්ද හිමිගේ රහත් වීම.
2. භික්‍ෂූන් පසුවස් විසීම.
3. ලංකාවේ මිගා අරියවංශ දේශනාව පැවැත් වීම.

9) **බිනර පොහොය**

1. මෙහෙනි සසුනේ ආරම්භය
2. තපස්සු භල්ලුක දෙදෙනා සෑදූ ගිරිහඩු සෑයේ වාර්ෂික උත්සවය පැවැත්වීම.
3. ලලාට ධාතු තැන්පත් කොට ඇති සේරුවාවිල මහාසෑයේ වාර්ෂික පිංකම පැවැත්වීම.
4. ධූතාංග සමාදානය සිදුකිරීම.

10) **වප් පොහොය**

1. තව්තිසාවන් බුදුරජාණන් වහන්සේ සංකස්ස පුරයට වැඩම වීම.
2. මහා පවාරණය සිදුවීම.
3. ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩමකරවීමට පණිවිඩ යැවීම.
4. අරිට්ඨ මහා තෙරුන් ථූපාරාමයේදී විනය පිඨකය සජ්ඣායනා කිරීම.

11) **ඉල් පොහොය**

1. මෛත්‍රී බෝසතුන් නියත විවරණය ලැබීම.
2. ප්‍රථම ධර්ම දූත පිරිස ධර්ම ප්‍රචාරයේ යෑම.
3. තුන් බෑ ජටිල දමනය.
4. සැරියුත් මහතෙරුන් වහන්සේ ගේ පිරිනිවීම.
5. පසුවස් පවාරණය.
6. ථූපාරාම පූජා හා ධාතූන් ගෙන ඒම.

12) **උඳුවප් පොහොය**

1. ලංකාව් මෙහෙණි සසුනේ ආරම්භය සිදුවීම.
2. ලංකාවට ශ්‍රීමා බෝධි ශාඛාව වැඩම කරවීම.
3. බෝධි පූජා ආරම්බ වීම.

**ගලගෙදර රතනවංශ හිමි**

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## පොඩි හාමුදුරුවෝ



හිවසට සමු දී
සිවුරට සිත දී
බෝ මළුවේ
සක්මන් කරන
පොඩි හාමුදුරුවෝ........
දිවි සයුරෙන්
එතෙර වන්න
ගුණදම් පුරනවා
හැමවිට
දුටුවන් සනහන ඔබ..........

කුමාර ගුරුසිංහ ආරච්චි
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

## පරාර්ථකාමිත්වය

නැවත වරක් මම මේ ලෝකයට
පිවිසෙන්නම්.............
එහෙත් කුමන කාරණයකටද?
දැන් මා මෙය අවසාන
කළ යුතුය............
තවත් ලිපි ලිවීමට පෙළඹෙතත්
මෙය ඒ අවසාන
ලිපියයි.
මුළු රටම විශාල සිරකඳවුරකි
මා පමණක් නිදහදස් වන්නේ
කුමටද?
අමාලි රුවන්තිකා
ඇහැලියගොඩ

අමාලි රුවන්තිකා
ඇහැලියගොඩ

## පැතුම

රියේ සුක්කානමට
මතුවූ දැතෙ කරගැට
නොපෙන්වා මගෙ නෙතට
ළංකළා පහන් සිළුවට

ඔබ දුන් සෙනෙහසින්
උස් මහත් වූ බැවින්
අතට ගත් පන්හිඳෙන්
ලියන්නෙමි කවි ඔබ නමින්

වියෝ වූ පියාණනි
ඔබ යළි වඩිනු මැනවි මිණි
සුරකිම් මහත් බැතියෙනි
කර මගෙ දිවි දෙවනි

දෙන්න අවසර මඳකට
පාරමිතාවක් පුරනට
නිවන් දකිනා තුරාවට
මම ඔබේ දියණියක වන්නට

සුරනි නර්මදා මුතුමාලි
ඇල්පිටිය.

## පුංචි නංගියෝ

බත් ඇටයක්
පොඩි කුසට
නොවැටුනත්
කටුමැටි ගෙපොලේ
සතුටින් හිනැහුණු
පුංචි නංගියෝ......
කුප්පියේ එළියෙන්
නෙතු අග කඳුලින්
මුව ගාල් කරගෙන
රූ තුන්යාමේ
පොත් පිටු මත
තුන් සිත එක්තැන් කොට
හවුන් වඩනවද
පුංචි නංගියෝ............

සුගන්ධිකා කුමාරි බණ්ඩාර
කුඩාවැව

## අපේ ඉස්කෝලේ

ජාතික ඇඳුම ඇද ගත්තු
ලොකු සර්ගේ අභිමානය
අත රැඳුණු වේවැලට අවනතව
හද්දා පිටිසර ගමක පරපුර
සරසවියට අවනත කළ,
අධිවේගී නොවූ මල් මාවත දිගේ
කුරුල්ලන්ට ඔච්චම් කර කර
අපි ගියපු ඉස්කෝලේ
ගමේ ගුරු මෑණියන්ගේ
සාරියේ තිබූ සැවැන්දරා සුවඳට
ඉවකර දණ ගහගෙන හිටපු
කටපාඩම් බැරිවෙච්ච පංතිය
අපට ජීවිතේ කියාදුන් අකුරු තොටිල්ල
පන්ති කාමරය වැහිලා
ගේට්ටුව විතරක් කැඩිලා
හරක් රැනක් ඇතුල් වෙන අපූරුව
අන්න බස් පාර අයිනේ
පාට පාට ඉස්කෝල කඩයක් ඇරිලා
ඉංග්‍රීසියෙන් උගන්වනවා
සනුහරේටම වැරදිච්ච පාඩම......

වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

## බුදු පියාණෙනි

පන් සාළිස් වසක් සපිරුණු
බුදුසෙවණේ දහම් පහසින්
උගතෙමි චතුර්සත්‍යය

බුදුසෙවණේ පුරා සති ගණන්
ගතකොට
සැනසුම ලදිමි
මෙහෙණියක් ලෙස

ජයමාවතට ලංවිමි
අමතක නොකරමි කිසිදක සමිඳුනේ
සමුනොගනිමි ලොව්තුරා සුවයෙන්

රකින්වා මා සඳකල්
බුදු සමිඳුනේ.....

පූජ්‍ය මෙත්තානි අසේකා
මෙහෙණින් වහන්සේ



## ජය සිරිමා බෝධී....

අපමන ලෝ සත
සසරින් ගලවා
නිවනට මඟ පෑදූ
නොපමාවී වැඳ
දොහොත් මුදුන්දී
තිලො වඟ මෑනී සාදූ
ලුම්බිණි සල් උයනේදී
බිහිවී
වෙසගේ පුන් පෝදා
පැවසී මුලු ලොව
අගතැන් වෙන බව....
ලොවටම වැඩ සාදා
දස මාර සේනා බිඳ
පලවාහැර
ජය සිරිමා බෝධී.........

ඩබ්. එම්. පී. විජේසිංහ
ගල්නෑව

## සිතන්නට යමක්......

එපා කිසිවිට කෝප වන්නට ඇඟේ ලේ ටික දැවෙනවා
එපා කිසිවිට උඩඟු වන්නට ඔබේ යහගුණ මැකෙනවා
එපා කෙනෙකුට දුකක් දෙන්නට එයින් හදවත රිදෙනවා
එපා ආසා පොදි බඳින්ට මැරෙනවා අපි මැරෙනවා

මොකටද ගුණ කථා කමකට වැඩක් නැති
හොඳටම වැඩිවුනොත් සුදු කොඩි දෙකක් ඇති
ජීවත් වෙලා කිසිකෙනෙකුට බරක් නැති
මිනිහෙක් මලා කීවොත් හොඳටෝම ඇති

සැකසුම:
විශ්‍රාමලත් පරිපාලන ග්‍රාම නිලධාරී
(ඩී.බී. සෙනවිරත්න)

## යළි වඩිනු මැනවි

(පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන්ගේ ගුණානුස්මරණය නිමිත්තෙනි)

තිලොවට තිලක හිමි නිකෙලෙස් දහම තුළ
නිමැවුන සඟ සසුන පින්පිරි තඹර විල
සුපිපුණු සුදු නෙළුම හිමිසඳ ගංගොඩ විල
පරවී ගියේ පවකිණි අප පෙරදි කළ

ගිහි දිවියේ හරය පන්සිල් තුළ ඇත්තේ
එය සුරැකීම ඔබෙ සැනසුම විය යුත්තේ
මෙලෙසින් දෙසූ දම් රඳවාගත් චිත්තේ
බොදු හදවත් වැළපේ මෙ විපත මත්තේ

හරබර සරල හෙලබස හසුරුවා ගෙන
සඳහම් ගඟුල ජනහද සනසවාලන
අම දහරක වෙද්දී උතුරා ගලායන
කවුරුද විපත කලෙ ඒ බණ නිමාවෙන

වියපත් අයට වැඩියෙන් හිමි ඔබ ළඟට
ආවේ යොවුන් පිරිසයි පිළි සරණයට
දුගියන් ධනවතුන් යොදවා යහ මඟට
ඔබ දෙසූ දහම් එළියත් විය බොදු දනට

ආසිරි වාදයක් විය ඔබගේ බැබලීම
මහශාපයක් වනු ඇත අප හැරයාම
රට දැය නඟන්නට දහමින් පෙරසේම
යළි මෙහි වඩිනු මැන ගරු සමිඳුනි සෝම

ජයන්ති මද්දුමාරච්චි
ගුරුවල - දොම්පේ

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

# ස්වීයත්ව වර්ධනයට බුදු දහමින් අත්වැලක්



පුද්ගලයා නාම රූප දෙකින් හෙවත් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාණ යන පංචස්කන්ධයන්ගෙන් සැදී ඇති බව අප උගෙන ඇත. රූප කොටසෙහි පුද්ගලයාගේ කායික පක්ෂයත්, නාම කොටසෙහි බුද්ධිමය හා චිත්තවේගික පක්ෂයත් ඇතුළත් වෙන බව පෙනේ. වේදනා, සංඥා, සංඛාර හා විඥාණ යන බුදු දහමේ සඳහන් චින්තන ක්‍රියාවලියට ගති ස්වභාවයෙන් හා මනඃ ප්‍රකෘතීන්ද ඇතුළත්ය. මේ අනුව බුදු දහමේ සඳහන් පංචස්කන්ධය ස්වීයත්වයේ සම්පිණ්ඩනයක් ලෙස සැළකිය හැකිය.

## චර්යාවාදය හා බෞද්ධ මනෝ විද්‍යාව

බෞද්ධ මනෝ විද්‍යාව අනුව විඥාණයෙන් තොරව සත්වයෙකුගේ ක්‍රියාකාරීත්වයක් නොමැත. එහෙත් නූතන චර්යාවාදී මනෝවිද්‍යාඥයෝ හුදෙක් විඥාණය ගැන කථා කිරීම අර්ථ රහිත බව කියමින් පුද්ගලයාගේ දෘශ්‍ය හැසිරීම් ගැන අධ්‍යයනය කළ යුතු බව කියති. පුද්ගලයෙකු තමාගේ මනස තේරුම් ගෙන මනස පාලනය කරමින් තමාගේ ස්වභාවය ද තේරුම් ගෙන අවශ්‍ය වෙනස්කම් කර ගනිතොත් සුවසේ වාසය කිරීමට හැකි බව බෞද්ධ මනෝ විද්‍යාව පෙන්වා දෙයි. එබැවින් බුදු දහම අනුව ස්වීයත්වය වර්ධනයේදී සදාචාරමය පසුබිමක් අනුව මනස සකස් කර ගැනීම අවශ්‍ය වේ. මේ සදචාර පසුබිමට සීල, සමාධි හා ප්‍රඥා ඇතුළත් වෙයි. ශීලයෙන් කය වචන දෙක හික්මවා පුද්ගලයෙකුගේ ශාරීරික ක්‍රියාකාරිත්වය පාලනය කිරීමත්, සමාධියෙන් සිත හික්මවීමත්, ප්‍රඥාවෙන් මේ අංග දෙකම සුසංගත ලෙස පාලනව කර ගැනීමත් මගින් නිවන් අවබෝධ කර ගැනීමේ මාර්ගයක් බෞද්ධ මනෝ විද්‍යාවට ඇතුළත්ය. බුදු දහම අනුව ස්වීයත්ව වර්ධනය එක් ආත්මභාවයකට පමණක් සීමා නොවී විමුක්තිය දක්වාම දිවෙන ක්‍රියාමාර්ගයකි.

ස්වීයත්ව වර්ධනයේ දී පරිසරයේ ඇති වැදගත්කම පමණක් වොට්සන්, පැව්ලෝ වැනි චර්යාවාදී මනෝවිද්‍යාඥයෝ පිළිගනිති. ඔවුන්ගේ අදහස අනුව පුද්ගලයා ක්‍රියාත්මක වීමට අවශ්‍ය තත්වයන් ඔහුට ලැබෙන්නේ ආරයෙන් නොව පරිසරයෙනි. එහෙත් බුදු දහම ස්වීයත්ව වර්ධනයේධී පරිසරය පමණක් නොව ආරය ද වැදගත් බව පිළිගනිති. මහාමංගල සූත්‍රයේ එන සුදුසු ප්‍රදේශයක වාසය කිරීම (පතිරූප දේස වාසෝච) යන්නෙන් භෞතික පරිසරයත්, බාලයන් ඇසුරු නොකළ යුතුයි පණ්ඩිතයන් ඇසුරු නොකළ යුතුය. (අසෙවනාච බාලානං පණ්ඩිතා නංච සේවනා) යන්නෙන් සමාජ පරිසරයත්, පෙර කළ පින් ඇති බව (පුබ්බේචකත පුඤ්ඤාතා) යන්නෙන් ආරයත් අදහස් කර ඇති බව පෙනේ.

## මනෝ වික්ශේපණවාදය හා බුදු දහම

මිනිස් චර්යාව මෙහෙයවන බලවේග පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා මනෝවිශ්ලේෂණ වාදයේ කතෘවරයා වූ සිග්මන් ප්‍රොයිඩ් ගේ බොහෝ දුරට සමානකම් දක්නට ලැබේ. මිනිස් චර්යාව මෙහෙය වන ප්‍රධාන බලවේග කාමාශාව නැමැති සහජ ආශය බව ප්‍රෙයිඩ් කියයි. බුදුරජාණන් වහන්සේ මෙම බලවේගය තණ්හාව නමින් හඳුන්වති. තණ්හාව ද සිත හා සම්බන්ධ ස්වභාවයකි. සත්වයා සසරට බැඳ තබන 'සංයෝජන' නමින් හඳුන්වනු ලබන බැමි දහයක් තණ්හාව වශයෙන් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත.

බුදුරජාණන් වහන්සේ අදහස් කළ තණ්හාව ද, ප්‍රෙයිඩ් විසින් අදහස් කරනු ලබන කාමය ද පුළුල් අර්ථ ඇති සංකල්ප වේ. උන්වහන්සේ දේශනා කර ඇති දස සංයෝජන පුද්ගල ස්වීයත්වයට ඇතුළත් ගති ලක්ෂණ දහයක් බව පෙනේ.

**1. සක්කාය දිට්ඨි**
**(මමය, මගේ ය කියන හැඟීම)**
**2. විචිකිච්චා ච**
**(සැකය/ බුද්ධාදි අටතැන් ගැන සැකය)**
**3. සීලබ්බත පරාමාස**
**(ශීල වුතවලට වහල්වීම)**
**4. කාම රාග**
**(කාම/ආශාව)**
5. ව්‍යාපාද
(ක්‍රෝධය/විනාශකාරී හැඟීම)
6. රූප රාග(රූප ලෝක/අරූප ධ්‍යානවලට ඇති ඇල්ම)
7. අරූප රාග
(අරූප ලෝක/අරූප ධ්‍යානවලට ඇති ඇල්ම)
8. මාන
(මදය-තරුණ මදය, ආරෝග්‍ය මදය, රූප මදය ආදී වශයෙන්)
9. උද්ධච්ච
(නොසන්සාන්කම)
10. අවිජ්ජා
(නොදැනීම/ආර්ය සත්‍යය පිළිබඳ නොදැනීම)

ඉහත සඳහන් කළ මුල් සංයෝජන තුන ප්‍රධාන වශයෙන් පරිසරයෙන් එකතුවන ඒවා බවත් සෙසු සංයෝජන හතම ප්‍රධාන වශයෙන් ආරයෙන් පැමිණෙන ඒවා බවත් පෙනේ. කාමරාගය ප්‍රෙයිඩ් සඳහන් කළ කාමාශාවට සමාන කළ හැකි අතර ව්‍යාපාදය 'ආක්‍රමණ' ලැදියාවට සමාන කළ හැකිය.

බුදු දහම අනුව ස්වීයත්වය උපරිම තත්වයට වර්ධනය කළ තැනැත්තා රහතන් වහන්සේය. පුද්ගලයා අරහත් තත්වයට ළඟා වන්නේ ස්වීයත්වයේ අන්තර්ගත දස සංයේජන නැමැති කොලෙස් දහය ක්‍රම ක්‍රමයෙන් ඉවත් කිරීමෙනි. මාර්ගඵල ලැබීමේ ධී මෙම දස සංයෝජන ඉවත් කරන අනුපිළිවෙල පහත දැක්වේ.

**සෝවාන් ඵලය -**
**සක්කාය දිට්ඨි**
**විචිකිච්චා**
**සීලබ්බත පරාමාස**
**මේවා ස්වීයත්වයේ මතු පිට තට්ටුවේ ඇති පසුව ගොඩ නැගුණු ගති ලක්ෂණායි**
.
**සකෘදගාමි ඵලය -**
**කාමරාග**
**ව්‍යාපාදය (පටිඝය)**
**මේ අවස්ථාවේ දී තුනී වේ.**
**අරහත් ඵලය -**
**රූප රාග**
**අරූප රාග**
**මාන**
**(රූප ලෝක/අරූප ධ්‍යානවලට ඇති ඇල්ම)**
**7. අරූප රාග**
**(අරූප ලෝක/අරූප ධ්‍යානවලට ඇති ඇල්ම)**
**8. මාන**
**(මදය-තරුණ මදය, ආරෝග්‍ය මදය, රූප මදය ආදී වශයෙන්)**
**9. උද්ධච්ච**
**(නොසන්සාන්කම)**
**10. අවිජ්ජා**
**(නොදැනීම/ආර්ය සත්‍යය පිළිබඳ නොදැනීම)**

ඉහත සඳහන් කළ මුල් සංයෝජන තුන ප්‍රධාන වශයෙන් පරිසරයෙන් එකතුවන ඒවා බවත් සෙසු සංයෝජන හතම ප්‍රධාන වශයෙන් ආරයෙන් පැමිණෙන ඒවා බවත් පෙනේ. කාමරාගය ප්‍රෙයිඩ් සඳහන් කළ කාමාශාවට සමාන කළ හැකි අතර ව්‍යාපාදය 'ආක්‍රමණ' ලැදියාවට සමාන කළ හැකිය.

බුදු දහම අනුව ස්වීයත්වය උපරිම තත්වයට වර්ධනය කළ තැනැත්තා රහතන් වහන්සේය. පුද්ගලයා අරහත් තත්වයට ළඟා වන්නේ ස්වීයත්වයේ අන්තර්ගත දස සංයේජන නැමැති කොලෙස් දහය ක්‍රම ක්‍රමයෙන් ඉවත් කිරීමෙනි. මාර්ගඵල ලැබීමේ ධී මෙම දස සංයෝජන ඉවත් කරන අනුපිළිවෙල පහත දැක්වේ.

**සෝවාන් ඵලය -**
**සක්කාය දිට්ඨි**
**විචිකිච්චා**
**සීලබ්බත පරාමාස**
**මේවා ස්වීයත්වයේ මතු පිට තට්ටුවේ ඇති පසුව ගොඩ නැගුණු ගති ලක්ෂණායි**
.
**සකෘදගාමි ඵලය -**
**කාමරාග**
**ව්‍යාපාදය (පටිඝය)**
**මේ අවස්ථාවේ දී තුනී වේ.**
**අරහත් ඵලය -**
**රූප රාග**
**අරූප රාග**
**මාන**
**උද්ධච්ච**
**ස්වීයත්වයේ ගැඹුරුම තට්ටුවේ ඇති මේවා සම්පූර්ණයෙන් ඉවත් වේ.**

නිවන 'තන්හක්ඛය' නමින් හඳුන්වනු ලබන්නේ දස සංයෝජන ක්ෂය කිරීම නිසාය.

කාල් යුං, අයිසෙන්ක් වැනි මනෝවිද්‍යාඥයන් අන්තර්වර්තික බහිර්වර්තික ආදී වශයෙන් ස්වීයත්ව වර්ග කර දක්වීමට උත්සහ කර ඇත. බුදුරජාණන් වහ්නසේ ද කැපී පෙනෙන ගති ලක්ෂණ අනුව රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත හා විතක්ක චරිත ආදී වශයෙන් ස්වීයත්ව වර්ග කීපයක් පෙන්වා දී ඇත.

## සංවර්ධනය වූ පූර්ණ ස්වීයත්වය

බුදු දහම අනුව සංවර්ධනය වූ ස්වීයත්වයක අගය කළ යුතු විශිෂ්ඨ ගති ලක්ෂණ කීපයක් මහා මංගල සූත්‍රයේ එන,
'පුඨස්ස ලෝක ධම්මෙහි චිත්තං යස්ස නකම්පතී අසෝකං විරජං ඛෙමං එතං මංගල මුත්ත මං' යන ගාථාවෙන් පෙන්නුම් කර දී තිබේ.

**1. අටලෝ දහම් හි කම්පා නොවීම.**
**2. ශෝක නොකිරීම.**
**3. නොඇලීම (කෙලෙස්/රජස් නොමැති බව)**
**4. උවදුරු නොමැති බව (ක්ෂෙම භාවය)**

යන මේවා ප්‍රබල චරිතයක තිබිය යුතු ලක්ෂණයෝ ය. මෙම ලක්ෂණ උපරිම මට්ටමෙන් දැකිය හැක්කේ රහතන් වහන්සේ කෙනෙකු තුළය.

උපුටනය :-
ජාතික අධ්‍යාපන ආයතනය
මගින් ප්‍රකාශිත
බුදු දහම හා මනෝ විද්‍යාව ග්‍රන්ථය ඇසුරිණි.



# සඳකඩ පහණේ රූ සිරි වරුණේ

**" බෞද්ධ ආගමික ගොඩනැඟිලි සමීපව සඳකඩ පහණ දැකිය හැක. විනය පිටකයේ පාටිකා" යන්න සඳකඩ පහණේ බීජ අවස්ථාව ලෙස හඳුන්වා දිය හැක. විනය අටුවාවේ මෙය දක්වා ඇත්තේ සෝපාණස්ස හෙට්ඨා අඩ්ඩ චන්ද පාසාණං " යනුවෙනි. එහි අර්ථය නම් පියගැට පෙළ යට අඬ සඳ යන්නයි. මෙය ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි අඬසඳ පහණ යනුවෙන්ද දැක්වේ "**

බෞද්ධ කලා ශිල්ප අතර, චෛත්‍ය, වටදාගෙය, බෝධිඝර, ආසනඝර, මුරගල, කොරවක්ගල, ප්‍රතිමා මෙන්ම සඳකඩ පහණ විශිෂ්ඨ ගණයේ ශ්‍රේෂ්ඨ නිර්මාණයන් වේ. සඳකඩ පහණේ නිර්මාණාත්මක පැතිකඩ පිළිබඳව මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.

බුද්ධ කාලීන භාරතයේ ආගමික ගොඩනැඟිලි ආශ්‍රිතව සඳකඩ පහණ දැකිය හැක. විනය පිඨකයේ පාටිකා" යන්න සඳකඩ පහනේ බීජ අවස්ථාව ලෙස හඳුන්වා දිය හැක. විනය අටුවාවේ මෙය දක්වා ඇත්තේ සෝපාණස්ස හෙට්ඨා අඩ්ඩ චන්ද පාසාණං " යනුවෙනි. එහි අර්ථය නම් පියගැට පෙළ යට අඬ සඳ යන්නයි. මෙය ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි අඬසඳ පහණ " යනුවෙන්ද දැක්වේ.

භාරතයේ කිහිප තැනකම සඳකඩ පහණ් දැකිය හැකි මුත් කැටයම් සහිත ප්‍රධානතම මෙන්ම භාරතයේ දක්නට ලැබෙන හොඳම සඳකඩ පහණ ලෙස නාගර්ජූන කොණ්ඩයේ සිංහලාරාමයේ ඇති සඳකඩ පහන හඳුන්වා දිය හැක. මෙහි එකල ලක්දිව භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බව ද උන් වහන්සේලා එහි ගොඩනැඟිලි තැනවූ බවද ඉතිහාසගත තොරතුරු හෙළිකරන බැවින් මෙම සඳකඩ පහණද ලාංකීය කලාකරුවා අතින් නිම වූ නිමවුමක් විය හැක. සත්ව පේළියක් සහිත සඳකඩ පහණක් භාරත දේශයෙන් හමුව ඇත්තේද මේ නාගර්ජූන කොණ්ඩයේ සිංහලාරාම විහාර භූමියෙන් පමණි.

ශ්‍රී ලාංකීය බෞද්ධ කලා ශිල්පයේ ප්‍රමුඛතම මෙන්ම ශ්‍රේෂ්ඨතම කලා නිර්මාණය ලෙස සඳකඩ පහණ හැඳින්විය හැක. හෙල කලා ශිල්පයේ අග්‍රගණ්‍ය කලා නිර්මාණය වන සඳකඩ පහණ හෙළ කලාකරුවාගේ ස්වයං නිර්මාණයක් ලෙස හැඳින්විය නොහැකි වූවත් සඳකඩ පහණෙ කලාත්මක විකාශනයක් සිදු වූයේ ලාංකික හෙළ කලාකරුවා අතින් බව පෙර අපර දෙදිග විචාරකයින්ගේ මතයයි. සඳකඩ පහණ, පියගැට පෙළ, කොරවක් ගල්, මුරගල් සිංහල බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ අනිවාර්ය අංගයන් වූ බව ලංකාව පුරා විසිරී ඇති බෞද්ධ නටඹුන් සියුම්ව පරීක්ෂා කරන විට මනාව හඳුනාගත හැක.

අනුරාධපුර බිසෝ මාළිගය ඉදිරිපිට, ථූපාරාමය අසල දළදා මැඳුර ඉදිරිපිට, කුරුණෑගල රිදී විහාරය, පන්කුලිය, කෑගල්ල බෙලිගල රජ මහා විහාරය වැනි ස්ථානවල ඇති සඳකඩ පහණ කලා නිර්මාණයන්ගේ විශිෂ්ඨ ලක්ෂණය වූ නිර්මලත්වය, සරල බව වඩාත් ඉස්මතුව දක්නට පුළුවන. සුප්‍රකට කලා විචාරකයන් වන හෝර්කාට් " මහතාගේ මතයට අනුව සිංහල බෞද්ධ කලා ශිල්පියාගේ කලා කෞෂල්‍ය ප්‍රකට කරන ශ්‍රේඨතම නිමවුම සඳකඩ පහණයි. නිර්මල සුන්දර ලක්ෂණවලට අනුව නිමවන ලද සඳකඩ පහණෙහි සජීවි ගුණය අග්‍රගණ්‍යය.

ගොඩනැඟිල්ලකට ඇතුළු වන පියගැටපෙළ පාමුල සඳකඩ පහණ පිහිටුවන ලද්දේ අලංකාර කැටයමක් ලෙස බව පුරා විද්‍යාඥයින් කල්පනා කළහ. එහෙත් සඳකඩ පහණ පිළිබඳව ඉතා සියුම්ව අධ්‍යයනයේ නිරත වූ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් පවසනුයේ එහි ඉතා ගැඹුරු ආගමික දර්ශඥයින් කල්පනා කළහ. එහෙත් සඳකඩ පහණ පිළිබඳව ඉතා සියුම්ව අධ්‍යනයේ නිරත වූ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් පවසනුයේ එහි ඉතා ගැඹුරු ආගමික දර්ශනයක් ගැබ්ව ඇති බවයි. එනම් සඳකඩ පහන භව චක්‍රය ලෙස හඳුන්වා දෙයි.

පිළිමයේ මැද උස් වූ වේදිකාවක බුද්ධ ප්‍රතිමාව තැන්පත් කිරීමෙන් ධර්ම ප්‍රසාදය මත වැඩ සිටින බුදුන් පිළිබඳව අදහස ඉදිරිපත් වේ. පිළිමගේ වැඩ සිටින බුදුරජාණන් වහන්සේ දර්ශනය පථය වැටෙන භව චක්‍රය නම් සඳකඩ පහණයි. සඳකඩ පහණේ පිටතින්ම ඇති පලාපෙති හෙවත් ගිනි දැල්ලෙන් රාග, ද්වේෂ ආදී එකලොස්ගින්න සංකේතවත් කරන අතර ඊට ඇතුලතින් ඇති ඇත් අස් සිංහ ගව යන සත්ව රූපාවලියෙන් ජාති ජරා ව්‍යාධි මරණ යන සතර බියද සත්වා වලියේ ඇතුළත ඇති ලියවැලෙන් තෘෂ්ණාව ප්‍රකාශ වන අතර හංස පේළියෙන් තෘෂ්ණාව අතහැර පාරිශුද්ධිය කරා සත්වයා ගමන් කරන බවත් අනතුරුව ඇති මඳත් උස් වූ නෙළුම් මලින් බ්‍රහමාවාසයද අනතුරුව නිර්වාණයද සංකේතවත් වන බව මහදුරු පරණවිතානයන්ගේ මතයයි. මෙම විග්‍රහයට අනුව පැහැදිළි වන්නේ සඳකඩ පහණ හුදු පාපිස්සක් හෝ විසිතුරු කැටයමක් පමණක් නොව සත්වයාගේ ගමන් මග කෙලවර කළ යුතු අයුරු දක්වෙන ගැඹුරු ආගමික දර්ශනයක් ඇතුලත් කලා නිමවුමක් ලෙස හෙළ කලාකරුවා අතින් නිමවූ බවයි.

ලංකාවේ සඳකඩ පහණ අතර කලාත්මක සඳකඩ පහණ ලෙස හඳුනාගත හැක්කේ අනුරාධපුර බිසෝ මාළිගය ඉදිරිපිට ඇති සඳකඩ පහණයි. එමෙන්ම මහසෙන් මැදුර ඉදිරිපිට ඇති සඳකඩ පහණද කලාත්මක වේ. මෙම සඳකඩ පහණ් ගොන්නට අයත් අනෙක් සඳකඩ පහණ් අතර ශ්‍රී මහා බෝධීන් වහන්සේට උතුරු දොරටුවේ සඳකඩ පහණ රුවන්වැලි සෑයටත් බසවක්කුලමටත් අතර ඇති සඳකඩ පහණ ථූපාරාමයේ දළදා මාළිගය ඉදිරිපිට සඳකඩ පහණ ඉතාම වැදගත් වේ. මහඳුරු පරණවිතානයන් තම විග්‍රහයන් ඉදිරිපත් කළේ මෙම සඳකඩ පහණ් ඇසුරු කරගනිමින්ය.

අනුරපුර සඳකඩ පහණ් අතුරින් වැඩිම ප්‍රමාණයක් පිළිම ගෙවල්වලට පිවිසෙන පියගැට පෙළ පාමුල යොදා ඇති අතර සෙසු සඳකඩ පහණ් දක්නට ලැබෙන්නේ චෛත්‍ය මලුවට පිවිසෙන ස්ථානවලය. සමස්ථයක් වශයෙන් ගත් කළ අනුරපුර සඳකඩ පහණ ඉතාමත් චාම් සරල ස්වභාවයක් උසුලයි. කැටයමින් පිරුණු ඉතා විශිෂ්ඨ ඝණයේ නිර්මාණ ලෙස සැළකෙයි.

පොළොන්නරු යුගයේ සඳකඩ පහණ් ද විශේෂතා කිහිපයකින් යුක්ත වේ. මෙම යුගයේ සඳකඩ පහණ අනුරපුරට වඩා මඳක් වෙනස්ව නිමවා ඇත. එවකට සමාජයේ ඇති වූ යම් යම් බලපෑම් කලාත්මක නිර්මාණ කෙරෙහිද සෘජු ලෙස බලපා ඇති බව මෙම යුගයේ සඳකඩ පහණ් පිළිබඳව අධ්‍යනය කිරීමේදී මනාව පැහැදිලි වේ. නිදසුන් ලෙස හින්දු ආගමේ බලපෑම මත මෙම යුගයේ සඳකඩ පහන් වලිණ් ගවයාගේ රූපය ඉවත්ව ඇත. හින්දු ආගමට අනුව ශිව දෙවියන්ගේ වාහනය ලෙස සළකනුයේ ගවයාය. එබැවින් පයට පෑගෙන ස්ථානයක ගවයා නිර්මාණය කිරීම නුසුදුසු බැවින් එසේ කළ බව විචාරක මතයයි. මෙම යුගයේ සඳකඩ පහණ් වලින් ඇතැම් තැනක සිංහරූපයද ඉවත්ව ඇත. මේ පිළිබඳව හේතුවක් හඳුනාගත නොහැක.

15 පිටුවට.....

මුදිත බණ්ඩර රත්නායක

# දැහැමිව ධනය උපයාගෙන සතුටු වෙමු



ධාර්මික ලෙස ධනය උපයාගැනීම පිළිබඳව බුදුදහමෙහි කරුණු රාශියක් දක්වා තිබේ. සිඟාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, මංගල සූත්‍රය, පතතකමම සූත්‍රය ප්‍රධාන තැනක් ගන්නා සූත්‍රවේ. උපන්නා වූ සෑම මිනිසෙකුටම ජීවත්වීම සඳහා ධනය අවශ්‍ය වේ. එම ධනය නිරායාසයෙන් ලැබෙන්නේ නැත. උත්සාහවන්තව උපයාගත යුතුව ඇත. රැකියාවක් තෝරා ගැනීමේදී ''මංගල සූත්‍රයෙහි'' දක්වා ඇත්තේ ''අනවජ්ජානි කමමානි'' යනුවෙනි. එම සූත්‍ර දේශනාවන්ට අනුව නිවැරදි කර්මාන්ත පහක් ගැන සඳහන් වෙයි.

- ❖ කෘෂි කර්මාන්තය
- ❖ වෙළඳාම
- ❖ ගව පාලනය
- ❖ රාජ්‍ය සේවය
- ❖ ශිල්ප කර්මාන්ත (ඉගැන්වීම්)

ආදි මිනිස් වර්ගයාගේ ''ජීවනෝපායක්'' ලෙසට කෘෂිකර්මාන්තය පැවැති බවට ප්‍රාග් බෞද්ධ යුගවලට පවා සාධක හමු වී තිබේ. ආදි මිනිස් වර්ගයා ජීවත්වී තිබෙන්නේ ගංගා, ඇළ, දොළවල් ආශ්‍රිතවය. එයට ප්‍රධාන හේතුව නම් ජලය ලබාගෙන කෘෂිකර්මාන්තය (ගොවි) සිදුකිරීමය. ලංකාව, ඉන්දියාව වැනි රටවල විසූ ආදි මිනිස් වර්ගයා මෙලෙස කෘෂිකර්මාන්තයෙන් තම ඉතිහාසගත තොරතුරුවලින් පැහැදිලි වෙයි. ක්‍රි.පූ.06වන සියවසේ ඇතැම් රජවරු (භාරත) තම නම මුලට ''ඕදන'' යන වචනය යොදාගෙන තිබුණු බව අමිතෝදන, සුද්ධෝදන යන රාජකීය නම් භාවිත කිරීමෙන් පැහැදිලි වෙයි.

කෘෂිකර්මාන්තයට සමාජයේ තිබූ ස්ථානය කොතරම් උසස් ද යන්න එමගින් පැහැදිලි වෙයි. කෘෂිකර්මාන්තයට සමාජයේ තිබූ ස්ථානය කොතරම් උසස් ද යන්න එමගින් පැහැදිලි වෙයි. මිනිසාගේ ජීවනෝපායක් ලෙසට බුදුරජාණන් වහන්සේ එසේ වදාළේ පාරම්පරිකව පැවතගෙන ආ නිසාවිය හැකිය. වෙළෙඳාම් කිරීමද පුරාණයේ සිට පැවතගෙන බව ''සේරිවාණිජ'' කථා පුවතින් පෙන්නුම් කෙරේ.

ජාතක කථාවස්තුවල ද වෙළඳාම පිළිබඳ තොරතුරු සඳහන් හුවමාරු කරගැනීම මුල් කාලයේදී සිදුවිය. පසුව එය ධන උපයන ක්‍රමයකට පරිවර්තනය වී තිබේ. තරාදි භාවිතයෙන් භාණ්ඩ මැනීම සිදුවෙන අතර එය නිවැරදිව සිදුකළ යුතුබව බුදුදහමෙන් පෙන්වාදී තිබේ. අධාර්මික වෙළෙඳාම මිනිසාගේ මෙලොව, පරලොව දුකට හේතුවෙන බව දේශනාවේ විස්තර වෙයි.

රාජ්‍ය සේවයද ජීවන මාර්ගයක් ලෙසට පුරාණයේ සිට පැවත එන්නකි. රජුට සේවය කිරීම (පාලකයින්ට) මෙයින් අදහස් කෙරේ. ජනතාවට සේවය කරන රාජ්‍ය සේවකයා තමන්ගෙ සේවය නිසි ලෙස ඉටුකළ යුතුවේ. රාජ්‍ය සේවය අල්ලසට ලබාදීම නොකළ යුතු බව අවධානය කෙරේ. විනිවිද බවකින් තම රාජකාරි කටයුතු සිදුකිරීම ප්‍රසාදයට හේතුවන්නකි.

රාජ්‍ය සේවය මැනවින් ඉටුකළ අයට රාජ්‍ය සම්මාන ගම්වර ලබාදුන් බව ඓතිහාසික තොරතුරුවල සඳහන් වෙයි.ශිල්ප ඉගැන්වීමත් රැකියාවක් වශයෙන් පුරණයේ සිට පැවතිබවට සාධක තිබේ. පුරාණයේ පැවතියේ ගුරු ගෙදරට'' ගොස් ශිල්පය ලබාගැනීමයි. එහිදී ගුරුවරයා තමා දන්නා ශිල්පය අඩුවක් නොකොට (ගුරු මුෂ්ටිය) ඉගැන්වීම සිදුකර තිබේ. ගුරු පඬුරු ලබාදීම ශිල්පය හදාරන සිසුන්ගෙන් සිදුවේ. මේ ක්‍රමයට තම ගුරු වෘත්තිය ඉටුකිරීම ප්‍රසංසාවට හේතුවිය. ගුරු වෘත්තිය නිවැරදිව පැවැත්වීම ජන සමාජයේ ගෞරවාදරයට පාත්‍රවන්නකි.

වෙළඳාම (වාණිජ්ජා) සිදුකිරීමට අපේක්ෂා කරන අය විසින් නොකළ යුතු වෙළදාම් පහක් ගැන බුදු දහමෙහි දක්වා තිබේ.

1.අවි ආයුධ වෙළදම
2.සත්ත්ව වෙළදම
3.මස් වෙළදම
4.වස විස වෙළදම
5.මත් ද්‍රව්‍ය වෙළදම යනුවෙනි.

මෙම වෙළදම යෙදෙන ඇතැම් පුද්ගලයින් ඉක්මනින් ධනවතුන් බවට පත්වීම සඳහා උත්සාහ දරති. ධනවතුන් බවට පත්වූයේ ඒවා තාවකාලික වේ. නිවැරදි ලෙස ධනය උපයන තැනැත්තා සැප හතරකම හිමිකම් ලබන බව බුදු දහමෙහි සඳහන් වේ.ඒවානම්

- අත්ථි සුඛ
- භෝග සුඛ
- අනණ සුඛ
- අනවජ්ජ සුඛ යනුවෙනි.

නිවැරදි ලෙස උපයාගත් ධනය තමා සතුව ඇතැයි සිතා ඇති කරගන්නා සතුටයි. තමාට භවබෝග සම්පත් ඇතැයි සිතමින් සතුටක් උපදවා ගනී. තම ජීවිතය තුළ කිසිවෙකුටත් ණයක් නැතැයි සිතා ඇති කරගන්නා සතුට කාය කර්ම, වචී කර්ම, මනෝ කර්මයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් ලබා ගන්නා සතුට අවනවජ්ජ සුඛය වේ.

තමන් උපයන ධනය කොටස් හතරකට බෙදාගෙන එක් කොටසක් එදිනෙදා ආහාර පිණිසද කොටස් දෙකක් කර්මාන්ත සඳහාද හතරවන කොටස අවශ්‍ය විටකදී ප්‍රයෝජන ගැනීමට ද යෙදිය යුතුබව බුදු දහමෙහි පෙන්වා දී තිබේ.

දියුණුවට හේතුවන කරුණු මොනවාදැයි දිනක් දීඝජානු කෝලිය පුත්‍රයා බුදුරජාණන් වහන්සේගෙන් විමසූ විට දේශනා කළේ । උට්ඨාන සම්පද (උත්සාහයෙන් කටයුතු කිරීම) තම ධනයත් ජීවිතයත් රැකෙන පරිදි ක්‍රියාකිරීම (ආරක්ඛ සම්පද) කළ්‍යාණ මිත්තතා (කළ්‍යාණ මිතුරන් ඇසුරු කිරීම) සම ජීවිකථා (අය/වැය සමව පවතින සේ ජීවත්වීම) වර්තමාන සමාජය දෙස බලනවිට මෙම කරුණු සතරෙන්ම යුක්ත අය ඉතා අඩුය. බොහෝ දෙනෙක් අද ජීවත් වන්නේ එදිනෙදා ජීවිතයට පැලැස්තර ලබා දෙමිනි. බුදු දහමෙහි පෙන්වාදෙන ඉහත සඳහන් කරුණු මනා ලෙස අවබෝධ කරගෙන ජීවිතය ගත කරයි නම් එබඳු තැනැත්තාගේ ජීවිත මෙලොව මෙන්ම පරලොව ද සාර්ථක වෙන බව දැක්වේ. ඒ සඳහා ප්‍රඥාවන්තව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

**විජයවර්ධන තලවත්තේගෙදර**

## දිවිමග නිවැරදි කරන දහම් ඔවදනක්

බෞද්ධයාගේ දහම් අත්පොත වශයෙන් සැළකෙන ධම්මපදයෙන් උපුටාගත් ගාථා කිහිපයක් මෙසේ දැක්වේ.

''අක්කොච්පි මං අවධිමං
අජිනිමං අහාසි මෙ
යෙ තං උපනයිහනති
වේරං තෙසං නසමමති'' (යමකවගගය)

අර්ථය:- අසවලා මට බැන්නේය. මට පහර දුන්නේය. මා පැරද වූයේය. මා ෂතු දේ පැහැර ගත්තේය. යනුවෙන් යමෙකු නැවත නැවත සිතමින් වෛර බඳිත්ද, එවිට ඔවුන්ගේ වෛරය නොසන් සිඳේ.

''නතං කමමං කතං සාධු
යං කත්වා අනුතපපති
යසස අසසුමුඛො රොදං
විපාකං පටි සෙවති'' (බාල වගගය)

අර්ථය:- යමෙකුට යම් ක්‍රියාවක් සිදුකිරීමෙන් පසු තැවෙන්නට සිදුවේද එහි විපාකය කඳුළු පිරි දෙනතින් යුතුව දුක් විදින්නට සිදුවේද එබඳු දේවල් නොකිරීම ඉතා හොඳය.

''තංච කමමං කතං සාධු
යං කත්වා නානු තලලති
යසස පතිතො සුම නො
විපාකං පටි සෙවති'' (බාල වගගය)

අර්ථය:-යම් ක්‍රියාවක් සිදු කිරීමෙන් පසු තැවීමත් සිදු නොවේද එහි විපාකය සොම්නසින් යුතුව විදිය හැකිවේද එබඳු ක්‍රියාවල යෙදීම හොඳය.

**විජය**


ථෙරී ගාථා ඇසුරෙන්...
භද්‍රා කුණ්ඩලකේශී
සැකසුම හා චිත්‍ර
3
...තව දින දෙකකින් මොහුගේ හිස ගසා මරා දැමීමට නියම කරමි.. එතෙක් මොහු මේ.. වීදි දිගේ රැගෙන ගොස්.. ගෙයි දමනු....
..එමෙන්ම... මොහුව මරා දමන බව දන්වා මුළු රට.. පුරාම... අණ බෙර කරුවන්.. පිටත්කර හරිනු...
අසව්.. අසව්. බරපතළ සොරකමක් කර හසුවූ පුරෝහිත පුත් සත්තුකව තව දින දෙකකින් හිස ගසා.. මරා දමනු ඇත.
ඩං ඩං.. ඩං.
ඕහ්.. අසව්.. අණබෙර කරු.. කියනදේ.. දැන් බය සත්තුකව වීදි දිගේ අරගෙන එයි.. හැමෝටම පේනීන..
අහෝ... පුරෝහිත තුමාගෙ පුතුයා.. මෙතරම්.. සිටු සම්පත් තිබිලත් ඇයි මොහු.. මෙවන් සොරකමකට පෙළඹුනේ....
කරුමෙ තමයි
රාජ අණ පරිදි හිස ගසා මරා දැමීමට නියම වූ සත්තුකව.. වද බෙර හඬින් සෙබළුන් විසින් රජගහ නුවර වීදි දිගේ රැගෙන යමින් සිටියා.....
ඩං.. ඩං..
...ඩං... ඩං... ඩුම.. ඩුම..
ඕ




# තම දියණියට ජීවිතයේ අපූර්වත්වය කියාදෙන පියෙකුගේ හෘදස්පන්දනය කියැවෙන ගීතයක්........

දහවල පමණක් නොවේ ඇතැම් විට අප රාත්‍රියද නිදිවර්ජිතව පහන් කරමු. එහෙත් සැබවින්ම අප සිටින්නේ අවධියෙන්ද?

අප වටා පවතින ලෝකය සැප සම්පතින් පිරී ඇත. ඇඟිලි තුඩු මෙහෙයවමින් අපට ක්ෂණයෙන්ම අන්තර්ජාලය හරහා ලොව වටා සැරිසරන්නට පුළුවන. බොත්තමක් එබූ සැනින් මහල් තිහක ගොඩනැගිල්ලක ඉහළ මාළයට ගමන් කරන්නට අපට පුළුවන. ගගන ගාමීහු පෘථිවිය හා සමාන තවත් ග්‍රහලොවක ජනපද බිහි කරන්නට සිහින මවති. මේ තාක්ෂණික විප්ලවය මැද අප සිටින්නේ අවධියෙන්ද?

කාර්මීකරණය තුළ මිනිසා කාර්මික මිනිසෙකුව" ඇති බව ටොම් බර්න් පවසයි. මින් හැඟෙන්නේ තාක්ෂණිකව දියුණු වන්නට වන්නට මිනිසා යන්ත්‍රයක් බවට පත්වන බව නොවේද? යාන්ත්‍රිකරණය වූ සමාජයක් දිවිගෙවන මිනිසාට අවධි වූ මනසක් කොයින්ද? ඔහු හුදු යන්ත්‍රයක්ම පමණි. ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම්ද යාන්ත්‍රීකරණය වී අවසන්ය. වහල් යුගය අවසන් වූවද මිනිසා යාන්ත්‍රීකරණය තුළ වහලෙකු වී ඇත. යම් කිසි රටාවකට සකස් කරන ලද යාන්ත්‍රික ක්‍රියාවලියක නිරතවන මිනිසාගේ තාර්කික බුද්ධිය, සංවේදී බව, මානුෂීය හැඟීම් නිද්‍රෝප ගතවී ඇත. එනිසා අප දෙනෙත් හැරගෙන නින්දේ පසුවෙමු.

යාන්ත්‍රිකරණ ජීවිත රටාවේ නින්ද්‍රෝපගත මනසින් කටයුතු කරන්නාවූ අප විඳිය යුතු ජීවිතය විඳවමින් සිටින්නෙමු. රත්න ශ්‍රී විජේසිංහයන් අප අමතන්නේ විඳවන්නාවූ නිද්‍රෝපගත ජීවිතයෙන් මිදී යළිත් අවධිවන්නටය.

ඇතැම් විට ජීවිතයේ සොඳුරු බව අපට දැනෙන්නේ විශ්‍රාමික සුවයෙන් පසුවන විටය. එහෙත් පරිසරයේ සුන්දරත්වය විඳින්නට සොඳුරු තැන් සොයා යන්නට කායික දුර්වලතා බාධාවක් වේ. ජීවිතයේ සුන්දරත්වය හොඳින්ම වින්දනය කළ හැක්කේ තාරුණ්‍යයේ හා ළමා අවධියේ පසුවන්නන්ටය.

එහෙත් දෙමාපියන්ගේ අනාගත සිහින රාජ්‍ය අභිශේක දරන්නට ඔවුන්ටද අධිඅවේගී ගමනක යෙදෙන්නට සිදුව තිබේ. එනිසාම නින්ද්‍රෝපගත යාන්ත්‍රික ජීවිතය තුළ තමාගේ සොඳුරුතම කාලයද ඔවුන් ගෙවන්නේ වෙහෙසට පීඩාවට පත් වෙමිනි.

මේ මොහොත මනස යළි අවධි කරන්නට සුදුසුම කාලයයි. චිත්ත පීඩාවන්, වෙහෙස ආදිය පසෙකලා ජීවිතය දෙස බලන්නට දොර හැරිය යුතු කාලයයි.

ගාමිණී කුමාර විතානයන් ගේ සිත් පහන් වේවා" කෘතියෙහි ඇමරිකානු ස්වදේශික චිනුක් ගෝත්‍රික ආශිර්වාද යාඥාවක් මෙසේ සඳහන් වේ.

''අප කතා කරමු වන අරනට
සව්මත්ව අහසට නැගෙන මහා වනස්පතියනට
මුල්, පොළෝ ගැඹුරෙහි වුව
අතු පතර දෙව් ලොවයි
ෆර් - පයින් සිඩාර් - මහා වනස්පතියනි
අප ඔවුන් විමසමු
උගත් වනු මැන අපට
මඟ කියා දෙනු මැනව''

මගේ දුවේ ඔබ අවදියෙන් නම්
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මේ මිහිරි දේවල් දූ

සේපාලිකා මල් බිමට බැහැලා
ඇවිදින්න යන වෙලාවයි
නිල් තාරකා බිම බලාගෙන
වැව් දියට පෙම් බැඳි වෙලාවයි
මේ පොළව කොතරම් සුන්දරද
මගේ දූ තනියම හිනාවෙයි

සණ කළුවරට අප පෙම් කළොත්
ඉර හඳ තරුවලට ණය ගැතියි
ලොව දුන්නු දේවල් අද අපට
හෙට ලොවට පෙරළා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
මුළු ලොවම ඔබටත් ආදරෙයි.

ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ
සංගීතය හා තනුව - රෝහණ වීරසිංහ
ගායනය - කරුණාරත්න දිවුල්ගනේ



සයුර හා වන පියස්
කෙත් බිම්හිසරණ
හැම සතුන් ගෙන්
වෘකයන් - මුවන් -
රාජාලි -
කොබෙයියන් මහා
තල්මසුන් -
මුල්ලන් - රමණීය
මාරක තල්මසුන්
සහ සැමන්
මසුන්ගෙන් වයඹ
වාසී අප සමඟ
ජීවත්ව කල් ගෙවන
අප ඔවුන් විමසමු.
උගැන්වුව මැන
අපට මඟ කියා
දෙනු මැනව
තාරකා, සඳ මඬල,
සූර්යයා රිද්මය සහ
ජීවිතයේ සෘතූන්
පාලනය කරනා
අපූර්ව හා ශ්‍රේෂ්ඨ





විශ්වයේ
කොටස
ක් බව
අප
සිහිපත්
කර
දෙවනා
උගැන්වූ
අප ඔවුන් විමසමු
ව මැන අප හට මඟ කියා දෙනු මැනව

මිනිසා මේ විශ්වයේම එක කොටසක් පමණි. සත්ව වර්ග තුළ වර්ගීකරණයට ලක්වන එක්තරා සත්ව වර්ගයක් පමණි. එහෙත් අපට ඒ බව අමතකය. මුළු විශ්වයම තමාගේ යැයි සිතමින් විශ්වය දිනන්නට වෙරදරන මිනිසා තම කෙටි ජීවිතය නිම කරනුයේ සංතෘප්ත නොවූ මනසකිනි. තම ජීවිතයේ අරුත තමා වටහා නොගත් බව තමා පසක් කරනුයේ අවසන් මොහොතේය.

සොබා දහමේ කොටසක් වන මිනිසාට සොබා දහමෙන් වියුක්තව ජීවත් විය නොහැක. කෘතිම පරිසරය තුළදී මිනිසා කියිකවත් මානසිකවත් පීඩාවට පත්වන්නේ එහෙයිනි. කලාව, සංවේදීත්වයද ඔහු උපතින්ම උරුම කරගත් දේය. ජීවත්වීමේ කලාව තුළ ඇත්තේද සොබා සෞන්දර්ය ජීවිතය හා කලාව වින්දනය කරමින් ආතතියෙන් තොරව ගමන් කරන ආකාරයයි. පෘථිවිව මත මැවෙන සුන්දරත්වය හදවතින්ම විඳිමින් ජීවිත ගමන වින්දනාත්මක එකක් කරගන්නට රත්න ශ්‍රී අපට ඇරයුම් කරයි.

මලට හානියක් නොකර මලෙන් රෝන් ගන්නා බඹරෙකු සේ ජනතාව නොපෙලා අයබදු එකතු කරගත යුතු බව බුදු දහමේ සඳහන් වේ. පෘථිවියටත් පෘථිවිවාසී සහෝදර ජීවින්ටත් හානි නොකර මල් නොතලා මල් පැනි බොන බඹරුන්සේ සම්පත් පරිභෝජනය කරන්නට අප හුරු විය යුතුය. අද අප භුක්ති විඳින්නාවූ සියල්ල අනාගත පරම්පරාවෙන් ණයට ඉල්ලා ගත් දේය. දකුණු ඇමරිකානු චිනුක් යාඥාව අවසන් වන්නේ මෙලෙසිනි.

"මිහිතලය මත දිවි ගෙවන හැමෝගෙම
අපේ මී මුතුන් සහ නෑ මිතුරන්ගෙන්
අනාගත පරපුර ගැන සුබ සිහින දකින්නන්ගෙන්
ඔවුන් ජීවිත හා අපේ ජීවිත තැනූ අයගෙන්
ස්තූති පූර්වකව කෘතවේදීව
අප ඔවුන් විමසමු
උගත් වූව මැන අපට
මඟ කියා දෙනු මැනව
අන්තිම මට............
අප දරාසිටින
ඉමහත් ශුද්ධ හා පවිත්‍ර
ආදරයේ හා සත්‍යයේ - මහා ආත්ම බලය
නියොජනය කරන
සකල විශ්වය පුරා ගලන..........
අප සමඟ පවතින
අප ඔවුන් විමසමු
උගැන්වුව මැන අපට
මඟ කියා දෙනු මැන අපට

ශිෂ්ට යැයි සම්මත මිනිසුන් ගහ, කොළ, සතා සීපාවා විනාශ කරමින් පෘථිවිය තම අණසකට ගන්නට වෙර දරති. අනෙකුත් ජීවින්ගේ ජීවත් වීමේ අයිතිය සොරා ගනිමින් ඔවුන් සතු බිම් කඩට තම වර්ගයා සමඟින්ම සටන් වදිති. එහෙත් අශිෂ්ට වනචාරීහු මිහිමවගේ දරුවන්ව තමා මිහිමත දිවි ගෙවන අනෙකුත් ජීවීන් ගහා කොළ ගංඟා සහොදරත්වයෙන් සලකති. එසේ නම් ම්ලේච්ඡයින් වන්නේ ශිෂ්ට යැයි පවසන අපමය. සියැටල් වැනි රතු ඉන්දියානුවන් හා අනෙකුත් ගෝත්‍රිකයන් සොබා දහමේ දරුවන්ව ජීවිතය මැනවින් වින්දනය කළහ. ඔවුහු අවධිවූ මනසකින් දිවි ගෙවන සැබෑ බුද්ධිමතුන් වෙති.


අපගේ අධිවේගී යාන්ත්‍රික දිවි පෙවෙත නවතා සොබා දහමට කලාවට අනුගත වෙමින් ජීවිතයේ සාරය සොයා යන්නට රත්න ශ්‍රී අප පොළඹවයි.

සොබා දහමේ සුන්දරත්වයත් කලාවත් එක්වූ විට මැවෙන්නේ අපූර්ව සුන්දරත්වයකි. රාත්‍රිය සුවඳවත් කරන සේපාලිකා මල් බිම විසිරී තිබේ. රත්න ශ්‍රී දකින්නේ සේපාලිකා රාත්‍රියේ සුන්දරත්වය දකින්නට ඇවිද යන අයුරිනි. තාරකාවල ආලෝකය දිය මත වැටී ඇති අයුරු පෙනෙන්නේ ඔවු නොවුන් ළංවී පෙම් බස් දොඩන පෙම්වතුන් ලෙසිනි. මේ සියලු සොබාදහමේ සුන්දරත්වයටත් අපට ජීවිතය ලබා දුන් අයව ජීවත් කරන මිහි මවට අප ස්තූති පූර්වක විය යුතුය. අප අද භාවිතා කරන සම්පත් හෙට ලොවට පෙරලා දිය යුතුය. මිනිසුන් සතුන් හා පරිසරය සමඟ හෘදයාංගවම බැඳී දිවි ගෙවිය යුතුය. අවධි මනසකින් ජීවිතය වින්දනය කළ හැක්කේ එවිටය. රත්න ශ්‍රී අපට දෙන උපදේශය දූ දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද පොදුය.

තම දියණියට ජීවිතයේ අපූර්වත්වය වටහා දෙන පියෙකුගේ ස්වරූපයෙන් ගීතය ලියවී ඇති නිසා මේ පද පෙළ හෘදයාංගවම අපට දැනෙයි. කරුණාරත්න දිවුල්ගනේගේ හඬ පියෙකුගේ ස්වරයෙන් අප හදවතට සමීප වෙයි. රෝහණ වීරසිංහ නම් සෞන්දර්යය වේදියාගේ සංගීතය හා තනුව රත්න ශ්‍රීගේ අරමුණ සාක්ෂාත් කර ඇත.

චාමිකා ජනානි ද සිල්වා

# සත් ගුණ යුත් සතන් හට වැඩ කළොත් සරු අත් පිට දියුණුවම පළදේය නිරතුරු



අවුරුද්දක් ගෙවී නව අවුරුද්දක් ලබා මේ අපි ගෙවන්නේ අලුත් අවුරුද්දක අලුත් මාසයකි. අවුරුද්දේ පළමු මාසයයි. සිංහල බෞද්ධ හදවත් තුළ සැමදා ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය පහව ගොස් මෙත් මල් පිපී තිබේ නම් කොතරම් සුන්දර බවට මේ රට පත්වනු ඇද්ද? මේ මාසයේ අපි ගෙවුනු වසර දෙස ආපසු හැරී බලමු.

අපි ආශ්‍රය කළේ කවුරුන් ද? ජීවත් වූයේ කෙසේද? අපේ හැසිරීම අනුන්ටත් තමන්ටත් යහපතක් වූයේද? යන්න පිළිබඳව මඳක් සිතා බලමු. ඉන් පසුව අප ආශ්‍රය කළ යුත්තේ කවුද? ආශ්‍රය කළයුත්තේ කෙසේද? ඒ ඇසුර මේ අවුරුද්දේ තමන්ටත් අන්අයටත් යහපතක් වන ලෙසින් සකසාගන්නේ කෙසේද? යන්න විමසා බලමු. ඒ නිසාම අපි ඇසුරු කළ යුතු සත්පුරුෂයන් ගැනත් ඇසුරු නොකළ යුතු අසත්පුරුෂයන් ගැනත් මඳක් විමසා බලමු.

මේ ලිපියට මාතෘකාව ලෙසින් මා ලබාගත්තේ

**"අලගියවන්න මුඛවැටි කිවිඳුන් විසින් රචිත සුභාෂිතය නම් ග්‍රන්ථයේ සඳහන් වන කවියක කොටසකි."**

එය මෙසේ අප හඳුනාගනිමු.

**"සත් ගුණ යුත් සතන් හට වැඩ කළොත් සරු**
**අන් පිට දියුණුවම පලදේය නිරතුරු**
**වන් කළ දිය නෙරළු තුරුමුලට පියකරු**
**දෙන් මුදුනින් පල රුස රැගෙන අමයුරු"**

මෙයින් පැවසෙන්නේ සත්පුරුෂ ගුණයෙන් යුක්ත වූ සත්වයන්හට යහපතක් කළහොත් නිතරම එය දෙගුණ කොට අන්පිටටම විපාක දෙන බවත් එය හරියට පොල් ගස්වල මුලට වක්කරන ජලය හැරගෙන එම ගස්වලින් අමෘතයක් වැනි එල සමූහය මුදුනින් ලබා දෙන්නක් වැනි බවයි.

මේ අන්දමට අපි ඇසුරුකරන පුද්ගලයන් සත් පුරුෂයන් නම් අපිට ඔවුන්ගෙන් පෙරලා උපකාර ලැබෙයි. පුද්ගලයාට උදව් උපකාර කරන්නේ ඔවුන්ගෙන් පෙරලා උපකාර ගැනීමේ බලාපොරොත්තු ඇතිවම නොවන බවත් සිහි කොට යුතුයි. නමුත් ඇසුරු කරන පුද්ගලයාගේ ලක්ෂණ කෙබඳු දැයි හඳුනාගෙන අපි ඇසුරු කළ යුතුය. බුදුන්වහන්සේ අපට දේශනා කර තිබෙන

**"මාතා පෙත්ති භරං ජන්තු**
**කුලෙ ජෙට්ඨා පචායිනං**
**සනහං සඛිල සම්භාසං**
**පෙසුනෙය්‍යපපහායිනං**
**මච්චේර විනයෙ යුත්තං**
**සච්චං කොධාභිභූං නරං**
**නංවේ දෙවා තාවතිංසා**
**ආහුසප්පුරිසො ඉති"**

යන බුදුවදනට අනුව සත්පුරුෂයාගේ ලක්ෂණ මෙහි සඳහන් කර ඇත. එයට අනුව දෙමාපියන් පෝෂණය කිරීම, කුල දෙටුවන් පිදීම, ක්‍රෝධ නොකිරීම, ප්‍රිය වචන කථා කිරීම, කෙලෙස් මසුරුගති අත්හැරීම සහ සත්‍යය වචන කථා කිරීම සත් පුරුෂයාගේ ලක්ෂණ වෙයි. එබඳු සත්පුරුෂ අයට දෙවියන් පවා ප්‍රිය කරති. අපි කවුරුන් වැදුම් පිදුම් ලැබීමට හෝ කීර්ති ප්‍රසංසා ලැබීමට ඉතා ප්‍රිය කරන්නෙමු. නමුත් එයින් ඉතා හොඳින් කැපී පෙනෙන්නේ සත් පුරුෂ පුද්ගලයන්ය. ඔවුන් කීර්ති, ප්‍රසංසා, ගෞරවය ආදිය ඉබේම ඔවුන් වෙත ඇදී එයි. ඒ ඔහුගේ සත් ගුණයන් නිසාය. ඔවුන්ට දෙවියන් පවා වැදුම් පිදුම් කරයි. දෙවියන් පවා මනුලොවට වඳින බව

**"යේ ගහට්ඨා පුඤ්ඤකරා**
**සීලවන්තා උපාසකා**
**ධම්මේන දාරං පෝසෙන්ති තං**
**නමස්සාමි මාතලී"**

යනුවෙන් පෙන්වා දෙයි. මෙය මාතලී නම් සක් දෙවිඳුගේ රථාචාර්යයා සක්දෙවිඳුගෙන් ඇසූ පැනයකට පිළිතුරු වශයෙන් සක් දෙවියන් ඔහුට දුන් පිළිතුරයි. ඇසූ පැනය නම් "මනුලොව දෙසට හැරී ඔබ වහන්සේ වඳින්නේ කාටද යන්නයි" එයට පිළිතුර ඉහත ගාථාවයි. එහි සඳහන් වන්නේ පුණ්‍යවන්ත වූ සිල්වත් උපාසකවන්ටද ධර්මයෙන් පෝෂණය වූ මිනිසුන්ටද සක්දෙවියන් නමස්කාර කරන බවයි. මෙසේ දෙවියන් පවා ප්‍රිය කරන සත් පුරුෂ උතුමන් අද සමාජයේ තරමක් දුෂ්කරය.

අද දෙමාපියන්ට සැළකීම, සත්‍ය කථා කිරීම, කුලදෙටුවන් පිදීම, මසුරුමල දුරු කිරීම ආදී සත් පුරුෂ ලක්ෂණ ලෙස පෙන්වා දුන්නත් සමාජයේ බොහෝ දෙනෙක් මමත්වය පදනම් කරගෙන ඉතා ආත්මාරථකාමීව ජීවත් වෙති. තමන් අද සිටින තත්වයට ගෙන ආ ආදරණීය දෙමාපියන් පවා අමතක කර දමන, බොරුව, මසුරුකම රජයන සමාජයකට අපේ බෞද්ධයන් ඇදෙමින් සිටින බව කණගාටුවෙන් වුවද ප්‍රකාශ කළ යුත්තකි. බොහෝ දෙනෙක් මෙය කථා බහට ලක් කරන විට පවසන කරුණක් නම් අද කාලයේ බොරුවෙන් වංචාවෙන් තොරව ජීවත් විය නොහැකි බවයි. නමුත් බුදු දහම කෙරෙහි පැහැදිළි අවබෝධයක් ඇති පුද්ගලයා යථාර්ථය අවබෝධ කරගනී. කොතරම් නින්දා අපහස, තාඩනපීඩන වලට ලක් වුවත් තමන්ටත් අනුන්ටත් දෙපිරිසටම යහපත සිදුවන දෙයට සත්පුරුෂයා කැමතිය. ඔහුගේ ගුණ සුවඳ කොතරම් හිරිහැරවලට ලක් කළත් එක ලෙස පවතී. මේ බව අපට සිහිගන්වන සුභාෂිත කවියා

**"අමිත ගුණ නුවණ යුත් උතුමෝ පබඳ**
**අනක වෙහෙස ලදුවත් නොම වෙති දුහඳ**
**දියත පතල සුවදැති සොඳ සඳුන් කඳ**
**සිඳින මඩින එක ලෙස පැමිණෙයි සුවඳ**

යනුවෙන් පවසයි. එහි පැවසෙන ආකාරයට "අප්‍රමාණ ගුණයෙන් හා නුවණින් යුත් උතුම් පුරුෂයෝ කෙරවලක් නැති හිරිහැරවලට පාත්‍ර වුවත් දුෂ්ඨ සිතක් ඇති කර නොගනී. දස දිසාවෙහි පැතිරුණු සුවඳින් යුත් යහපත් සඳුන් දණ්ඩ කපන විටත්, කුඩු කරන විටත් එක් විදියටම සුවඳ පැතිරී යන්නා සේ සත්පුරුෂයාද කොතරම් බාධා කම්කටොලු ආවත් එයින් නොසැලී තමාගේ ගුණය ලොවට පෙන්වන බවයි.

එමෙන්ම නුවණැති සත් පුරුෂයා පුද්ගලයාට යන්තම් හෝ යහපතක් කළොත් එය ගලෙහි කෙටූ අකුරක් මෙන් සදා පවතී. නමුත් අනුවණ පුද්ගලයාට කොතරම් විශාල අයහපතක් කළත් දියමතුපිට අඳින ලද ඉරක් සේ එය මැකීයන බවද සුභාෂිත කතුවරයා පෙන්වන්නේ,

**"නැණැති දනන් හට මද ගුණයක් කළද**
**පවතී ගල කෙටූ අකුරක් මෙන් නිබඳ**
**විමනි දනන් හට කළ නිති ගුණ නොමඳ**
**එය නැති වේය දිය පිට ඇඳි ඉරක් ලෙද"**

යනුවෙනි. මේ අන්දමට සත්පුරුෂයා හඳුනා ගන්නා සේම සත් පුරුෂ නොවන පුද්ගලයන් ගැනද අපි හදුනා ගනිමු. ගුණයෙන් හා නුවණින් යුක්ත නොවන පුද්ගලයාගේ ලක්ෂණද සුභාෂිත කතුවරයා මෙසේ පෙන්වා දෙයි.

15 පිටුවෙන්....

එස්.දිල්රුක්ෂි අබේකෝන්

# මල් සුවඳ වඩා දැනෙන සිල් සුවඳ



ලෝකයේ නොයෙක් සුවඳවත් මල් වර්ග තිබේ. එම සුවඳවත් මල් වලට අමතරව තවත් සුවඳ විලවුන් ඇතුළු සුවඳවත් ද්‍රව්‍ය හා නොයෙක් සුවඳ ලබා ගන්නා ක්‍රම ඇත. වූ අතර මල් සුවඳ සුභාවිකව ඇතිවී පැවතී නැති වී යයි. පිච්ච, රෝස, සේපාලිකා ආදී විවිධ සුවඳ වර්ගයෙන් යුක්ත මල් වර්ග මේ ලෝක ධාතුව තුළ පවතී. ඒවායේ සුවඳ කාලයක් තුල ඇතිවී නැතිවන අතර යම් දුර ප්‍රමාණයක් තුළ හඹා යනු ඇත. එනම් එම මල් ඇතුළු සුයළු සුවඳ වර්ග යමු සීමාවක් තුළ පවතින බව පැහැදිළිවේ.

බෞද්ධයාගේ අත් පොත වූ ධම්ම පදය තුළින් බුදුරජාණන් වහන්සේ මල් සුවඳක ඇති සීමාව හා සිල් සුවදෙහි ඇති අසීමිත බව දේශනා කොට ඇත. ධම්ම පදයෙහි පුෂ්ප වග්ගයෙහි සඳහන් 11, 12, 13 යන ගාථාත්‍රය කියවීමෙන් ඒ බව පැහැදිළි වේ.

"න පුපප ගනධො පටිවාතමේති
න චනදනං තගර මලලිකා වා
සතං ච ගනධො පටිවාතමෙති
සබ්බා දිසා සපපුරිසො පවාති"

(මල් සුවඳ සුළඟට නොහමනේය, සත් ගුණවතුන්ගේ සිල් සුවඳ උඩු සුළඟට ද හමනේය.)

"චනදනං තගරං වාපි
උපපලං අථ වසසි කී
එතෙසං ගනධ ජාතානං
සීල ගනධො අනුත්තරො"

(සඳුන් සුවඳ - මල් සුවඳ දෑ අතුරෙන් හටගැනෙන (නොඑක්) සුවඳට වඩා සිල් සුවඳ මැ ඉතා අගනේය.)

"අපප මතතො අයං ගනධො
යායං තගර චනදනී
යොච සීලවතං ගනධො
වාති දෙවෙසු උත්තමො"

(තුවරලා සඳුන් සුවඳ ඉතා සුලුය. සිල් වතුන්ගේ සිල් සුවඳ දෙවියන් අතර පවා පැතිරේ.)

සීලය යනු "කාය වාග් සමොධානං සීලං" ආදී වශයෙන් කය වචනය සංවර කර ගැනීමයි. සීලයෙහි වටිනා කම ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තරම් ප්‍රඥාවෙන් දුටුව හා ප්‍රායෝගික වශයෙන් ප්‍රගුණ කළ තවත් අයෙක් නැති තරම්ය. එමනිසාම උන් වහන්සේ සීලයට සුවිශේෂී ස්ථානයක් ලබා දී ඇත. තෙවරදෑරුම්පුණ්‍ය ක්‍රියා, දස පාරමිතා, දස රාජධර්ම යන ස්ථානයන්හි සීලය යන වචනය දෙවනි ස්ථානයෙහි තබා තිබේ. සප්ත විසුද්ධි වල පළමුව දක්වා ඇත්තේ සීලයයි. එයින් පැහැදිළි වන්නේ සීලය මොනතරම් පුද්ගලයා හා සම්බන්ධ වන මාතෘකාවක්ද යන වගයි.

බුදුරජාණන් වහන්සේ තරම් සිල් සුවඳින් අග්‍ර වූ උත්තමයෙක් තවත් නැති තරම්ය. උන් වහන්සේ තුන් ලෝකයටම අග්‍ර වූ සේක. උන් වහන්සේගේ සිල් ගුණය තුන් ලෝකයෙහිම පැතිර ගිය බව සඳහන් වේ. එම සිල් සුවඳට සමකළ හැකි සුගන්ධයක් තුන් ලෝකයෙහිම ඇත්තේද නැත. බුදු, පසේ බුදු, මහ රහත් නික්ලේසි උත්තමයන් වහන්සේලා සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාන යන උසස් ගුණයෙහි පිහිටා කටයුතු කළහ. ඒ අතර සිල් ගුණය ප්‍රධාන වේ.

සිල් ගුණයෙන් පිරිපුන් අයට මුළු ලෝකයාම වන්දනා මාන කරනු ඇත. ඒ බව පැහැදිළිවන තැනක් ලෙස සක්‍ර දේවේන්ද්‍රයාගේ වැඳීම හැඳින්විය හැකිය. දිනක් සක්‍ර දේවේන්ද්‍රයා මාතලී රථාචාර්ය වරයාත් සමඟ අහසින් ගමන් කරන විට සක්‍ර දේවේන්ද්‍රයා පොළොවට බැස වැඳ නමස්කාර කරන්නට විය. එවිට මාතලී රථාචාර්ය වරයා ප්‍රශ්න කරන්නේ ඔබ දෙවියන්ගේ නායකයා වෙලත් ඇයි මනුස්ස ලෝකයට වඳින්නේ කියාය. එවිට සක්‍ර දේවේන්ද්‍රයා,

"යෙ ගහට්ඨා පුඤ්ඤකරා
සීල වන්තා උපාසිකා
ධම්මේන ධාරං පොසෙන්ති
තං නමස්සාමි මාතලී"

යනුවෙන් මනුෂ්‍ය ලෝකයෙහි සමහරක් දෙනා ධාර්මික දිවි පෙවතක් ගත කරමින් අඹුදරුවන් පෝෂණය කරමින් සිල්වන්තව, ගුණවන්තව ජීවත් වනු ඇත. ඔවුන් සඳහා මෙම නමස්කාර කරමි යනුවෙනි.

සීලය යනුවෙන් හික්මීම, හැදියාව, සංවර බව ආදී වශයෙන් අර්ථ දැක්වීමට පුළුවන. හික්මීම නොමැති නම නිසා සමාජය තුළ නොයෙක් සපරාධී ක්‍රියා සිදුවේ. විනයක් ඇති සමාජයක හා විනයක් නැති සමාජයක වෙනස අපට පැහැදිළිව දැකගත හැකිය. මෙහිදී සිත, කය, වචනය යන ත්‍රිවිධද්වාරයෙහි හික්මීම ගත හැකිය. ධම්ම පදයේ චිත්ත වග්ගය තුළින් සිතේ අසංවර බව පෙන්වන බුදුහිමි නොහික්මුනු සිත කුළුම්මෙකුට සමාන කොට ඇත. ඒ තරමටම සීලයක් නැතිවීම භයානක බව පැහැදිළි කොට ඇත.

සිතින් අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ඨි යන වැරදිද කයින් සතුන් මැරීම, කාම මිත්‍යාචාරය යන වැරදි තුනද වචනයෙන් බොරු කිම, කේලම්කීම, නපුරු වචනකීම, හිස් වචන කීම යන වැරදි හතරද වැරදි දහය ත්‍රිවිධද්වාරයෙන් ස්දුවන දස අකුසල් ලෙස හැඳින්වේ. අසංවරකම, අ2සීලාචාරකම තුළ ඇතිවන්නේ ඉහතින් සඳහන් කළ වැරදි සහයයි. එම වැරදි කිසිවෙකු අනුමත නොකරනවා සේම සමාජ සංස්ථාවට ව්‍යසනයක්ද ගෙන දෙනු ඇත. එනිසා සිල්වත් වීම අවශ්‍ය වන්නේය. සිල්වත් වීම තුළීන් මුළු සමාජ පද්ධතියටම යහපතක් සිදුවනු නිසැකය.

සීලයෙහි ප්‍රභේද පිළිබඳ විමසා බැලීමේදී සීලයෙහි ඇති වටිනාකම පැහැදිළිවේ. ඒ අනුව සීලයෙහි කොටස් 04ක් පිළිබඳ කරුණු අනාවරණය වේ. එනම්,

1. ප්‍රාතිමෝක්ෂ සීලය
2. ඉන්ද්‍රිය සංවර සීලය
3. අජීව පාරසුද්ධ සීලය
4. ප්‍රත්‍ය නිශ්ශ්‍රිත සීලය

සීලයෙහි ප්‍රභේද වශයෙන් දැක්වූ මෙම කොටස් 4 සමස්ථයක් ලෙ කොටස් 7කට බෙදා දැක්වීමට පුළුවන. එනම්,

1. චාරිත්ත සීලය
2.වාරිත්‍ර සීලය
3. ආභිසමාචරික සීලය
4. ආදී බ්‍රහ්මචරියක සීලය
5. ලෞකික සීලය
6.අපාත කොටික සීලය
7. ලෝකෝත්තර සීලය

දිනක් බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණි එක්තරා දේවතාවෙක් උභ්‍යන්තරික බාහ්‍ය වූත් ක්ලේශ ජටාව නැති කළ යුත්තේ කෙසේදැයි ප්‍රශ්න කළේය. ඊට බුදුරජාණන් වහන්සේ මේ පිළිතුරු දුන්හ.

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤංච භාවයං
ආතාපි නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටං"

ඉහත ගාථා ධර්මයෙන් පැහැදිළි වන්නේ බෞද්ධ විමුක්ති මාර්ගයෙහි මූලිකම පදනම හීලය වන බවයි. ශිලය තුළින් පුද්ගලයාගේ ගමන් මාර්ගය නිවැරදි පැත්තට යොමු කරනු ඇත. ඕනෑම දරුණු පුද්ගලයෙක් සිල්වතෙක් වූ කල්හි මුළු මහත් සමාජයටම එහා ආනිසංස ලැබෙන බව අමුතුවෙන් කිවයුතු නොවේ. අංගුලිමාල වැනි දරුණු පුද්ගලයෙකු පැවිදි වීමත් සමඟ විශාල පිරිසකට සෙත ශාන්තිය සැලසුණි. දරුවන් බිහිකිරීමට සිටින මව්වරුන්ට ආශිර්වාදයක් උදෙස අංගුලිමාල පිරිත පවා දේශනා කරන්නට යෙදුනේ එම හේතුවෙනි. සිල්වත්වීමේදී ලැබෙන විපාක පිළිබඳවද දේශනා කර ඇත. එනම්,

1. මහත් වූ භොගස්කන්ධයක් ලැබීම.
2. කීර්තිය ඇතිවීම.
3. විසාරද බව.
4. මුලා නොවූ සිතින් මරණය පත්වීම.
5. මරණින් මතු සුගතිගාමී වීම.

සීලය තුළින් මුළු ලෝකයම සුවපත් වනු ඇත. සිත, කය, වචනය, යන තිදොරින්ම හික්මීම තුළින් කෙනෙකුගේ සීල ගුණය ඉස්මතු වේ. එය මුළු මහත් සත්වයාටම සැප පිණිස පවති. බුදුරජාණන් වහන්සේගේ සිල් සුවඳ මුළු විශ්වයටම පැතිරී ගිය බව අපි දනිමු. දෙවි දේවතාවුන්ගෙන් පවා වන්දනා මානයට ලක්වූයේ එම හේතුවෙනි.

අද සමාජයේද සිල්වත් ගූනවත් අය සිටිති. භික්ෂූන් වහන්සේලා ඇතුළු ගිහි බෞද්ධයන් සිල් සමාදන්ව එම සිල් සුවඳ ප්‍රදේශය පුරාම පතුරනු ඇත. පංච ශීලය, අෂ්ඨාංග සීලය, දස සීලය, ප්‍රාතිමෝක්ෂ සංවර සීලය ආදී දෙඅංශය තුළම සිල් රකින පිළිවෙත දක්වා ඇත. එම සිල් පද නිසා මුළු මහත් සමාජයටම සුවඳ දැනෙනු ඇත. මල් සුවඳට වඩා වෙත් සුවඳවත් දේවල් වලට වඩා සිල් සුවඳ හමා එන්නේ එම හේතුවෙනි. එමනිසා අප සැම කෙනෙක්ම සුවඳවත් මලක් සේ අරටුවක් ඇති ගසක් සේ බැබළෙන ආකාරයෙන් සිල්වත්ව ගුණවත්ව ජීවිතය පවත්වා ගෙන යමින් දුර්ලභව ලද මනුෂ්‍ය ජීවිතය අර්ථවත් කර ගනිමු.

**කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනෙහි ආචාර්ය ගලගෙදර රතනවංශ හිමි.**

## සිරිලක අතීත ශ්‍රී විභූතිය යළි ඇතිවන්නට නම්....



ඉන්දියන් සාගර කලාපයේ පිහිටා ඇති ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් ඇති විවිධ විරුදාවලියෙන් හඳුන්වා දී ඇති රමණීය දිවයිනකි. ඉන්දියන් සාගරයේ මුතු ඇටය රත්නදීප, විජයභූමි යනාදී වශයෙන් හැඳින්විනි. විවිධ ලේඛකයන්ගේ වර්ණනාවට පාත්‍ර වූ මෙම දිවයින මධ්‍යම කඳුකරයකින් ද මහා සාගරයෙන්ද වටවී පැවතීම සුවිශේෂී බවක් ගෙන දෙයි. සෞඛ්‍ය දේශගුණික තත්වයක් පැවැතීමද ඉතා වැදගත් වෙයි. මහවැලි, කැළණි, කළු, වලවේ යන ප්‍රධාන ගංගාවන් ගලාබසී. එම ගංගාවන් රට සරු සාර කරමින් පහළට ගලා යන්නේ ජාතික අවශ්‍යතාවයන් ඉටුකරවමිනි.

ඉතිහාසය දෙස බලන විට වසර දහස් ගණනක මානව සංස්කෘතියක්ද පැවැති බවට බලංගොඩ, පාහියන්ගල මානවයාගේ තොරතුරු වලින් මනාකොට හෙළි වේ. විජය රජුගෙන් ආරම්භ වූ රාජ්‍ය උදාව අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, යාපහු, කුරුණෑගල වශයේනද අවසානයේ සෙංකඩගල රාජ්‍ය වශයෙන් හෙළ රාජවංශය ව්‍යාප්ත වී ගිය බව ලංකා ඉතිහාස ( මහාවංශය-චූලවංශය) ග්‍රන්ථ වලින් පැහැදිලි වෙයි. එවකට රාජ්‍යකළ රජදරුවන් කෘෂිකර්මාන්තය සඳහා විශාල වැව් නිර්මාණය කරමින් රට සංවර්ධනයට යොමු කළහ. එද තිබූ ශ්‍රී විභූතිය විටින් විට මෙරටට එල්ල වූ සතුරු ආක්‍රමණ නිසා විනාශ විය. යළිත් එය උදාකර ගැනීම සඳහා රජදරුවන් ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළහ.

රජරට නමින් හැඳින්වෙන අනුරාධපුරයේ සිට මාගම්පුරය දක්වා ධාන්‍යගාර තිබූ බවට තොරතුරු හමු වී තිබේ. ජන සමාජයද ඉතා දියුණුව පැවති බවට සාධක හා ජනප්‍රවාද සමාජ ගත වී තිබීම තොරතුරු ලබා ගැනීමට ආධාරකයක් වී පවතී. සර්වාභරණයෙන් සැරසුණ සුරූපි කාන්තාවකට කිසිදු බාධාවකින් තොරව මහමග ගමන් කිරීමේ හැකියාව එදා පැවතුන බව ඉතිහාසය පෙන්වා දෙයි. වර්තමානය වනවිට ඒ තත්වය සමාජයෙන් ඈත් වී ඇති බව නොරහසකි. ආභරණ නොමැතිව වුවද කාන්තාවක් තනිගමන් යන්නේ කෙතරම් භීතියකින් ද? සොර, සතුරු, උවදුරු, දූෂණ දිනකට සිදුවන ප්‍රමාණය ජනමාධ්‍යයන්ගෙන් අවබෝධ කරගත හැකිය.

ධර්මය දේශනා කරන ප්‍රමාණයේ අඩුවක් ද නැත. ඒවාට සහභාගිවන පිරිසේ අඩුවක්ද නැත. වර්තමානයේ ධර්මය ඇසීමට පැමිණෙන පිරිස් දෙස බලනවිට වැඩිප්‍රමාණයක් වයස්ගත පිරිස් බව පෙනේ. තරුණ පිරිස් ඒවාට නැඹුරුවන ප්‍රමාණය අඩුබව කිවහැකිය. තරුණ ජීවිත රටක ජීවනාලිය ලෙස සැළකේ. එහෙත් යහපත් ක්‍රියාවන්හි (දැහැමි) යෙදෙන සංඛ්‍යාව අඩුවීම කණගාටුවට කරුණකි. රටක සංවර්ධනය අත්‍යවශ්‍ය දෙයකි. එහෙත් එම සංවර්ධනය ඇති වූ විටය. තරුණ ජීවිත විනාශ කරන මත්රකුසා විවිධාකාර මුහුණුවරින් තරුණ ජීවිත බිලිගනී. වර්තමානයේ ජනමාධ්‍ය තුළින් පෙනී යන්නේ එම තත්වය මර්දනය කිරීම සඳහා රජයේ වගකීම නිසිලෙස ඉටුකරන බවයි. අවනීතිය දුරලා නීතිය රජයන සමාජයක් ගොඩ නැගීමට පාලක පක්ෂය උත්සාහ දරණ බව පෙනෙන කරුණකි.

රටක දැහැමි බව ඇති කිරීම ට නීති රීති වලින් පමණක් කළ නොහැක. ඒවාට රටක වෙසෙන ජනතාව, ජාති, ආගම්, කුල, ගෝත්‍ර වශයෙන් දේශපාලන වශයෙන් භේද නොවී එකම පුරවැසියන්සේ සළකා නීතිය ක්‍රියා කිරීම ඉතා වැදගත් වනු ඇත. බලය, ධනය ගැන සිතමින් කටයුතු කිරීම නිසා රටත්, ජනතාවත් අන්ත අසරණ තත්වයට පත්වීම සිදුවන්නකි. දේශීය සංස්කෘතිය ආරක්ෂා කරමින් දේශීත්වයට ගරුකිරීම අප සැමගේම වගකීම විය යුතුය. ගතානුගතික බව රටක දියුණුවට බාධාවක් වනු ඇත. ස්වාධීනත්වයෙන් නැගීසිට ජාතිකාභිමානය මතුකර ගනිමින් තම තමන්ගේ කටයුතු ඉටුකරන්නේ නම්, අපට සුන්දර වූ රමණීය වූ ශ්‍රී ලංකාවක් බිහිකර ගැනීම අපහසු නොවනු ඇත. ශ්‍රී ලංකාවට එරෙහිව එන ෂතුරු බලවේගයන් යටපත් කොට ජයග්‍රහණය කළ හැකිවන්නේ සමගිය නැමැති දම්වැලක් බැඳී සිටීම මගිනි. එද සිරිලක පැවති ශ්‍රී විභූතිය යළි ඇති වේවා යන උදුර පැතුම සැම හදවත් තුළම ජනිතවනු දැක්ම අපගේ අපේක්ෂාවයි.

-විජය-

# දස රාජ ධර්ම

රජවරුන් විසින් අනුගමනය කළ යුතු මූල ධර්ම 10 ක් ලෙස දසරාජ ධර්ම නමින් බුදු සමයෙහි ඉගැන්වේ. පාලකයෙකු වෙත පැවතිය යුතු ගුණධර්ම ලෙසින් දැක්වෙන මෙම මූලධර්ම බෞද්ධ පාලකයෙකුගේ ගුණධර්ම ලෙස දක්වා ඇත. එනම්,

**දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාව** යන මේවා දස රාජ ධර්ම නමින් හැඳින්වේ.

මෙහි පළමුවෙන්ම සඳහන් වන්නේ දානයයි. මෙහි **දානය** යනුවෙන් අදහස් කරන්නේ කූට දන්ත සූතයේ සඳහන් පරිදි ස්වං පෝෂණය සඳහා රටවැසියාට මූලික ධනය පරිත්‍යාග කිරීමයි. ධනය නැතිකම හේතු කොටගෙන සොරකම් කරන පිරිස වැඩිවේ. චක්කවත්ති සීහ නාද සූත්‍රයේ පෙන්වා දෙන්නේ දුප්පතුන් කිහිපදෙනෙකුට ධනය දීමෙන් ප්‍රශ්න නොවිසදෙන බවයි. ඒ නිසා තම හැකියාව දියුණු කිරීම සඳහා පරිත්‍යාග දියුණු කළ යුතුය.

**සීලය** යනුවෙන් සඳහන් කරන්නේ රට වැසියා ප්‍රතිපත්ති ගරුක සංවරශීලි පුද්ගලයෙකු විය යුතුය යන්නයි. මෙයින් පැහැදිලි කරන්නේ රටක පාලකයා කිසියම් සදාචාරාත්මක ප්‍රතිපත්ති සමූහයක් මත පිහිටා කටයුතු කිරීම අවශ්‍ය බවයි.

**පරිත්‍යාගය** යන්නෙන් විස්තර කරන්නේ තුන්වැනි කරුණයි. මෙයින් කියවෙන්නේ පාලකයා රටවැසියාගේ මානව සුභ සාධනය වෙනුවෙන් තම ධනය කාලය, ශ්‍රමය යෙදවිය යුතු බවයි.

**ඍජු** ගතිය යන්නෙන් අදහස් කරන්නේ තම තීරණයන් මත ස්ථාවරව පිහිටා සිටීමට තමාට ආත්ම ශක්තියක් ඇතැයි යන්නයි.

දැහැමි රාජ්‍යයක් නිර්මාණය කිරීමේදී පාලකයා **මෘදු** ගතියෙන් යුක්ත විය යුතු බව දක්වා ඇත.

**තපස** යන්නෙන් අදහස් කරන්නේ පාලකයා හෙවත් රජු ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත විය යුතු බවයි. පාලකයා අධික ලෙස ඉඳුරන් පිනවීමට කාලය ගත කරන පුරුෂයකු නම් ඔහු ඔහුගේ අභ්‍යන්තර හා බාහිර වියවුල් වලට හේතුවේ.

**අවිහිංසාව** යනු රජු පරිපාලනය විෂයෙහි හිංසාකාරී මාධ්‍යයන්ට වහල් නොවිය යුතු බවයි. කූට දන්ත සූත්‍රයේ සඳහන් වන පරිදි රජු හිංසා කාරී පිළිවෙතකට නැඹුරු වුවහොත් ජනතාව ද රජුට එරෙහිව සන්නද්ධ වීමට ද ඉඩ තිබේ.

**ඛන්තිය** හෙවත් ඉවසීම රජුට තම පරිපාලනයේදී අවශ්‍ය අංගයකි. එසේ නොමැතිනම් ගන්නා ඉක්මන් තීරණ නිසා එම පාලකයා පමණක් නොව ජනතාව ද පීඩනයට පත්වේ

**අක්‍රෝධය** හෙවත් මෛත්‍රිය පාලකයෙකු තුළ තිබිය යුතු තවත් විශේෂ ලක්ෂණයකි. රට වැසියා සමග මිත්‍ර ශීලිව කටයුතු කරන්නේ නම් යහපත් පාලනයක් ඇති කිරීමට හැකියාව ඇත.

# සතර අගති

**01.** ඡන්දය
**02.** ද්වේශය
**03.** භය
**04.** මෝහය

යහපත් පාලකයෙකුට තම පාලන කටයුතු නිසි පරිදි කරීමටනම් අවශ්‍ය බුදු සමයේ ඉගැන්වෙන සතර අගතිය ද වැදගත් වේ.

**ඡන්දය** - යම් යම් දෑ පිළිබඳව පුද්ගල කැමැත්ත ඡන්දයයි. ස්වතන්ත්‍රව ගනු ලබන තීරණයකි. යම් යම් අවස්ථාවන්හි මෙය මෙලෙස කළ යුතුය. මෙම කරුණු මෙලෙස කළ යුතුය. ආදී වශයෙන් ගනු ලබන තීරණ ඡන්දය අනුව සිදුවේ. මෙබදු තීරණ ගැනීමේදී යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ වන පරිදි නිවැරදි තීරණ ගනී නම් එය අගතියක් නොවේ. නමුත් එය එසේ සිදු නොවේ. සිය රුචි අරුචි කම් පක්ෂපාතීත්වය ඥාතිමිත්‍ර සම්බන්ධතා ලාභ ප්‍රයෝජණ ආදිය බලපායි. පාලකයෙකු සතු විධායක බලය හා යුධ ශක්තිය වෙත මෙවන් බලපෑම් සිදු වීම බෙහෙවින්ම අනිටු ප්‍රථිඵල උදාකරයි.

**ද්වේශය** - සමගිය හා සාමයේ දෑත් සමාජය වෙත දිගු කිරීමට උගන්වන බුදු සමය ද්වේශයට පටහැනි දහමකි. ද්වේශයෙන් දූෂිත වූ මනෝ භාවයන් ඇති පාලකයෙකුට යුතුකම් සුදුසුකම් හා සාරධර්ම පිළිබඳ යතාවබෝධයක් නැත. නිරතුරුවම තරහින් පිපිරෙන හද ඇත්තෙකුට මධ්‍යස්ථව නිවැරදිව තීරණවලට එළඹිය නොහැකිය. ද්වේශ සහගත පාලකයා පිය පුතු සබඳතාවය අනුව සමාජය දෙස නොබලති.

**භය** - ශක්තිය හා බුද්ධිය හීන පාලකයන් බියෙන් සැකයෙන් පසුවේ. කවර මොහොකත කවර පැත්තකින් තමා වෙත විරෝධතා අභියෝග ඉදිරිපත් වේ දැයි ඔවුන් බියෙන් පසුවෙති. තමාට දෝෂාරෝපන එතැයි ද නිරතුරු බියෙන් පසුවේ.

**මෝහය** - මෝඩකම සියළු අකුසලයන්ට මුලවේ. පාලකයා බුද්ධිහීන අඥාණ මෝඩයෙකු නම් ඔහුට යහපත් පාලකයක් දියත් කළ නොහැකිය. මෝඩකම නිසා වැරදි නිගමන වලට එළඹේ.

කුමුදුලී

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

06 පිටුවෙන්...

# රෝග සමනය කිරීමට සමත් බුදුදහමේ බලය

අවස්ථා දකිය හැක. එහි මන්ත්‍ර යනුවෙන් දක්වෙන්නේ විශ්වයේ ඇති අධිභෞතික බලවේගයන්ට ආමන්ත්‍රණය කිරීම සඳහා පැරණි ගුප්ත විද්‍යාධරයින් විසින් නිපදවා ගන්නා ලද ගුප්ත විද්‍යාත්මක ගුරුකම්ය. මේ සඳහා ඔවුහු අක්ෂර වල හා වචන වල බලය යොදා ගත්හ. මන්ත්‍ර සෑදීමේදී ඒවායේ මුලට යොදාගන්නේ (ඕම් - ඕං) යන අක්ෂරයෙන් විෂ්ණු, ශිව, බ්‍රහ්ම යන දෙවිවරු ගම්‍ය වන බවත් මෙම ත්‍රි මූර්තියට වැඳ නමස්කාර කොට එකී බලය උපයෝගී කරගෙන අධිභෙ?තික බලවේගයන්ට ආමන්ත්‍රණය කොට එමගින් තම අපේක්ෂාවන් ඉටුකරගත හැකිබව හින්දු භක්තිකයෝ තරයේ විශ්වාස කරති.

මේ අනුව ඉහතින් දක්වූ ආකාරයට දේව සංකල්පය ඔස්සේ ආරම්භ වූ යන්ත්‍ර මන්ත්‍ර විධි මුල් වකවානුවේදී ශාන්තිකර්ම වලට යොදාගත් අතර පශ්චාත් කාලීන වශයෙන් බෞද්ධ සංකල්ප මත හැඩ ගැසී එන්නට විය. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ ඇතුළු ත්‍රිවිධ රත්නයේ ආනුභාව බලය යොදා ගන්නා ලදී. වෙනත් ලෙසකින් දක්වතොත් පිරිත් ශාන්ති කර්මය යොදා ගන්නා ලද බව පෙනී යයි. විශේෂයෙන් රතන සූත්‍රය හා ආටානාටිය සූත්‍රය ආදී සූත්‍ර සජ්ඣායනා කිරිමෙන් ලෙඩරෝග ව්‍යුපසමනය වී ශාන්තිය උදාවන බැවි බුදුදහමෙහි කියැවෙන හෙයින් බෞද්ධ මන්ත්‍රකරුවන් යන්ත්‍ර මන්ත්‍ර සකස් කිරීමේදී පිරිත් සංකල්පය මැනවින් භාවිතා කොට ඇත. රතන සූත්‍රයේ එන යානීධ භූතානි (යම් අමනුෂ්‍ය කෙනෙක් ඇත්ද) යං කිඤ්චි වින්තං (යම් ධනයක් වේද) බයං විරාගං (කෙලෙසුන් දුරු කරන හෙයින්) ආදී එක් එක් බුද්ධ භාෂිත ගාථාවක් ගෙන ඒ ඒ ගාථාවලින් කළහැකි ප්‍රත්‍යක්ෂ ගුරුකම් පිළිබඳව පැරණි පුස්කොළ පොත්වල සඳහන් වේ. පිරිත බුද්ධ මන්ත්‍ර විශේෂයක් බව චතුභානවාරපාලි අට්ඨකතාවේ සඳහන් වේ. පිරිත් ආශ්‍රය කොට සැකසුණු මන්ත්‍රවල ස්වභාවය වටහාගැනීමට සුදුසුතම නිදසුනක් වන්නේ ජින පඤ්ජර නම් වන පිරිත් ඇසුරෙන් රචනාකොට ඇති අටවිසි බුද්ධ රාජ මන්ත්‍රයයි.

ජිනපඤ්ජර පිරිත ඇසුරින් පමණක් නොව රතනසූත්‍රය ආටානාටිය සූත්‍රය, බන්ධ, මෝර, ධජග්ග ආදී පිරිත් සූත්‍ර ඇසුරින්ද රචනා කරන ලද මන්ත්‍ර රාශියක් පැරණි සිංහල මන්ත්‍ර පොත්වල මෙන්ම ඇඳුරන්ගේ වාචික සම්ප්‍රධායෙහිද දක්නට ලැබේ. හදිහූනියම් දුරු කිරම (කැපීම) සඳහා භාවිතා කරන ජල නන්දන පිරිත ගැන මහායාන දිව්‍යාවදාන නම් ග්‍රන්ථයේ ප්‍රවෘත්තියක් සඳහන් වේ. එහි එක් දිනක් බුද්ධ ශ්‍රාවක ආනන්ද තෙරුන් දුටු සැඩොල් කුලයේ මවක් තම දියණියට සුදුසු සැමියෙකු යයි සිතා ඇය කෙරෙහි තෙරුවන්ගේ සිත් බදිනු පිණිස බලගතු වශී ගුරුකමක් කළාය. අර්හත් තත්වයට පත්වී නොසිටි ආනන්ද හිමි එම ගුරුකමට හසුවන බව දැනගත් බුදුරජාණන් වහන්සේ ජල නන්දන පිරිත වදාරා ඒ වශී ගුරුකම කපා හැරි බව සඳහන් වේ. රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට ලිපියක් සපයන මුදලිඳු ගුණරත්න මහතා මන්ත්‍ර සිංහල, සංස්කෘත, දෙමළ, අරාබි, පර්සියන්, තෙළිඟු, මලයාලම් යන භාෂා වලින් ලියා ඇතිබව දක්වයි.

මේ ආකාරයට ඉහත සඳහන් කළ කරුණු තුලනාත්මක විග්‍රහයකට ලක්කිරිමේදී බුදුදහම, බෞද්ධ දර්ශනය, තුණුරුවන් පිළිබඳව අචල විශ්වාසයකින් හා ශ්‍රද්ධා භක්තියක් තමන් තුළ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඇත්නම් දෙවි දේවතාවුන් යක්ෂ ප්‍රේතාදීන්ගෙන් හා නවග්‍රහ මණ්ඩලයෙන් ද වන අපල උපද්‍රව ගැන දැඩි විශ්වාසයක් ඇති කරගැනිම යුක්ති යුක්ත නොවේ. බුද්ධ දේශනා වලට අනුව අප විසින් කරනු කියනු ලබන කුසල් දහම් නිසියාකාරව සත්‍ය ලෙසම කරමින් එම දෙවි දේවතාවුන්ට හා ප්‍රේත කුම්භාණ්ඩ ආදීන්ට පිං අනුමෝදන් කරන විට එම අයගෙන් සිදුවන අපල උපද්‍රව පහව ගොස් ශාන්තිය ලඟාකර ගැනීමට හැකිවන බව නොඅනුමානය.

ii පිටුවෙන්....

**කොතෙක් ගුණ කළත් දුදනන් හට** **අසුබ**
**අතක් පමණවත් නොම කෙරෙති** **පිළිලබ**
**එ උක් රසෙහි දැමුවන් නිඹ බිජු** **කිරබ**
**උදක් නිත්තමය පසමග තුරෙහි** **නිබ**

මෙහි දක්වා ඇති පරිදි අයහපත් වූ අසත්පුරුෂයන් හට කොතරම් යහපතක් කළත් (ඔවුහු) අක් ගෙඩියක් පමණවත් ආපසු දීමක් නොකරති. උක් පැණිවලට බහා කිරි හා ජලය වත් කොට කොහොඹ ඇටයක් පැල කළත් කොහොඹ ගසෙහි පංචාගයම තනිකර තිත්ත වන්නා සේය. යනුවෙන් එතුමා අසත්පුරුෂයාට කෙතරම් ගුණ කළත් ඔහුගේ අයහපතක් බව කිසිම දිනක අත් නොහරී. එසේම මෙයම පැහැදිලි කරන **"ප්‍රත්‍ය ශනකය"** එය දක්වා තිබෙන අන්දමද මා මනසට නැගෙයි.

**ශුද්ධ පර්වත ම ධ්‍යෙතු - නිම්බ බීජං**
**ප්‍රතිෂ්ඨිතං**
**ඝෂීර ධාරා සහස්සානී - නිබ්බ කඃ මධුරායනේ**

**(ප්‍රත්‍යධ ශනකය)**

මෙහි සඳහන් වන්නේද උක් සකුරු පර්වතයක් කොට ඒ මැද කොහොඹ ඇටයක් සිටුවා එයට කිරි කළ ගෙඩි දහසක් දමා සැදුවත් එම කොහොඹ තිත්තම බවයි. අපි මෙය සමාජය දෙසට සමාජය දෙසට යොමු කළොත් සත්පුරුෂ මිනිසුන් අතර කොතරම් ජීවත් වුනත් අඥාණ මිනිසුන් ගුණ බිඳක්වත් හඳුනා නොගනී.

ලෝකය විවිධාකාරය. විවිධාකාර වූ මිනිසුන් වෙසෙති. එබදු මිනිසුන් වෙසෙන ලෝකයේ සත්පුරුෂයා හා අසත්පුරුෂයා හඳුනාගැනීමද ඉතා දුර්ලභය. ඒ බව,

**වනාන්තේ බහු වෘක්ෂානී**
**පුෂ්ප චන්දන දුරුලභඃ**
**බහු ලෝකේ මනුෂ්‍යස්‍යය**
**සත් පුරුෂා අති දුර්ලභඃ**

යනුවෙන් ප්‍රත්‍ය ශකය දක්වා ඇත. එහි සඳහන් අන්දමට සෑම වනාන්තරයකම බොහෝ ගස් තිබේ. නමුත් සඳුන් සෑම වනාන්තරයකම නැත. එමෙන්ම ලෝකයේ බොහෝ මිනිසුන් සිටියත් සත්පුරුෂයන් ඔවුන් අතර ඉතා දුර්ලභය. යනුවෙනි.

ඉතින් මේ උදාවූ අලුත් වර්ෂය ඉදිරියට සාර්ථක වසරක්, සාර්ථක ජීවිතයක් ගත කරන්නට නම් අපි අනුන්හටත් තමන්ටත් යහපතක් වන ලෙස ජීවත් විය යුතුය. ඇසුරු කරන පුද්ගලයන් හොඳින් සොයා බලා ඇසුරට ගත යුතුයි. සත්පුරුෂ ඇසුරට ගත් විට දිවියම ඉතා වටී. ලැබූ අලුත් වසරේ අපිද සත්පුරුෂ ගති ගුණ වලින් හා මිත්‍රත්වයෙන් යුතු පුද්ගලයෙක් වන්නට අදිටන් කරගෙන දිවියම සරු බවට පත්කර ගනිමු.

12 පිටුවෙන්...

විවිධ යුගවල කාලපරාසන් තුළ නිමවන ලද සඳකඩ පහණ්වල, කැටයම් වල ස්වරූපයෙන් මදින් මද වෙනස්කම් දක්නට පුළුවන. මුල් කාලීන සඳකඩ පහණ් වල කැටයම් හීන වූ අතර ක්‍රම ක්‍රමයෙන් කැටයම් වලින් පිරුණු සඳකඩ පහණ මහනුවර වැනි පසු කාලීන යුගවලදී අඩ සඳක ස්වරූපයෙන්ද වෙනස් වී ත්‍රිකෝණාකාර ස්වරූපයකට පත්ව ඇත.

ගම්පල යුගය තුළදී මොණර මකර වැනි සත්ව රූපද සඳකඩ පහණ තුළ දකිය හැකිය. එමෙන්ම කෑගල්ල බෙලිගල හා නාරම්මල පැන්තැතිගොඩ රජමහා වෙහෙර ස්ථානවල ඇති සඳකඩ පහණ වල සත්ව රූපාවලියේ සතුන් දෙපසින් පැමිණ මධ්‍යයේදී මුණ ගැසෙන ආකාරයෙන් නිමවා ඇත. සඳකඩ පහණ්වල මානව රූපයද ඉතාම අල්ප වශයෙන් දක්නට ලැබේ. ලාහුගල සඳකඩ පහණේ ඇත් ගොව්වකුගේ රූපයක් කැටයම් කර ඇත.

නූතනය වන විට සඳකඩ පහණ පිළිබඳව බෞද්ධ ජනතාවගේ අවධානය ගිලිහී ඇති අතර තරඟ විභාග වැනි අධ්‍යයන කටයුතු සඳහා පමණක් මේ පිළිබඳ සොයා බලන තත්වයක් උදා වී ඇත. තවද මෙවැනි අග්‍රගණ්‍ය කලා නිර්මාණයන් නිර්මාණය වීමක්ද වර්තමානයේ දක්නට නොලැබේ.

07 පිටුවෙන්...


කරගත යුතුව ඇත. යම් දරුවෙකු විභාගයකින් අසමත් වූ විට කළ යුත්තේ එම දරුවා දිරිගැන්වීමය. පරාජය ජයග්‍රහණයේ මාවත කරගත හැකිය. ඒ සඳහා අවශ්‍ය වන්නේ බුදුසිරිත ආදශීයට ගෙන ක්‍රියා කිරීම පමණි.

05 පිටුවෙන්...

අධිපතියා වන බැවින් ''ක්ෂත්‍රිය'' නම් විය. ධර්මයෙන් අනුන් පැහැපත් කරන බබලවන බැවින් ''රජ'' යයි ද නම් කොට ඇත. ඒ ජනයා අතර පාප ධර්මයන් බැහැර කරන්නට වෙහෙස වූ ගුණවත් පිරිසක් ද වූ අතර ඔවුහු ''බ්‍රාහ්මණ'' නම් වූහ.. තවද අඹු දරුවන් රකිමින් නා නා විධ කර්මාන්තයන්හි හා වෘත්තීන්හි නිරත වෙමින් සිටියවුන් වෛශ්‍යයෝ ලෙස ද, රෞද්‍ර, දරුණු හැසිරීම් ඇත්තවුන් ශුද්‍රයෝ ලෙස ද ව්‍යවහාර වූහ. බුදුරජාණන් වහන්සේගේ එකී දේශනයට අනුව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය සහ ශුද්‍රයන් ඇතිව ඇත්තේ ඒ අයුරටය. එසේ ඇරඹි සමාජය ක්‍රමික වර්ධනයත් සමගින් නූතන තත්වයට පත්ව ඇති බව මෙහිලා සඳහන් කළ යුත්තේමය. අනාගතයේදී නැවතත් ලොව විනාශ වනු නියති. බුදුරජාණන් වහන්සේගේ අග්ගඤ්ඤ සූත්‍ර දෙසුමට අනුව විචාර පූර්වකව සිතන කල්හි සුපැහැදිලි වන්නා වූ කරුණක් වනුයේ කුමන විචාරකයින්, කුමන විද්‍යාඥයින් හෝ කුමන දාර්ශනිකයින් නා නා විධ මති මතාන්තර ජීවයේ සම්භවය පිළිබඳ දැක්වුව ද බුදු දහමින් වහරණ ලද උක්ත කරුණු අභිබවා යාමට කිසිවකුට හෝ මෙතෙක් නොහැකි වී ඇති බව ප්‍රත්‍යක්ෂ ය. මෙකී කරුණු කාරණා වලින් පෙනෙනුයේ ජීවයේ සම්භවය පිළිබඳ බෞද්ධ මතය වනාහි නිර්මාණවාදී මතයක් නොවන බවය. අපේ පැතුම වනුයේ බුදු දහමේ අනුහසින් හෝ ලෝ දනන්ගේ ප්‍රඥාව දියුණු වනු දැකීමය.

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 ජනවාරි - 2564 දුරුතු කලාපය

# හරි හම්බ කරපු දේවල් දුක් මහන්සියෙන් දනට පිනට දෙන්නේ අපි හිතේ මනාපෙන්



තමා සතු දෙයක් වෙනත් අයෙකුට සතුටු සිතින් කරුණා මෛත්‍රි සහගතව පරිත්‍යාග කිරීම දානයකි. දානය වනාහි බුද්ධ දේශනාවෙහි ප්‍රමුඛ ස්ථානයක් ගන්නා පුණ්‍ය ක්‍රියාවකි.

දාන, ශීල, භාවනා යන තුන් පුණ්‍යක්‍රියාවන්ගෙන් දානය මුල්තැන ගනී. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහා වස්තුවෙහිද දානය මුලට ඇත. දාන, ශීල, පරිත්‍යාගය යන සතර ධර්මයන් ගේද මුලට දානය යෙදී ඇත. දාන, ශීල, නෙක්ඛම්ම, ආදී දස පාරමිතාවන්ගේ මුල්ම පාරමිතාව දාන පාරමිතාවයි. දස පුණ්‍යක්‍රියාවන්ගේ පළමු වැන්නද දානයයි.

මේ අනුව බුදු දහම තුළ දාන කුසල ක්‍රියාවකට සුවිශේෂ ස්ථානයක් ලැබී ඇති බව ඔබට පෙනී යනු ඇත.

අංගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයෙහි කාල දාන පහක්ගැන සඳහන් වේ.

1. ආගන්තුකයන්ට දෙන දානය (ආගනතු ග සස දානංදෙති)
2. මගීන්ට දෙන දානය. (ගම් ක සස දානං දෙති)
3. ගිලනුන්ට දෙන දානය (ගිලාන සස දානං දෙති)
4. දුර්භික්ෂ කාලයෙහි දෙන දානය (දුබ්භිකෙඛ දානං දෙති)
5. අග්‍රශෂ්‍ය දානය (යානි යානි නවස සසති නවඵලානි නාති පඨමං සීලව නෙතසු පතිමඨාං පති)

01. ආගන්තුක දානය

ආගන්තුකයෝ නම් වෙනත් ගමකින් හෝ නගරයකින් හෝ පිටරටකින් තමා වෙත එන පුද්ගල යෝය. තමා සමඟ කිසියම් සම්බන්ධතාවයක් ඇතිව අවශ්‍යතාවයකට හෝ එසේ නැතිව සා පිපාසාවෙන් පෙළෙන අය විය හැකිය.

එසේනම් එවැනි අය පැමිණි විට සාදරයෙන් පිළිගෙන අවශ්‍ය දේ දීම ආගන්තුක දානයක් ලෙස පිළිගත හැක. ඇතැම් විට වචනයෙන් ඉල්ලා නොසිටියත් ඔහුගේ හැසිරීම් රටාව අනුව අවශ්‍යතාවය නුවණින් සලකා බලා අවශ්‍ය දෙය දීම සත්පුරුෂ ලක්ෂණයකි.

සද්ධර්මාලංකාරයෙහි " කාක වස්තුවෙහි" ආගන්තුක දානයට ඉතා කදිම නිදසුනක් ඇත.

දිනක් රෝහණ නම් ජනපදයෙහි මාතුල නම් විහාරයෙවහි භික්ෂූන් වහන්සේලා දානය වළඳ අවසන් වී භෝජන ශාලාවෙහි වතාවත් කරමින් සිටියදී ඉතාමත් බඩගින්නෙන් පෙළුණු කපුටෙක් විහාර සමීපයේම ගසක සිට දුකින් හැඩීය. ඒ විහාරයේ ප්‍රධාන තෙරුන් වහන්සේ කපුටාගේ විලාප හඬ අසා බඩගින්නේ පෙළෙන බව නුවණින් අවබෝධ කොට ගෙන සාමණේර හිමිනමක් ගෙන්වා රෙදි කඩකින් පහන් වැටි අඹරා ගිතෙලින් තෙමා මදක් රත්කොට කපුටාට දෙන ලදි. ඒ පහන් වැටි අනුභව කොට කපුටා කුසගිනි නිවාගන්නා ලදි.

2. මගීන්ට දෙන දානය

දුර බැහැර ගමන් යාමට අද මෙන් යාන වාහන පහසුකම් අතීතයේදී නොතිබිණ. එසේ හෙයින් ගමන් කිරීමෙන් වෙහෙසට පත්වූ මගීන්ට දෙන දානය මහත් ඵල ගෙදේ.

රුහුණේ ත්ස්සමහා විහාරයේ සිට අනුරාධපුර මමහා විහාරයට සාමාන්‍ය පුද්ගලයෙකුට යාම සඳහා දින ගණනාවක්ම පයින් යා යුතුව ඇත. මෙබඳු වූ දීර්ඝ ගමන් වලදී දින ගණනකට අවශ්‍ය ආහාර පාන රැගෙන යා නොහැකිය. අද මෙන් මාර්ගය දෙපස ආපනශාලා එකළ නොවීය. එවන් මඟියෙකුට අනික් කෙනෙකුගෙන් ලැබෙන ආහාරයක් මිස වෙනත් පිළිසරණක් නොවීය.

මෙයට නිදසුන් කතාවක් සද්ධර්මාලංකාරයෙහි සාලිරාජ වර්ගයෙහි නකුල වස්තුව දැක්විය හැක.

රුහුණු ජනපදයෙහි එක ගමක නකුල නම් දුගී පුරුෂයෙක් වාසය කළේය. ඔහුගේ දියණියක් කහවනු දොළසකට ණය ගැතිව මාගම එක් කුල ගෙයක බැල මෙහෙවර කරමින් සිටී. නකුල උපාසක තෙමේ තම දියණිය නිදහස් කරගැනීමට තිබූ කහවනු දොළොස දී වෙනත් අයෙකුගෙන් බත් මුලක් මිලට ගෙන උන්වහන්සේට පූජා කළේය. තෙරුන් වහන්සේ එම සිද්ධිය මෙනෙහි කරමින් භාවනා කොට රහත්වීමෙන් අනතුරුව දානය වැළඳූ සේක.

3. ගිලනුන්ට දෙන දානය

විවිධ වූ රෝගාබාද වලින් පෙළෙන ලෙඩුන් වෙනුවෙන් දෙන ආහාර පාන ගිලන් අයට දෙන දානයක් වෙයි. යම් පුද්ගලයෙකු ගිලන් වූ පසු ඔහුට අවශ්‍ය වන ආහාර පාන බෙහෙත් ඖෂධ ලබා ගැනීම දුෂ්කර විය හැකිය. එබඳු වූ අසරණ වූ අනාථවූ අය වෙනුවෙන් අවශ්‍යවන යම් දෙයක් අපට උපයා සපයා දිය හැකි නම් එය මහඟු පුණ්‍ය කර්මයකි.

සමහර අවස්ථාවලදී රෝගය උත්සන්න වූ අවස්ථාවක අවශ්‍ය වූ බෙහෙත් නොලැබීම නිසා ඔවුන් මරණයටද පත්විය හැක. එබැවින් එවැනි කෙනෙකුගේ ජීවිතය රැක දීමට අප කරන්නාවූ උපකාරය කොතරම් උතුම්ද, බලසම්පන්නද ගිලනුන්ට දෙන දානයේ උතුම්බව ප්‍රකාශවන කථාවක්" සද්ධර්මාලංකාරයෙහි චූල ගල්ල වර්ගයෙහි චූල ගල්ල කතාවෙහි (සුළු ගල) මෙසේ දැක්වෙයි.

ලක්දිව වයඹ දිසාවෙහි දැදුරු ඔය අසබඩ චූල ගල්ලනම් ගමෙහි මහත් ශ්‍රද්ධා සම්පන්න සුළුගල් නම් උපාසක කෙනෙක් විසූහ. හෙතෙම බොහෝ ධනය වියදම් කොට දාන ශාලාවක් කරවා නිරන්තරයෙන්ම භික්ෂූන් වහන්සේලාට දන් පූජාකර වතාවත් කරමින් සිටින සමයේ "මලියදේව" නම් මහරහතන් වහව්සේට දරුණු බඩේ අමාරුවක් ඇති විය. ඒ රෝගය සංසිදවීමට නම් ඖෂධ වර්ග එකොළහක් දමා සකස්කරන ලද කැඳක් වැළඳුවහොත් පමණි. සුළුගල උපාසක තෙමේට මේ බව දැන්වුවහොත් මේ බෙහෙත් කැඳ නොවරදවාම ලැබෙන බව සැළකූ තෙරුන් වහන්සේ පිඬුසිඟා ගොස් ඒ දාන ශාලාවට වැඩි සේක. උපාසක තෙමේ තෙරුන්වහන්සේගේ ආකාරය දැන "ස්වාමීණි, ඔබ වහන්සේට යම් ආබාධයක් ඇත්ද?"යි විමසීය. උන්වහන්සේ රෝගය සහා පිළියම පිළිබඳව උපාසක තෙමේට දැන්වූ සේක. "මඳක් වැඩසිටිය මැනව"යි පවසා ගෙට ගොස් බෙහෙත් කැඳ පිළියෙල කොටගෙන අවුත් උන්වහන්සේට පිළිගැන්වීය.

තෙරුන් වහන්සේ භෝජන ශාලාවෙහි වැඩහිඳ බෙහෙත් කැඳ වළඳ රෝගය සන්සිඳුවා ගත් සේක. පසුව තමන් වසන වේගිරිය විහාරයටම වැඩිසේක.

4. දුර්භීක්ෂ කාල දානය

වර්ෂාව නැති වීමෙන් මිනිසුන්ට ගොවිතැන් කළ නොහැකි වෙයි. ඒ කාලයට ආහාරයට අවශ්‍ය බත සපයන කුඹුරු සහ ගොඩ-මඩ ගොවිතැන් සියල්ල විනාශවී පාලු වී යයි. ලංකාවේද එබඳු දුර්භීක්ෂ කාල කීපයක්ම ඉතිහාසයෙහි සඳහන්ව ඇත.

බැමිණියා සාය, එක් නැළි සාය, කරකොළ සාය ඒ සමහරකි. මෙවන් කාල වලදී මිනිසුන් මෙන්ම ෂතුන්ද නිරහාරව මිය යති. මෙබඳු අවස්ථාවලදී සාගින්නෙන් පෙළෙන්නන්ට දෙන දානය දුර්භීක්ෂ කාල දානය නම් වේ.

අනුරාධපුරයට දකුණු දිග "බ්‍රාහ්මණ චෝල" කුඹුරු කොටා උඳු වැපුරුවාහුය. උඳු පැසීගන එන අවස්ථාව වන විට මහා තද නියගයක් ඇති විය. මෙහිදී පිපාසය සංසිඳවා ගැනීමට මිනිසුන්ට හෝ සතුන්ට ජලය පොදක්වත් ලබාගත හැකි වෙතැයි සිතා ඒ කුඹුර දෙසට වැඩිසේක. එකල්හි එක් බාල ගම් දැරියක් පැන් සොයා වඩින භික්ෂූන් වහන්සේ පිපාසිතව වෙහෙස කරව ක්ලාන්ත බවින් යුක්තවූ ස්වරූපය දැක කිසිවෙකුටත් නොදන්වා සඟවා තිබූ වතුර කළය රැගෙන විත් උන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූවාය. භික්ෂූන් වහන්සේද ජල පාත්‍රය රැගෙන වැඩිය සේක.

ඉන් පසුව පිපාසිතව සිටි මිනිසුන් වතුර බීමට පැමිණ සඟවා තිබූ කළයෙහි දිය නැතිබව දැන මෙයින් දිය ගත්තේ කවුරුන්දැයි ඝෝෂා කරන්නට විය. එවිට ජලය පූජා කළ දැරිය "පැන් පිපාසාවෙන් වැඩියාවූ ස්වාමින් වහන්සේ නමකට පැන් පූජා කළෙමි" යයි කීවාය.

"එම්බල දැරිය පිපාසයට බොන්නට ගෙනවිත් සඟවා තිබූ වතුර කළය කොහෙදෝ යන භික්ෂුවකට පූජාකරල අපි මහත් පීඩාවකට පත්විමු. කොතනින් හෝ අපට පැන් ගෙනව" තර්ජනය කළාහුය. අසරණ බවට පත් වූ දැරිය බලවත් සිත් තැවුලෙන් යුතුව කළයත් රැගෙන මහ මඟට බැස යන විට ඈතින් මහත් ජල කඳක් මහාපොළවෙන් උඩට නැගී දිය බුබුලක් ලෙෂ දැක ඒ වෙතට ගොස් සිත්සේ පැන් බී සැනසී දිය දිය කළයක්ද රැගෙන විත් කුඹුරේ සිටි මිනිසුන්ට දුන්නාය. දැරියගේ පිනෙන් පහළ වූ මේ දිය බුබුල දුටු මිනිසුන් එහි ගොස් දිය බී නා පිරිසිදුව ෂතුටට පත් වූහ. මාතලේ ප්‍රදේශයේ අදත් මේ දිය බුබුල කවර නියං කාලයකදී වුවද ිනොසිදී මිනිසුන්ට ගොවිතැනට ජලය ලබාදෙන බව ගම්මු විසින් සඳහන් කරයි. මෙම කථා පුවත සද්ධර්මලංකාරයෙහි අභය ථෙර වර්ගයෙහි ගාම දාරිකා වස්තුවෙහි සඳහන් වන්නකි.

5. අග්‍රෂ්‍ය දානය

තමා විසින් වගාකරන ලද කෙතක හෝ වවන ලද ගසක මුලින්ම ලබන අස්වැන්නෙන් පිළියෙළ කළ ආහාරය හෝ ගසක හටගත් ඵලාපලයක් සීලාදි ගුණයන්ගෙන් පිරිපුන් වූ උතුම් පුද්ගලයෙකුට දන්දීම මෙනමින් හඳුන්වනු ලබයි.

අස්වැන්න වශයෙන් ගෙට ගෙනා වී වලින් මුලින්ම දානයක් පිළියෙල කොට පූජා කිරීම බෞද්ධ පින්වතුන්ගේ ස්වාභාවික පුරුද්දකි. බුදුරජාණන් වහන්සේ උදෙසාද අග්‍රෂ්‍ය දානය පිණිස බුද්ධ පූජා සහ භික්ෂූන් වහන්සේලාට අලුත් බත් දානය පූජා කරති. අනෙකුත් දාන වලට වඩා මෙහි විශේෂයක් වන්නේ අග්‍රශෂ්‍ය දානය දෙන්නේ හැම අතකින්ම තමන් උසස්කොට ෂලකන සිල්වත්, ගුණවත් කෙනෙකුට වීමය.

දඹදිව ගෞතම බුද්ධෝත්පාදයට පෙර එක්තරා වැදි පුරුෂයෙක් සිය අඹුව සමඟ තම ගෙය වටා අල, කෙසෙල්, පොල්, පුවක්, අඹ, කොස් ආදී වෘක්ෂයන් වවමින් ජීවත් විය. කලක් ගිය පසු එක් කොස් ගසක මහත්වූ විශාල වැල ගෙඩියක් ඉදුණු කල්හි වැදි පුත්‍රයා වැල ගෙඩිය ගසින් බාගෙන ගෙට එන විට එයින් පැණි බේරෙන්නට පටන්ගත්තේය. එකළ වැදි පුත්‍රයානන් මේ අග්‍ර වූ ඵලය අනිකෙකුට සුදුසු නොවෙයි. විකිණීමටද සුදුසු නොවෙයි. මෙය මාගේ පසේ බුදුන්ටම පූජා කරමි යි සිතා පසේ බුදු කෙනෙකුටම පූජා කරන ලදි. ඔහු ඒ කළ පිනෙහි විපාක වශයෙන් මියගිය පසු කාමාවචර දෙව්ලොව ඉපිද බොහෝ දිව්‍ය සම්පත් ලැබූ බව එහි සඳහන් වෙයි.

ලලිතා හෙට්ටිආරච්චි දේවහුව